
# ශ්‍රී ලංකාවේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් (එල් ජී බී ටී) කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකය




EQUAL GROUND

විසින් මෙහෙයවන ලද නියමු ව්‍යාපෘතියකි

**චාර්ල්ස් නයිජල් ද සිල්වා ට පුදන ලදී.**

**1970 – 2010**

# පිදුම

*තවදුරටත් අප අතර නොමැති මුත්, තම දූරදර්ශීභාවය සහ කැපවීම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදුන් අපගේ සගයා වන චාර්ල්ස් නයිජල් ද සිල්වා වෙත.*

මීට සහාය දුන් පුද්ගලයින් සහ සංවිධාන සියල්ලට ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය ස්තුතිවන්ත වන අතර, ඔවුන්ගේ කැපවීම නොමැතිව මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගත නොහැකි වනු ඇත.

මෙම අධ්‍යයනය සමග සම්බන්ධ වූ සියලුම දෙනාට තුති. ඔබ විසින් සම්මුඛ සාකච්ඡාවලදී ලබාදුන් තොරතුරු නොමැතිව මෙය සාර්ථක කරගැනීමට නොහැකි වනු ඇත. මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා අඛණ්ඩ සහාය ලබාදුන් ඇමෙරිකානු යුදෙව් ලෝක සේවය ට (AJWS) සහ ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා කාර්යාංශය ට (SIDA) විශේෂ ස්තුතිය පුදකරමු.

අපගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමෙන් සහාය දැක්වූ නිලධාරීන්ට මෙන්ම, මූලිකව මීට සම්බන්ධ වූ ග්‍රාස්රූටඩ් ට්‍රස්ට් ආයතනයට ද අපගේ අවංක ස්තුතිය පළකරමු. අවසන් වශයෙන්, මෙම ව්‍යාපෘතියට සංඛ්‍යානමය දැනුම ලබාදුන් කිමෝන් බ්‍රවුන් ට සහ තාක්ෂණය සඳහා වන කේප් පෙනින්සුලා විශ්වවිද්‍යාලයට ද අපි ස්තුතිවන්ත වෙමු.

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ඒඩ්ස් | නතුකරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණය |
| එච් අයි වී | මානව ප්‍රතිශක්ති ඌනතා වයිරසය |
| එල් ජී බී ටී | සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයන් , සංක්‍රාන්ති සමාජභාවීය සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් |
| පී එල් එච් අයි වී | මානව ප්‍රතිශක්ති ඌනතා වයිරසය සමග ජීවත්වන පුද්ගලයින් |
| එස් ඕ / ජී අයි | ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය |
| එස් ටී අයි | ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන |
| යූ එන් | එක්සත් ජාතීන්ගේ සංවිධානය |

# පද අර්ථ දැක්වීම

| | |
|---|---|
| **ද්විරිසි:** | **කායිකව, මානසිකව සහ/ හෝ ආධ්‍යාත්මිකව ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයටම ආකර්ෂණය වන පුද්ගලයින්** |
| **හෙළිනොකළ අනන්‍යතා සහිත:** | **පුද්ගලයකුගේ ලිංගික දිශානතිය සහ / හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය රහසිගතව තබාගැනීම** |
| **පිටතට පැමිණීම:** | **පුද්ගලයකුගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හෙළි කිරීම** |
| **සමරිසි පුරුෂ:** | **කායිකව, මානසිකව සහ/ හෝ ආධ්‍යාත්මිකව පුරුෂයින් කෙරෙහි ආකර්ෂණය වන පුරුෂයින්** |
| **විෂමරිසි:** | **කායිකව, මානසිකව සහ/ හෝ ආධ්‍යාත්මිකව විරුද්ධ ලිංගික පුද්ගලයින්ට ආකර්ෂණය වන පුද්ගලයින්** |
| **සමරිසි භීතිකාව:** | **සමරිසිභාවය හෝ සමරිසි පුද්ගලයින් කෙරෙහි ඇති අහේතුක බිය හෝ අකමැත්ත හෝ ඔවුන්ව වෙනස්කොට සැලකීම** |
| **සමරිසි ස්ත්‍රී:** | **කායිකව, මානසිකව සහ/ හෝ ආධ්‍යාත්මිකව ස්ත්‍රීන් වෙත ආකර්ෂණය වන ස්ත්‍රීන්** |
| **එල් ජී බී ටී ප්‍රජාව:** | **සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය හෝ සංක්‍රාන්ති ලිංගික ලෙස තමන්ව හඳුන්වාගන්නා සියලුම පුද්ගලයින් හැඳින්වීමට යොදාගන්නා පොදු යෙදුමකි** |
| **සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්:** | **තමන් උපතතේදී ලැබූ ලිංගිකත්වයට අනුරූප නොවන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයකට තමන් අයත් යැයි හඳුනාගැනීම හෝ එවැනි අනන්‍යතාවයක් ප්‍රකාශනය කිරීම** |
| **සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව:** | **සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් හෝ සංක්‍රාන්ති ලිංගිකත්වය හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් කෙරෙහි ඇති අහේතුක බිය හෝ අකමැත්ත හෝ ඔවුන්ව වෙනස්කොට සැලකීම.** |
| **සංක්‍රාන්ති ලිංගික:** | **තමන්ට උපතින් හිමි ලිංගිකත්වයට විරුද්ධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයකට තමන් අයත්යැයි මානසිකව හඳුනාගන්නා සහ තමන් රිසි එම අනන්‍යතාවයට අදාළ ස්වරූපය ලබාගැනීමේ අරමුණින් සැත්කම් සහ හෝමෝන ප්‍රතිකාර හරහා තමන් කැමති ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට අයත් පුද්ගලයකු ලෙස ජීවත් වන පුද්ගලයින්.** |

***ප්‍රකාශනය: ඉහත සඳහන් අර්ථ දැක්වීම වෙනත් මුලාශ්‍ර වලින් ලබාගත් ඒවායි. එම මුලාශ්‍ර, යොමුව සහ ලේඛන නාමාවලිය යන කොටස් වල ලැයිස්තුගත කර ඇත.***

# සාරාංශය

ශ්‍රී ලාංකික සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් (එල් ජී බී ටී) කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ දර්ශකය යනු, එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින් මුහුණපාන අවමන් සහගත සැලකීම සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ සිදු කරන ලද ප්‍රමාණාත්මක අධ්‍යයනයකි. ශ්‍රී ලංකාවේ ජීවත් වන එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන ඉහල මට්ටමේ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් නිසාවෙන් ඔවුන්ගේ මූලික මානව අයිතිවාසිකම්වලට හිමිකම් කීමේ අයිතිය පවා යටපත් වී තිබීම මෙම පර්යේෂණයට පාදක විය.

මෙම පර්යේෂණය සිදුකරනු ලැබුවේ ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය වන අතර, එහි ඉලක්කයන්ට ළඟාවීම සඳහා එල් ජී බී ටී පුද්ගලයින් 119 ක් විසින් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලියක් ආධාරයෙන් අවශ්‍ය දත්ත රැස්කරගන්නා ලදී. මෙම පර්යේෂණය සිදුකිරීමේදී එහි රහස්‍යභාවය තහවුරු කිරීම සඳහා, අචාරධර්මීය පිළිවෙතක් ද අනුගමනය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය පහසු කරගැනීම සඳහා, මෙම අධ්‍යනයට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්තාර සහ රේඛා සටහන් භාවිත කරන ලදී.

මෙම ශ්‍රී ලාංකික එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ දර්ශකය තුලින්, එල් ජී බී ටී ප්‍රජාව කායික, මානසික, වාචික සහ මනෝමය හිංසනය ආදී වෙනස්කොට සැලකීම්වලට ලක්වන බව සොයාගන්නා ලදී. එමෙන්ම, මෙවැනි ආකාරවල වෙනස්කොට සැලකීම්වලට මුහුණපානු ලබන්නේ පවුල්, ආගමික සහ සමාජයීය වටපිටා තුලදීය. නිවාස අයිතීන්, නිසි වෘත්තීමය අවස්ථා, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාවන් ආදී මූලික මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට එල් ජී බී ටී ප්‍රජාවට ඇති අවස්ථාවන්ද සීමා වී ඇත.

එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සගත සැලකීම් ශ්‍රී ලංකාව තුළ දැඩි ලෙස අභ්‍යන්තරකරණය වී ඇත. ශ්‍රී ලංකාව තුළ එල් ජී බී ටී ලෙස ස්වයං හඳුනාගැනීමක් කරගෙන ඇති හෝ තමන් එසේ විය හැකි යැයි හැඟෙන පුද්ගලයින් බියෙන් ජීවත් වනවා පමණක් නොව, තම අනන්‍යතාවය රෝගයක් යැයි සිතා එය සුවකල හැකි යැයි සැලකෙන හානිකර ප්‍රතිකාර ක්‍රමවලට යොමුවීම සිදුවන අතර, ඇතැම් විට තම ජීවිතය අහිමිකරගැනීම වැනි ක්‍රියාවන්ට පවා යොමු වේ.

# පටුන


| අන්තර්ගතය | පිටුව |
| --- | --- |
| පිදුම | I |
| කෙටි යෙදුම් | II |
| පද අර්ථ දැක්වීම් | III |
| සාරාංශය | IV |
| **1 වන පරිච්ඡේදය** | |
| 1 <u>හැඳින්වීම</u> | |
| 1.1. පසුබිම | 1 |
| 1.2. ගැටලුවේ ස්වභාවය | 1 – 2 |
| 1.3. අධ්‍යයනයේ ඉලක්කය | 2 |
| 1.4. අධ්‍යයනයේ අරමුණු | 2 |
| 1.5. අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳ සංක්ෂිප්ත සටහන | 2 – 3 |
| 1.6. අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය | 3 |
| 1.7. අධ්‍යයනයේ වැදගත්කම | 3 – 4 |
| 1.8. අධ්‍යයනයේ සැලැස්ම | 4 |
| **2 වන පරිච්ඡේදය** | |
| <u>සාහිත්‍ය විමර්ශනය</u> | |
| 2.1. හැඳින්වීම | 5 |
| 2.2. එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනගැනීම | 5 – 6 |
| 2.2.1. අවමන් සහගත සැලකීම් හඳුනාගැනීම | 6 |
| 2.2.2. වෙනස්කොට සැලකීම් හඳුනාගැනීම | 7 |
| 2.3. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්; මානව හිමිකම් භුක්ති විඳීමට ඇති ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම | 7 – 8 |

## 3 වන පරිච්ඡේදය


අධ්‍යයන ක්‍රමවේදය

| | |
|---|---|
| 3. හැඳින්වීම | 9 |
| 3.1. *1 වන අදියර* | |
| 3.1.1. නියැදි ලබාගැනීමේ භාවිතාකළ තාක්ෂණය | 9 – 10 |
| 3.1.2. නියැදි වල ප්‍රමාණය | 10 |
| 3.1.3. පර්යේෂණ මෙවලම් | 10 – 11 |
| 3.1.3.1. පර්යේෂණ මෙවලම් සම්බන්ධව ඇති ගැටළු | 12 |
| 3.2. *2 වන අදියර: පර්යේෂණ කණ්ඩායම* | 12 |
| 3.2.1. පර්යේෂණ කණ්ඩායම තෝරාගැනීමේ ගැටළු | 13 |
| 3.2.2. රහස්‍යභාවය | 13 |
| 3.3. *3 වන අදියර: දත්ත එක්රැස් කරගැනීම* | |
| 3.3.1. ක්‍රමවේදය | 13 |
| 3.3.2. දත්ත ග්‍රහණය කරගැනීම සම්බන්ධ ගැටළු | 14 |
| 3.4. *4 වන අදියර* | |
| 3.4.1. තත්ත්ව පාලනය | 14 |
| 3.4.2. දත්ත ග්‍රහණය කිරීම | 14 – 15 |
| 3.4.2.1. දත්ත ග්‍රහණය කිරීමේ වාසි | 15 |
| 3.5. *5 වන අදියර: දත්ත විශ්ලේෂණය* | 15 |
| 3.5.1. විශ්ලේෂණයේ සීමාවන් | 16 |


## 4 වන පරිච්ඡේදය


4. ප්‍රතිඵල සහ සාකච්ඡාව

| | |
|---|---|
| 4.1. මෙම පර්යේෂණයේ අඩංගු තොරතුරු අර්ථකථනය කිරීම | 17 |
| 4.2. ප්‍රජා විද්‍යාත්මක දත්ත විශ්ලේෂණය | 18 – 23 |
| *4.3. සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධ පෞද්ගලික අත්දැකීම්* | |
| 4.3.1. අනෙකුත් පුද්ගලයින්ගෙන් ඇතිවූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් | 24 – 29 |

සම්බන්ධ අත්දැකීම්

4.3.1.1. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ප්‍රකාශනය 29 – 36

4.3.1.2. එල් ජී බී ටී ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැලකීම් සිදුකරන පාර්ශව 36

4.3.2. රැකියා අවස්ථාවන්, සෞඛ්‍ය සේවාවන්, නිවාස සහ අධ්‍යාපනයට ඇති අයිතිය භුක්තිවිඳීම 36- 43

4.3.2.1. පවුල් වෙත කෙරෙහි එල්ලවන අවමන් කිරීම් සහ වෙනස්කොට සැලකීම් 43

4.3.2.2. ලිංගික දිශානතිය , ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය පිලිබඳ සාකච්ඡාව 44 – 50

4.3.3. අභ්‍යන්තරකරණය වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් 50 – 59

4.4. වෙනසක් ඇතිකිරීම 59 – 69

4.5. අනන්‍යතා හෙළිදරවු කිරීම සහ රහස්‍යභාවය 69 – 100

4.6. ගුණාත්මක විශ්ලේෂණය 100 – 101

## 5 වන පරිච්ඡේදය

5. <u>නිගමන සහ නිර්දේශ</u>

*5.1. නිගමනය* 102 – 105

5.1.1. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සිදුවන පරිසර 102

5.1.2. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට හේතුවන හේතූන් 103

5.1.3. එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සිදුකරන පාර්ශව 103

5.1.4. වෙනස්කොට සැලකීමේ ආකාර 103

5.1.5. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වල බලපෑම් 104

5.1.6. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ ආමන්ත්‍රණය 104 – 105

*5.2. නිර්දේශ* 105 – 107

5.2.1. එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින් 105

5.2.2. එල් ජී බී ටී පුද්ගලයින්ගේ ගැටළු පිළිබඳව කටයුතු කරන පුද්ගලයින් සහ සංවිධාන 106

5.2.3. සිවිල් සමාජය 106

5.2.4. ශ්‍රී ලංකා රජය 106

රුපසටහන් ලයිස්තුව A-F

වගු ලැයිස්තුව G-H

යොමුව සහ ලේඛන නාමාවලිය

උපග්‍රන්ථ

- **A** උපග්‍රන්ථය තත්ත්ව පාලන මාර්ගසූවක

# ප්‍රථම පරිච්ඡේදය

## 1. හඳුන්වාදීම

### 1.1 පසුබිම

ඊක්වල් ග්‍රවුන්ඩ් යනු ශ්‍රී ලංකාවේ කොළඹ නගරය මුල්කරගෙන ආරම්භ කරන ලද ලාබ-නොලබන ආයතනයකි. මෙම සංවිධානයේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාව තුළ වෙසෙන සියලුම ලිංගික නැඹුරුතාවයන් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන්ට සැබෑ ලෙසම සමානාත්මතාවය උදාකිරීමයි. සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව වෙනුවෙන්, නොවෙනස් සමාජ සහ දේශපාලනික අයිතිවාසිකම් ලබාගැනීම උදෙසා කටයුතු කරන එකම සංවිධානය ලෙස, සංවිධානයේ කටයුතු ප්‍රධාන වශයෙන්ම ඉලක්ක කරගන්නේ උද්දේශන සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ය. ඊක්වල් ග්‍රවුන්ඩ් සංවිධානය විසින් සිදුකරන කාර්යන්වලින් සැලකිය යුතු වැඩ කොටසක් කරන්නේ එල් ජී බී ටී ප්‍රජාව පිළිබඳ සමාජය සංවේදීකිරීම තුළින් දැනුවත්භාවය වර්ධනය කිරීම හරහා එම ප්‍රජාව ජීවත්වන පරිසරය තුළ ඔවුනට විෂමරිසි පුද්ගලයින් හා සමානවම අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලින් තොර, නිදහස් සහ තෘප්තිමත් ජීවිත ගත කළහැකි වාතාවරණයක් ගොඩනැගීමටයි.

මෙම සංවිධානය විසින් සිදුකරනු ලබන කටයුතුවලට ශ්‍රී ලංකාවේ පවතින අදූරදර්ශී නීති, ආගමික සහ සමාජයීය මූලධර්මවාද ආදියෙන් අභියෝග එල්ල වේ. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය මගින් වැඩිහිටියන් අතර ස්වකැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියාකාරකම් අපරාධයක් ලෙස සලකනු ලබයි එමෙන්ම ආගමික ස්ථාන හා ආගම් මගින් සමරිසිභාවය ප්‍රතික්ෂේප කිරීම සහ හෙළා දැකීම සිදුකරන අතර, සමාජය විසින් තවදුරටත් ලිංගික සුළුතරය සහ සමාජගත ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට අනුකූල නොවන පිරිස් වලට වෙනස්කොට සැලකීම සිදුකරයි. (බ්‍රවුන්,2011) එල් ජී බී ටී ප්‍රජාවට එරෙහි අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්, සමරිසි භීතිකාව සහ සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව දක්වා වර්ධනය වී ඇත. කෙසේ නමුත්, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණදෙන්නේ කෙසේද, එවැනි ක්‍රියා සිදුකරන්නේ කවුරුන්ද හෝ එල් ජී බී ටී ප්‍රජාවගේ ජීවිතවලට ඉන් සිදුවන බලපෑම කෙබඳුද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා කිසිඳු ආකාරයක අධ්‍යයනයක් සිදුකර නොමැති බැවින්, සමරිසි භීතිකාව කෙතරම් බරපතල ලෙස ව්‍යාප්තව ඇත්දැයි නිර්ණය කිරීමට නොහැකිව පවතී.

එමනිසා, මෙම පර්යේෂණ ව්‍යාපෘතිය ඉලක්ක කොටගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ අවබෝධය ඇතිකරගැනීම උදෙසායි. මෙය එල් ජී බී ටී ප්‍රජාව තුළම සිදු කරන ලද, විවිධ පරිසරයන් තුළ එල් ජී බී ටී පුද්ගලයින් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ තොරතුරු ලබාගැනීම අරමුණු කොටගත් ප්‍රමාණාත්මක පර්යේෂණයකි. ඒ ආශ්‍රයෙන් ශ්‍රී ලාංකික සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකය සකසා ඇති අතර, ඉන් එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධයෙන් පවතින අවමන් සහගත සැලකීම් කොතරම් දුරට ව්‍යාප්තව ඇත්දැයි සහ ප්‍රකාශ වන්නේදැයි අවබෝධයක් ලබාගත හැකි වනු ඇත.

### 1.2 ගැටලුවේ ස්වාභාවය

වර්ෂ 2011 දී ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය විසින් සමරිසි සහ ද්විරිසි කාන්තාවන් ගේ ජීවිත ඉලක්ක කොටගෙන ප්‍රථමවරට ගුණාත්මක පර්යේෂණයක් සිදු කරන ලදී. එකී පර්යේෂණය ඉලක්ක කරගත්තේ සමරිසි සහ ද්විරිසි කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසන යි. මෙම අධ්‍යනය ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනයේ මනෝ උපදේශන සේවාව හරහා ලැබුණු වාර්තා සමග සංයුක්ත කිරීමෙන් පිළිබිඹු වන්නේ බොහොමයක් අවස්ථාවලදී එල් ජී බී ටී පුද්ගලයින්ව ශ්‍රී ලංකාව තුළ කැමැත්තෙන් පිළිගන්නේ නොමැති බවකි.

තවද, ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සමග බැඳුණු වෛරය සහ වෙනස්කොට සැලකීමෙන් ඇත්ව, තම ජීවිත ගතකිරීමට එල් ජී බී ටී ප්‍රජාවට ඇති හැකියාවද ඇහිරී ඇත.. එල් ජී බී ටී ප්‍රජාව වෙනුවෙන් සහ ප්‍රජාව තුළ කටයුතු කරන සංවිධානයක් ලෙස, එල් ජී බී ටී ප්‍රජාවගේ මූලික මානව අයිතිවාසිකම්වලට එරෙහිව සිදුවන අසාධාරණ ක්‍රියා පිළිබඳව ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනයට නිරන්තරයෙන් අසන්නට ලැබේ. ශ්‍රී ලංකාව තුල එල් ජී බී ටී ප්‍රජාවට එරෙහිව සිදුවන පීඩනය, ශාරීරික සහ මානසික අපයෝජන වල සිට දරුණු මානසික වදහිංසා දක්වා වන අතර, එම නිසාවෙන් ඔවුන්ට ශ්‍රී ලංකාව තුල ගෞරවාන්විතව සහ නිදහසේ ජීවත් විය නොහැක.

ප්‍රජාව විසින් මුහුණපාන අවමාන සහ වෙනස්කොට සැලකීමේ තරම කොතරම්දැයි මැනගැනීමට උදවු වන කිසිඳු ප්‍රගතියක් එල් ජී බී ටී ප්‍රජාව තුළ සිදුව නොමැත. එවැනි තොරතුරුවල හිඟබව නිසා එල් ජී බී ටී ප්‍රජාවට දිගින් දිගටම බලපෑම් කරමින් ඇති අතර, ඉන් ප්‍රතිවිපාක රාශියක්ද නිර්මාණය වෙමින් පවතී. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලින් පැනනගින එල් ජී බී ටී ප්‍රජාවට එරෙහි ක්‍රියාවන්වලට පිළියම් ලබාදීම ඉතා පහළ මට්ටමක පවතී. ඉහත කී හේතුන් නිසා, ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතයනයද එල් ජී බී ටී ප්‍රජාවට නොලැබී ඇති අවශ්‍යතා ලබාදීමට අපොහොසත් වී ඇත.

එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනගැනීම තුලින් එල් ජී බී ටී ප්‍රජාවට එරෙහිව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකිවනවා පමණක් නොව, එවැනි අධ්‍යයනයක් තුළින් වෙනසක් සිදුකිරීමටද හැකිවනු ඇත. එමෙන්ම, ඉන් ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම වෙනුවෙන් ශ්‍රී ලාංකික පොදු ජනතාව සමග එක්ව සිදුකරන කටයුතු පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම, එල් ජී බී ටී ප්‍රජාව ගේ මානව ගරුත්වය ඉහල නැංවීම සහ ශ්‍රී ලාංකිකයින් ලෙස ඔවුන්ගේ සත්‍යවාදීබව ආරක්ෂා කිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් කිරීම සඳහා සහයෝගය පලකිරීමද මින් සිදු වේ.

## 1.3 අධ්‍යයනයේ ඉලක්කය

මෙම අධ්‍යයනයේ ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සිදුවන්නේ කෙසේද යන්න තේරුම්ගැනීමයි.

## 1.4 අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනය පහත දැක්වෙන අරමුණුවලට ළඟාවීමට ඉලක්ක කරයි;

1- ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනගැනීම.

2- කාලයත් සමග එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනගැනීමට හැකි මෙවලම් සම්පාදනය කරගැනීමට පදනමක් සකස් කරගැනීම.

3- එල් ජී බී ටී ප්‍රජාවට එරෙහිව ප්‍රධාන වශයෙන් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සිදුවන විවිධ වටපිටාවන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.

## 1.5 අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳව සංක්ෂිප්ත සටහන

මෙම අධ්‍යයනයේදී යොදාගත් ක්‍රමවේදය ප්‍රධාන අදියර 5 කට වෙන්කර දැක්විය හැක. ඉන් පළමු අදියර ප්‍රාරම්භක අදියර ලෙස හැඳින්විය හැක. පර්යේෂණයේ ඉලක්ක, අරමුණු මෙන්ම යෝජිත ප්‍රතිඵල ද මෙම

අදියරේදී හඳුනාගන්නා ලදී. එමෙන්ම, මෙහිදී භාවිතාවන අචාරධර්මීය ක්‍රියාවලීන් සහ සම්පත් සම්බන්ධ අධ්‍යයන අවශ්‍යතා හඳුනාගනු ලබන්නේද පර්යේෂණයේ මෙම අදියර තුළදීය. තවද, මෙම අදියර තුළදී පර්යේෂණ මෙවලම් හඳුනාගැනීම සහ නිර්මාණය කිරීම සිදුකළ අතර, නියැදි ලබාගන්නා ක්‍රමවේදය සහ නියැදි වල ප්‍රමාණය ද නිර්ණය කිරීමද මෙම අදියරේදී සිදුකරන ලදී.

එල් ජී බී ටී පුද්ගලයින් සිටිනා ස්ථාන නිසි ලෙස නිශ්චය කරගැනීමේ අපහසුතා හේතුවෙන්, ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය ප්‍රථමයෙන්ම සිදුකරනු ලැබුවේ නිසි ආකාරයෙන් සම්බන්ධ කරගත හැකි එල් ජී බී ටී පුද්ගලයින් සම්බන්ධ කරගැනීම යි. ඉන් අනතුරුව, මෙම අධ්‍යනයට තවත් පිරිස් සහභාගී කරගැනීම සඳහා හිමබෝල නියැදි ක්‍රමය භාවිතා කරන ලදී. එල් ජී බී ටී ප්‍රජාව නියෝජනය කරන කණ්ඩායම් එකකින් පුද්ගලයින් 30 දෙනෙක් බැගින් තෝරාගෙන, ඔවුන්ගෙන් දත්ත ලබාගැනීම නියමු ව්‍යාපෘතියේ ඉලක්කය වේ.

අධ්‍යයනයේ දෙවන අදියර සමන්විත වන්නේ, පර්යේෂණ කණ්ඩායමට යෝග්‍ය අපේක්ෂකයින් හඳුනාගැනීම, අධ්‍යයනයේ අවශ්‍යතා සපුරාගැනීම පිළිබඳව තෝරාගත් කණ්ඩායමට පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ අවසාන වශයෙන්, අවසාන පර්යේෂණ කණ්ඩායම තෝරාගැනීම ආදියෙනුයි.

දත්ත රැස්කරගැනීමේ ක්‍රියාවලිය අයත් වන්නේ මෙම පර්යේෂණයේ තුන්වැනි අදියරටයි. අධ්‍යයනයේ සිව්වැනි අදියර දත්ත ග්‍රහණය සඳහාම වෙන්වූවකි; පර්යේෂණයේ ඊළඟ අදියරේදී භාවිතා කරන දත්ත කාණ්ඩ තෝරා වෙන්කරගැනීම සඳහා තත්ත්ව පරීක්ෂාවක් සිදු කෙරින. අධ්‍යයනයේ පස්වන සහ අවසාන අදියර දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය කිරීමයි. දත්තවල ස්වභාවය ඉතා සුළු වන අතර, එමනිසා දත්තවලින් ලබාගන්නා තොරතුරු නිරූපණය කිරීමට ප්‍රස්තාර සහ රේඛා සටහන් යොදාගැනීමට හැකියාව ලැබෙනු ඇත. විශ්ලේෂණ කිරීමේ ක්‍රියාවලිය, විචල්‍යයන් අතර සිදුකෙරෙන හරස් - වගුගත කිරීමේ විශ්ලේෂණයකින්ද යුක්ත වේ. වගු සහ රේඛා සටහන් මගින් නිරූපණය කෙරන තොරතුරුවල සංඛ්‍යානමය විශ්ලේෂණය සහ පැහැදිලි කිරීම් මෙම නියමු සමීක්ෂණයේ පදනම වනු ඇත. මෙම පර්යේෂණයෙන් රැස්කරගත් ඇතැම් තොරතුරු පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක් ලබාගැනීම සඳහා මෙහිදී ගුණාත්මක ප්‍රවේශයක්ද භාවිතා කරනු ඇත.

## 1.6 අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය

ඊක්වල් ග්‍රවුන්ඩ් සංවිධානය කොළඹ නගරය පදනම් කරගෙන පිහිටුවාගෙන ඇති නමුත්, ඊට සම්බන්ධ පරිවාර නිලධාරීන් හරහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 05ක් තුළ වැඩකටයුතු සිදුකරනු ලබයි. මෙම අධ්‍යනය තුලින් ආවරණය කිරීමට බලාපොරොත්තු වන දිස්ත්‍රික්ක වනුයේ; කොළඹ, අනුරාධපුර, කළුතර, නුවරඑළිය සහ ගාල්ලයි. පර්යේෂණය තුළින් අවධානය යොමු කරනු ලබන්නේ ඉහත කී දිස්ත්‍රික්ක තුළ ජීවත් වන සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවගෙන් ලබාගන්නා ලද දත්ත වලටයි. නගර, ප්‍රධාන නගර, වැවිලි කර්මාන්ත ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ යනුවෙන් ශ්‍රී ලංකාවේ භූගෝලීය ප්‍රජා සංවර්ධනයන් අනුකාණ්ඩ හතරකට බෙදා වෙන්කළ හැක. සෑම දිස්ත්‍රික්කයකම වෙසෙන එල් ජී බී ටී ප්‍රජාවගේ නියෝජනය තහවුරු කිරීම සඳහා, දිස්ත්‍රික්ක පහෙන්ම රැස්කරගන්නා ලද දත්ත මෙහි නිරූපණය කරනු ලබයි. මෙහිදී භාෂා සහ ජාතීන් ද සැලකිල්ලට ගන්නා ලද අතර, මෙම අධ්‍යයනය තුළ දෙමල, සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා තුනම නියෝජනය වේ.

## 1.7 අධ්‍යයනයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාව පිළිබඳ තොරතුරුවල සීමිත පවතී. ඒ හේතුවෙන්, ශ්‍රී ලාංකික එල් ජී බී ටී ප්‍රජාව පිළිබඳ ඇති තොරතුරු ප්‍රමාණය වර්ධනය කිරීමේ උත්ප්‍රේරකයක් ලෙස මෙම අධ්‍යයනය භාවිතා කළ හැකිවනු ඇතැයි බලාපොරොත්තු වෙමු. මෙම අධ්‍යයනයට ඇත්තේ තොරතුරු ලබාදීමේ සහ දැනුම වර්ධනය කිරීමේ හැකියාවක් පමණක් නොව, ලිංගිකත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමේ හැකියාවක්ද එය සතු ය.

ශ්‍රී ලංකාවේ පළාත් නවයක් අතුරින් හතරකින් පමණක් රැස් කරගත් දත්තවලට මෙම අධ්‍යයනය සීමා වී ඇත. කෙසේ නමුත්, විවිධ සංස්කෘතීන් හා සමාජ පරිසරයන් තුළින් ප්‍රධාන ප්‍රජා කණ්ඩායම් නියෝජනය වන පරිදි මෙම අධ්‍යයනය සිදුකිරීම තුළින්, සමස්තයක් ලෙස ශ්‍රී ලාංකික එල් ජී බී ටී ප්‍රජාව අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් අත්විඳින ආකාරය අවබෝධ කර ගැනීමට ද ඉඩ සලසා දෙයි.

ශ්‍රී ලංකාවේ වෙසෙන එල් ජී බී ටී පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා නීති සහ ප්‍රතිපත්ති ක්ෂේත්‍රවල ඇතිකළ යුතු අභිවෘද්ධියට මුලපිරීමට මෙම ව්‍යාපෘතියට හැකියාවක් ඇත. එපමණක් නොව, එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි එල්ලවී ඇති අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ඔවුන්ගේ ජීවිත අඩාළ කරන්නේ කෙසේද යන්න සහ ඔවුන්ගේ පුද්ගල ප්‍රගතියට බාධා පමුණුවන්නේ කෙසේද යන්න පෙන්වාදීම තුළින්, හැසිරීම් රටාවල වෙනසක් සිදුකිරීම පිළිබඳ පණිවිඩයක් ලබාදීමට ද මෙම ව්‍යාපෘතියට හැකියාවක් ඇත. ප්‍රජාවේ අවශ්‍යතා හඳුනාගැනීම සහ එමගින්  ශ්‍රී ලාංකික එල් ජී බී ටී ප්‍රජාවගේ ජීවිත ගොඩනැගීම ඉලක්ක කොටගත් සැලසුම් සහගත මැදිහත්වීම් සිදුකිරීමේදී එය ඉතාමත් වැදගත් වේ. මෙම අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකය නිර්අපරාධීකරණය කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ඊක්වල් ග්‍රවුන්ඩ් විසින් සිදු කරන උද්දේශන කටයුතු සඳහාද භාවිත කළ හැකිය.

## 1.8 අධ්‍යයනයේ සැලැස්ම

මෙම අධ්‍යයනය තවත් පරිච්ඡේද හතරක් පුරාවට විහිදී යයි. මෙම පරිච්ඡේදයට පසු ඇති දෙවන පරිච්ඡේදය, මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනය ලෙස හැඳින්විය හැකිය. සමස්ත සමාජය තුළ සහ එල් ජී බී ටී ප්‍රජාව තුළම සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මූලික කරගනිමින් රචනා කළ වඩාත් ගැඹුරු ශාස්ත්‍රීය සමාලෝචනයක් දෙසට මෙම පරිච්ඡේදය තුළින් අවධානය යොමු කෙරේ.

මෙම පර්යේෂණය සිදුකිරීමේදී විවිධ අදියර තුළ භාවිතා කළ ක්‍රමවේද පිළිබඳව මෙහි තුන්වන පරිච්ඡේදය හරහා මනාව පැහැදිලි කෙරේ. ඉන් පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳවද මනා අවබෝධයක් ලබාදෙනු ඇත.

හතරවන පරිච්ඡේදය වෙන්වන්නේ දත්ත මත පදනම්වූ සංඛ්‍යානමය විශ්ලේෂණය සහ එහි ප්‍රතිඵල ඉදිරිපත්කිරීම මගින් මෙම පර්යේෂණයේ ඉලක්කයන්ට ළඟාවීමට උත්සාහ දැරීමටයි. ලැබූ ප්‍රතිඵල සංඛ්‍යානමය දෘෂ්ටිකෝණයකින් වැඩිදුරටත් සාකච්ඡා කරනු ලබයි.

මෙම අධ්‍යයනයේ අවසාන අදියර පස්වැනි අදියර වේ. මෙම අධ්‍යයනයේදී ලබාගත් තොරතුරු මත පදනම්ව අවසාන නිගමනයන්ට එළඹෙන්නේ මෙම අදියරේදී ය. එමෙන්ම, මෙහි නිර්දේශ ඉදිරිපත් කරනු ලබන්නේද මෙම අදියරේදී ය.

# දෙවන පරිච්ඡේදය
## සාහිත්‍ය විමර්ශනය

### 2.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව පැවසිය නොහැකි තරම් අභියෝගවලට මුහුණදේ. මෙම පර්යේෂණය මූලික වශයෙන්ම ඉලක්ක කරගන්නේ ඔවුන් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳවය. එපමණක් නොව, මානව අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙනුත් අවධානය යොමු කිරීම කළ යුතුය. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්, මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ හැකියාව සමග සහසම්බන්ධිත බවට මතයක් පවතී. ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීමේ සහ වෙනස්කොට සැලකීමේ තරම කොතරම්ද යත්, සෞඛ්‍ය සේවාවන්, අධ්‍යාපනය, නීතියේ ආරක්ෂාව, රැකියා නියුක්තිය ඇතුළුව ඔවුන්ගේ අනෙකුත් අයිතීන් භුක්ති විඳීමට ඔවුන්ට ඇති හැකියාව අභියෝගයට ලක්කර තිබෙන්නේ විවිධ පුද්ගලයින් පමණක් විසින් නොව, රජය විසින්ද වේ.

මෙම පර්යේෂණය සහතික කිරීමේදී, පුද්ගලයින් කෙරෙහි, පුද්ගල සංවර්ධනය කෙරෙහි සහ පුද්ගල යහපැවැත්ම කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මෙන්ම, එහි බලපෑම් පිලිබඳ අදහස් අනාවරණය කිරීමද වැදගත් වේ. මෙහි ඇත්තේ අයිතීන් පිළිබඳ අවබෝධ කරගැනීම සම්බන්ධ ගැටළුවක්ද එසේත් නැත්නම් අයිතීන් භුක්ති විඳීමට අවකාශය ලබාදීම සම්බන්ධ ගැටළුවක්ද යන්න වටහා ගැනීම වඩාත් වැදගත් වේ. එමනිසාවෙන්, මෙම අධ්‍යයනයේ දී භාවිතා කර ඇති සාහිත්‍යමය පරාසය අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳව මෙන්ම, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම මානව අයිතිවාසිකම් වලට සමස්තයක් ලෙස සම්බන්ධ වන්නේ කෙසේදැයි අවබෝධයක් ඇති කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

### 2.2. එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනබැලීම

ලොව පුරා වෙසෙන එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ දිනපතා මාධ්‍ය හරහා සහ වාචිකව තොරතුරු ඉදිරිපත් වුවත්, ලොව කිසිදු ස්ථානයක එල් ජී බී ටී ප්‍රජාවන් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මැනබැලීම අරමුණු කොටගත් පර්යේෂණ වාර්තා නොමැත. එමනිසා, වර්තමාන ශ්‍රී ලාංකික වාතාවරණය පිළිබඳ අවධානය යොමුකරන මෙම අධ්‍යයනය, එවැනිම වූ වෙනත් අධ්‍යයනයක් සමග සංසන්දනය කිරීමට ඇති හැකියාව අවහිර ව ඇත. කෙසේනමුත්, "පිටතට පැමිණි කණ්ඩායම්" (ගොෆ්මන්, 1963) මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳව මැනබැලීම අරමුණු කොටගත් පර්යේෂණ රාශියක් සොයාගත හැකිය. මෙම අධ්‍යයනයට වඩාත් අදාළතාවකින් යුත් සහ වටිනාකමක් එක් කළහැකි තවත් පර්යේෂණයක් වන්නේ එච් අයි වී සමග ජීවත් වන පුද්ගලයින් (පී එල් එච් අයි වී) කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිලිබඳ දර්ශකයයි. පී එල් එච් අයි වී කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය මගින් මැනබලන්නේ එච් අයි වී මත පදනම්ව එච් අයි වී අසාදනය වී ඇති පුද්ගලයින් කෙරෙහි ඇති අවමන් සහගත සැලකීම් සැලකීමයි.

පී එල් එච් අයි වී කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සැලකීම පිළිබඳ දර්ශකයෙහි අදාළතාව, එහි ප්‍රශ්නාවලිය මත රඳා පවතී. එහි ඇතුලත් අවමන් සහගත සැලකීම් පිලිබඳ කරුණු එල් ජී බී ටී පුද්ගලයින් මුහුණපාන අවමන් සහගත සැලකීමට මහත් සේ අදාළතාවක් පෙන්වයි. එල් ජී බී ටී පුද්ගලයින්ද පී එල් එච් අයි වී මෙන් සේවා ස්ථානවලදී, අධ්‍යාපන ආයතනවලදී, සෞඛ්‍ය සේවා සපයන ස්ථානවලදී සහ එදිනෙදා ජීවිතයේදී අවමන් සහගත සැලකීම් සැලකීම්වලට මුහුණපාන බව මෙම පර්යේෂණය අනුමාන කරයි. මෙම කණ්ඩායම් දෙක අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පරිසර දෙක එකසමාන ලක්ෂණ පෙන්වනවා පමණක් නොව, වෙනස්කොට සැලකීම සිදුවූ ආකාරයන් ද මෙම කණ්ඩායම් දෙකටම හුරුපුරුදු ය. පී එල් එච් අයි වී කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය මෙන්ම, ඊක්වල් ග්‍රවුන්ඩ් සංවිධානය විසින් සිදු

කරන මෙම එල් ජී බී ටී පුද්ගලයින් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ දර්ශකය ද, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේදී සිදුවන වෙන්කොට සැලකීමට හේතුවක්ය යන මතය ප්‍රකාශ කර සිටී.

එබැවින්, පී එල් එච් අයි වී කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සැලකීම පිලිබඳ දර්ශකය හරහා සොයාගත් කරුණු වලට සමාන කරුණු මෙම නියමු අධ්‍යනයෙන්ද සොයාගැනීමට හැකිවනු ඇතැයි අනුමාන කළ හැක. අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පාර්ශව අභ්‍යන්තරීකරණය වූ වෙන්කිරීම්වලින් පෙලෙන අතර, එය බිය, අන්‍යයන්ගෙන් වෙන්වීම සහ වෙනත් ආකාරවල ගැටළු දක්වා වර්ධනය වේ.

## 2.2.1. අවමන් සහගත සැලකීම් හඳුනාගැනීම

අර්වින් ගොෆ්මන් විසින් අවමන් සහගත සැලකීම් නම් වන සංකල්පය පිලිබඳව සහ අවමන් සහගත සැලකීම්වලට ලක්වූවන් අවමන් සහගත සැලකීම්වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න පිලිබඳ පර්යේෂණය කළ බැවින්, ඔහු විසින් අවමන් සහගත සැලකීම් පිලිබඳ සිදුකරන ලද වඩාත් පුළුල් වූ කාර්යයන් මෙම අධ්‍යයනයට විශේෂයෙන්ම වැදගත් වේ. අවමන් සහගත සැලකීම්වලට ලක්වූ කණ්ඩායම්වලට අයත් පුද්ගලයින් සහ ඔවුන් අයත් වන කණ්ඩායම්වල ස්වාභාවය සම්බන්ධයෙන් ගත්කල, තව තවත් අවමන් සහගත සැලකීම්වලට ලක්වීමෙන් බලපෑම් ඇතිවන්නේ කෙසේද යන්න පිළිබඳව සහ එවැනි පුද්ගලයින් ඔවුන් කෙරෙහි අවධානය ලබාගැනීමට උත්සාහ නොකිරීමෙන් පුද්ගලයකු වශයෙන් වෙන්වීමට ලක්වන්නේ කෙසේදැයි ඔහු විසින් ඉතා විශිෂ්ට ඇගයීමක් සිදු කර ඇත.

ගොෆ්මන් ට (1963) අනුව, අවමන් සහගත සැලකීම් පුද්ගලයෙක්ගේ චරිතයේ නොහැකිතා සමග බැඳී පවතී. ඒවා, "දුර්වල අරමුණු, දෝෂ සහගත හෝ අස්වාභාවික ආශා, අවිශ්වාස සහගත හා දරදඬු විශ්වාස සහ වංකභාවය" ලෙස දැකිය හැක. ගොෆ්මන් විසින් අවමන් සහගත සැලකීම්වලට ලක්වූ ප්‍රජාවන්ගේ ලැයිස්තුවට සමරිසි පුද්ගලයින්ව ද ඇතුලත් කළේය. ඔහුගේ අර්ථකතනයේ අදාලතාව එහි වර්තමාන භාවිතය තුල රඳාපවතී. එකල සමරිසි පුද්ගලයින් ලෙස පොදු කාණ්ඩයකට ගොනු කරනු ලැබූ එල් ජී බී ටී පුද්ගලයින් අද, සමරිසිභාවය ස්වාභාවධර්මයේ නීතියට විරුද්ධ අස්වාභාවික ක්‍රියාවක් ලෙස සැලකීම (දණ්ඩ නීති සංග්‍රහයේ 365අ) නිසා රාජ්‍යය විසින් මෙහෙයවන ලද අවමන් සහගත සැලකීම්වලට මුහුණපායි.

අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පුද්ගලයින්ගේ හැසිරීම් රටාව සම්බන්ධයෙන් ගොෆ්මන් ඉදිරිපත් කල කරුණු මෙහිදී වැදගත් වේ. අවමන් සහගත සැලකීම්වලට ලක්වූ කණ්ඩායම්වල සාමාජිකයින් වෙනස් ලෙස සැලකුම් ලැබීමට කොතරම් බියක් දක්වනවාද යත්, ඔවුන් තවදුරටත් එකී අවමන් සහගත සැලකීම්වලට ලක්වූ කණ්ඩායම සමග සම්බන්ධව සිටීමට කැමැත්තක් නොදක්වයි යන සංකල්පය එහිදී ඉදිරිපත් වේ. එල් ජී බී ටී ප්‍රජාව තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව හෙළි නොකරන්නේ, අවමන් සහගත සැලකීම්වලට ලක්වීමේ බියෙන් යන කරුණ මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී. මෙම පර්යේෂණය සඳහා පදනම් වන මතවාද ගොෆ්මන් විසින් සහාය පල කළ මතවාදම වේ. අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පුද්ගලයින් තමන් පිලිබඳ හෙළිවීමත්, ඉන් ඇතිවිය හැකි අවමන් සහගත සැලකීමුත් පිලිබඳ ඇති බිය නිසා "සැඟවීම" (ගොෆ්මන්, 1963) යන ක්‍රමය අනුගමනය කළ බව ඔහු පවසයි. අවමන් සහගත සැලකීම්වලට ලක්වූ කණ්ඩායම සමග සම්බන්ධ වන ආකාරයෙන් හැසිරීමෙන් සහ ක්‍රියා කිරීමෙන් වැළකී සිටීමට උත්සාහ දරන ලද බව මෙම න්‍යාය තුළින් ඉදිරිපත් කෙරේ. මෙම පර්යේෂණයට සහභාගීවන්නන් මෙම සැඟවීමේ ක්‍රමය අනුගමනය කරනවා යන්න පමණක් නොව, එය පිටුපස ඇති හේතු සාධක ගොෆ්මන් ගේ න්‍යායේ දැක්වෙන පරිදි ඉදිරිපත් වෙනු ඇතැයි ද බලාපොරොත්තු වේ.

පිටතට පැමිණීමේ ගැටලුව සම්බන්ධයෙන් ගත් කල, අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පුද්ගලයින් විසින් පුද්ගලයින් කිහිපදෙනෙක් පමණක් විශ්වාස කිරීමට නැඹුරුවීම, ඔවුන් මුහුණදුන් අවමන් සහගත සැලකීම් සමග සම්බන්ධ වූ වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂා වීමට දරන උත්සාහයක් ලෙස ගොෆ්මන් ඉදිරිපත් කරයි. මෙවැනි පුද්ගලයින් සාමාන්‍යයෙන් සමීපව සිටින අතර, ප්‍රතික්ෂේප වීම් හමුවේ සෘණාත්මක ප්‍රතිචාර දැක්විය හැක.

කෙසේනමුත්, අවමන් සහගත සැලකීම්වලට ලක්වූවන් පිටතට පැමිණි පිරිස අතර හැඳින්වෙන්නේ "ගෞරවනීය ලෙස සලකන අයෙක්" ලෙසයි (ගොෆ්මන්, 1963). එල් ජී බී ටී පුද්ගලයින් පිටතට පැමිණීමට දක්වන කැමැත්ත සහ ඒ කාටද යන්න පිළිබඳවත් මෙම පර්යේෂණය තුලින් ගවේෂණය කරනු ලැබේ. මෙවැනි අවස්ථාවකට ගොෆ්මන් ගේ වෙන්කොට සැලකීම පිලිබඳ න්‍යාය ගැලපේද? එල් ජී බී ටී පුද්ගලින් පිටතට පැමිණෙන්නේ තමන්ගේ සමීපතමයන්ටද?

### 2.2.2. වෙනස්කොට සැලකීම හඳුනාගැනීම

වෙනස්කොට සැලකීම යනු, චේතාන්විතව හෝ අචේතාන්විතව හෝ සිදුකෙරෙන, කිසියම් වූ පුද්ගලයකුගේ හෝ කණ්ඩායමකගේ පෞද්ගලික ලක්ෂණ සම්බන්ධයෙන් අපහසුතා, වගකීම් සහගත හෝ අවාසි සහගත තත්ත්වයන් ඇතිකිරීමට හේතුවන වෙනස්කමක් හෝ, සමාජයේ අන්‍යයන්ට ලැබීමට ඇති අවස්ථා, වරප්‍රසාද සහ වාසි භුක්ති විඳීමට ඇති අවස්ථාව අහුරා දමන හෝ සීමා කරන ක්‍රියාවකි. (කැනේඩියානු මහාධිකරණය, 1989 දී) වෙනස්කොට සැලකීමේ අර්ථකථනය හරහා ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාව මුහුණපාන වෙනස්කොට සැලකීම් පිලිබඳවද සාකල්‍ය (සම්පූර්ණ) ප්‍රවේශයක් සපයයි. විෂමරිසි ශ්‍රී ලාංකිකයින් විසින් භුක්ති විඳින අවස්ථා සහ වරප්‍රසාද ඒ ආකාරයෙන්ම භුක්ති විඳීමට එල් ජී බී ටී පුද්ගලයින් ට ඇති ඉඩකඩ අහුරා දමන යල්පැන ගිය, වෙනස්කොට සැලකීමට හේතුවන නීති රාජ්‍යය විසින්ම ආරක්ෂා කරයි. සමාජය විසින් මුදල් වෙනුවෙන් තර්ජනය කිරීම සහ නීතිය අපහරණය කිරීම යන ආකාරවලින් එල් ජී බී ටී පුද්ගලයින්ගේ ජීවිත වලට දුක් ගැහැට ඇතිකිරීමට හේතුවී ඇත.

වෙනස්කොට සැලකීම තුලින් සුළුතර කණ්ඩායම් කෙරෙහි හානියක් සිදුවන බව (අල්පොර්ට්, 1954) සලකමින් මෙම සංකල්පය දෙස බැලූ කල, මනෝවිද්‍යාඥ ගෝර්ඩන් අල්පොර්ට් (1954) සිදුකර ඇති කාර්යයන් මෙම සංකල්පයට අදාළ කරගත හැක. එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින්ව ඉලක්කවලට ළඟාවීමෙන් සහ රැකියා හෝ අධ්‍යාපනය ලබාගැනීමෙන් වලක්වා ඇති බව හෙළිවන වර්තමාන අධ්‍යයනයට මෙය අනුකූල වේ (අල්පොර්ට්, 1954). වෙනස්කොට සැලකීම සම්බන්ධ හානි පිලිබඳ අල්පොර්ට් සිදුකර ඇති කාර්යයන්වලට මෙම කරුණු අතිශය වැදගත්කමකින් සහ අදාළතාවකින් යුක්ත වේ. වර්තමාන අධ්‍යයන සන්දර්භයන් තුළ, හානිය දෙස බලන්නේ පුද්ගලයකුට සේවාවන් ලබාගැනීමට ඇති ඉඩකඩ සහ සමාන අවස්ථා ප්‍රතික්ෂේප කරනු ලැබීමක් ලෙස පමණක් නොවේ, එහිදී කායික, ලිංගික, චිත්තභාවාත්මක සහ මානසික හානියද සැලකිල්ලට ගැනේ එසේම, එල් ජී බී ටී පුද්ගලයින්ගේ පවුල් සාමාජිකයින් වැනි සුළුතර කණ්ඩායම්වලට සම්බන්ධ පුද්ගලයින් විසින් මුහුණපාන හානි සම්බන්ධයෙන්ද සැලකිල්ලක් දක්වයි.

අධ්‍යයනය තුළින් අවධානය යොමු කරන්නේ වෙනස්කොට සැලකීම එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි හානියක් ඇති කරයිද නැත්ද යන්න පිළිබඳව පමණක් නොවේ, කුමන ආකාරවල වෙනස්කොට සැලකීම් කුමන මට්ටම්වලින් පවතීද යන්න පිළිබඳවද පවා සාකච්ඡා කෙරේ.

## 2.3. වෙන්කොට සහ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්; මානව හිමිකම් භුක්ති විඳීමට ඇති ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම

ශතවර්ෂ ගණනාවක් තිස්සේ එල් ජී බී ටී පුද්ගලයින් හුදෙක්ම ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස්කොට සැලකීම් වලට භාජනය වූයේ, කළු ජාතිකයින් වැනි අනෙකුත් සුළුතරයන් ආකාරයටමය. මානව හිමිකම් ලබාගැනීමට සහ ඒවා භුක්ති විඳීමට ඇති හැකියාව මෙවන් වෙනස්කොට සැලකීම් හරහා දැඩි ලෙස යටපත් වී ඇත (යෝග්‍යාකර්තා මූලධර්ම, 2007). මානව අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳව සැලකු කල, ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් රාජ්‍යය මට්ටමෙන්, රාජ්‍යය විසින් සහ රාජ්‍යයෙන් මුහුණපාන වෙනස්කොට සැලකීමක් ද පවතී.

ශ්‍රී ලංකාව තුළ රජය විසින් අනුබල දෙනු ලැබූ වෙනස්කොට සැලකීම් ප්‍රධානව පවතී. ඒ සමග සම්බන්ධිතව ඇති සංස්කෘතිකමය, ආගමික සහ සමාජයීය මත හේතුවෙන් එල් ජී බී ටී ප්‍රජාව දැඩි ලෙස අභියෝගවලට සහ වෙනස්කොට සැලකීම්වලට ලක්ව ඇත. මෙම පර්යේෂණය හරහා, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් තුලින් මානව හිමිකම් යටපත් වනවා යන්න ප්‍රකාශ කරනවා පමණක් නොව, එල් ජී බී ටී පුද්ගලයින්ගේ සැබෑ අයිතිවාසිකම් සහ ගරුත්වය නගාසිටුවීමට සියලුම ආකාරයන්ගේ වෙනස්කොට සැලකීම්, විශේෂයෙන්ම රජය විසින් අනුබල දෙනු ලබන වෙනස්කොට සැලකීම්, මර්දනය කළ යුතු බවද නිර්දේශ කරයි. එල් ජී බී ටී පුද්ගලයින්ව රජය විසින් ආරක්ෂා කළ යුතුව ඇති අතර ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් නොවී ඔවුන්ගේ මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ ලබාදිය යුතුය.

මෙම සාකච්ඡාවට අගයක් එකතු කළ හැකි අදාළතාවකින් යුතු එකම වදන් මාලාව එක්සත් ජාතීන්ගෙන් උපුටා ගත හැකි - 'නිදහසින් සහ සමානාත්මතාවයෙන් උපත ලැබ' යන ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙහි සඳහන් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ අයිතිය හා සම්බන්ධ වේ. අපට එහි ඇති අදාළතාව රඳා පවතින්නේ එය ජාත්‍යන්තරව පිළිගත් ලියවිල්ලක් යන රාමුව තුල පමණක් නොව, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වීම නිසා ජාත්‍යන්තර නීතිමය ප්‍රමිතීන් වලට (යෝග්‍යාකර්තා මූලධර්ම, 2007) එකඟ වීමට බැඳී ඇති රාමුවක් තුළ ද වේ. මෙම අධ්‍යයනය මගින් ඔප්පු කිරීමට බලාපොරොත්තු වන කරුණක් වන, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්වූ වෙනස්කොට සැලකීම් හරහා එල් ජී බී ටී පුද්ගලයින්ට තම මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති ඉඩකඩ අහුරනවා මෙන්ම මනුෂ්‍යයින් වශයෙන් ඔවුන් සතු මානව ගරුත්වය ද අහිමි කෙරෙනවා යන කරුණ, එම ලියවිල්ල හරහා ඉදිරිපත් කෙරේ. එහි සඳහන් වන පරිච්ඡේද කිහිපයක් ම ශ්‍රී ලාංකික සන්දර්භයට අදාළ කරගත හැකිය.

මෙම අධ්‍යයනයෙන් සනාථ කරන අයුරින්, එල් ජී බී ටී පුද්ගලයින්ව ආරක්ෂා කිරීමට පොලිසියට ඇති නොහැකියාව විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයේ 3 වන පරිච්ඡේදය උල්ලංඝනය කිරීමකි. එල් ජී බී ටී පුද්ගලයින් නිරන්තරයෙන් පොලිසිය මගින් වෙනස්කොට සැලකීම්වලට ලක්වන බවත්, රජය විසින් තමන්ව දැඩි ලෙස වෙනස්කොට සැලකීම් වලට ලක්කරනු ඇතැයි පවතින බිය නිසා ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලනික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ 9 වන පරිච්ඡේදය හරහා ප්‍රතිඥා දී ඇති පරිදි, තමන්ගේ ආරක්ෂාවට ඇති අයිතිය භුක්ති විඳීමට නොහැකි වන බවත් වර්තමාන පර්යේෂණ මගින් පෙන්නුම් කරයි.

සෞඛ්‍ය, අධ්‍යාපනය, නිවාස, රැකියා සහ ආරක්ෂාව භුක්ති විඳීමට සියලුම පුද්ගලයින්ට ඇති අයිතිය රජය විසින් සුරැකිය යුතු බව නිදහස්ව සහ සමානව උපන් යන එක්සත් ජාතීන්ගේ ලියවිල්ල හරහා ප්‍රකාශ කර ඇත. එනමුත්, එල් ජී බී ටී පුද්ගලයින්ට තම නිවාස හැරයාමට, වෛද්‍ය සේවා ලබාගැනීමට බියක් දැක්වීම හෝ ප්‍රතික්ෂේප කිරීම, හුදෙක්ම වෙනස්කොට සැලකීම නිසා තම රැකියා අහිමිවීම සහ අධ්‍යාපනයෙන් ඈත්කර තැබීම පමණක් නොව, මානව හිමිකම් උල්ලංඝනය වීමට ලක්වූ අයවලුන් ලෙස ඊට ප්‍රතිකර්ම ලබාදීමක් සිදු නොවන ශ්‍රී ලංකාව තුළ, එය සුරැකෙන්නේ නොමැති බව ද මෙම පර්යේෂණය පෙන්නුම් කරයි.

එල් ජී බී ටී ප්‍රජාවට එරෙහිව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳව සහ එය කොතරම් දුරකට පවතීද යන්න පිළිබඳව වටහා ගැනීමේ ඇති වැදගත්කම රඳාපවතින්නේ ඉන් සැලකිය යුතු ප්‍රජා කණ්ඩායමකට බලපෑම් සිදුවන බැවිනි. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් නිසා ඔවුන් අන්‍යයන්ගෙන් වෙනස්, නොපිළිගතයුතු පුද්ගලයින් ලෙස හංවඩු ගැසීමට ලක්වන අතර, එනිසා ඔවුන්ට බරපතල දුක් ගැහැටවලට මුහුණපෑමට සිදුව ඇත. මානව හිමිකම් කෙරෙහි වෙනස්කොට සැලකීම් ඇති කිරීමට හේතුවන තර්ජනයන් වටහාගැනීම තුලින් පිළිබිඹු වන්නේ රාජ්‍ය සහ සිවිල් මට්ටමින් ඇති ළල යුතුව ඇති වෙනසක සහ දියුණුවක අවශ්‍යතාවයයි.

# තෙවන පරිච්ඡේදය
## ක්‍රමවේදය

### 3. හැඳින්වීම

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදුකිරීමේදී භාවිතා කළ ක්‍රමවේදයන් පිළිබඳව මෙම පරිච්ඡේදය හරහා අදියරෙන් අදියර විස්තර කෙරෙනු ඇත. එමෙන්ම පර්යේෂණ ක්‍රියාවලියේ සියලුම අදියරයන් පිළිබඳව සවිස්තරාත්මකව පැහැදිලි කෙරෙනු ඇත.

*ප්‍රථම අදියර* මූලිකව ඉලක්ක කරගත්තේ අධ්‍යයනය ගොඩනැගීම පිළිබඳවයි. එනිසා, මෙම අදියර තුළින් අවධානය යොමු කරනු ලැබුවේ සාම්පල තෝරාගැනීම සිදුකරන්නේ කෙසේද යන්න හඳුනාගැනීමට සහ පර්යේෂණ මෙවලම් නිර්ණය කිරීමට හා නිර්මාණය කිරීමටයි.

*දෙවන අදියරේ* අරමුණ වූයේ ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා පර්යේෂණ කණ්ඩායමක් නිර්මාණය කිරීමයි. පළමුව ඊට යෝග්‍ය පුද්ගලයින්ව හඳුනාගැනීම හා පුහුණුකිරීම සිදුවූ අතර, ඉන් අනතුරුව පර්යේෂණ කණ්ඩායම සඳහා පුද්ගලයින්ව නිල වශයෙන් තෝරාගැනීම සිදු කරන ලදී.

*තෙවන අදියර* තුළින් මූලිකව අවධානය යොමු කළේ දත්ත රැස්කරගැනීම පිළිබඳවයි. මෙම අදියර තුළදී ඉලක්කගත පුද්ගලයින් සිටිනා ස්ථාන හඳුනාගැනීම සහ මුහුණට-මුහුණ සාකච්ඡා පැවැත්වීමත් සිදුකරන ලදී.

*සිව්වන අදියර* හරහා අවධානය යොමු කළේ දත්ත ග්‍රහණය කරගැනීමටයි. මෙම අදියර තුළදී, කලින් අදියරේදී රැස්කරගත් දත්ත පළමුව තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා පරීක්ෂාවට ලක්කළ අතර, ඉන්පසු, ඉන් සමත් වූ ප්‍රශ්නාවලි පමණක් එපි ඉන්ෆෝ 7 භාවිතයෙන් ග්‍රහණය කරගන්නා ලදී.

මෙම ක්‍රියාවලියේ අවසාන සහ *පස්වන අදියර* අරමුණු කරගත්තේ ග්‍රහණය කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සහ ඒ පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීම තුළින් අධ්‍යයන වාර්තාවක් සැකසීමටයි.

මෙම අධ්‍යයනයේ සියලුම අදියර පහත විස්තර කර ඇති ආකාරයේ ගැඹුරු ක්‍රියාවලියකින් සමන්විත විය.

### 3.1. ප්‍රථම අදියර

මෙම පර්යේෂණයේ පළමු අදියර තුළින් නියැදිය හඳුනාගැනීම හා තෝරාගැනීම මෙන්ම, පර්යේෂණ මෙවලම් හඳුනාගැනීම හා වැඩිදියුණු කිරීම වෙත අවධානය යොමු කරනු ලැබුවේය.

#### 3.1.1. නියැදි ලබාගැනීමේදී භාවිතාකළ තාක්ෂණය

මෙම පර්යේෂණය සිදුකිරීම හා සම්බන්ධ ප්‍රධානතම අභියෝගයක් වූයේ නියැදි තෝරාගැනීමේ ක්‍රියාවලිය යි. එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධයෙන් පවතින අවමන් සහගත සැලකීම් කොතරම් බහුලව පවතිනවාද යත්, එල් ජී බී ටී ප්‍රජාව පුළුල් ප්‍රජාවන් තුළදී තමන් එල් ජී බී ටී යනුවෙන් හඳුන්වාගනීමට කැමැත්තක් නොදක්වයි. තමන්ව වෙනස්කොට සැලකීමට භාජනය වනු ඇතැයි ඔවුන් බියක් දක්වන අතර, තමන්ගේ ලිංගික නැඹුරුතාවය පිළිබඳ දන්නා පිරිස අඩු වන තරමට, තමන් මොනම ආකාරයක හෝ වෙනස්කොට සැලකීමකට ලක්වීමට ඇති ඉඩකඩ අඩුබව ඔවුන් විශ්වාස කරයි. තවද, ශාරීරික ප්‍රහාරයන්ට ලක්වීමේ දැඩි අවධානමක් ඇති නිසාම, ඇතැම් ප්‍රජාවන් තුල එල් ජී බී ටී පුද්ගලයින්ගේ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම පවා නොකළ හැක්කක් බවට පත්ව ඇත (ඊක්වල් ග්‍රවුන්ඩ් හි යූ පී ආර් වාර්තාව, 2008).

මෙම අධ්‍යයනයට බලපාන සියලුම කරුණු පිළිබඳ පරීක්ෂාකාරීව සලකා බැලීමෙන් පසු, මේ සඳහා තෝරාගනු ලැබූ නියැදි ක්‍රමය වූයේ හිමබෝල නියැදි ක්‍රමයයි. මෙම නියැදි ලබාගැනීමේ ක්‍රමය හරහා වෙනත් ආකාරවලින් ළඟාවීමට නොහැකිව තිබූ පුද්ගලයින් කරා ළඟාවීමට හැකියාව ලැබිණි. අහඹු නොවන නියැදි තෝරාගැනීමට මුලපිරුවේ ඊක්වල් ග්‍රවුන්ඩ් විසින් අධ්‍යයනයට සහභාගී වීමට අහඹු ලෙස තෝරාගත්, දන්නා හඳුනන එල් ජී බී ටී පුද්ගලයින් 34 දෙනෙක් විසිනි. මෙම පුද්ගලයින් 34 දෙනා හඳුනාගැනීමෙන් පසුව, තවත් එල් ජී බී ටී පුද්ගලයින්ව මෙම අධ්‍යයනයට සහභාගීවීමට නිර්දේශ කිරීමට ඔවුන්ව දිරිමත් කරන ලදී.

### 3.1.2. නියැදි වල ප්‍රමාණය

දිවයිනේ වාසය කරන එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින්ගේ ගණන තවමත් නිල වශයෙන් ගණනය කර නොමැත. ප්‍රථමයෙන් ඊක්වල් ග්‍රවුන්ඩ් විසින් එල් ජී බී ටී පුද්ගලයින් 100 දෙනෙක්ගෙන් දත්ත රැස් කරගැනීමට සැලසුම් කර තිබිණ. තෝරාගත් නියැදි ලබාගැනීමේ ක්‍රමය සමග කටයුතු කිරීමෙන් අනතුරුව අනුරාධපුර, කළුතර, නුවරඑළිය, ගාල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්ක පහ නියෝජනය කරමින් එල් ජී බී ටී පුද්ගලයින් 135 දෙනෙක්ගෙන් දත්ත රැස් කරගන්නා ලදී. අනෙකුත් දිස්ත්‍රික්ක වෙනුවට මෙම දිස්ත්‍රික්ක පහ තෝරාගැනීමට හේතුවූයේ, ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය විසින් එම දිස්ත්‍රික්ක තුළ මනා සම්බන්ධතාවක් ගොඩනගාගෙන තිබීම යි. එනිසා, එම දිස්ත්‍රික්ක ඇතුළත මෙම පර්යේෂණය ආරක්ෂාකාරීව සිදුකිරීමට ඉඩකඩ ලැබුණි.

මෙම පර්යේෂණයට පුද්ගලයින් 135 දෙනෙකු සහභාගී වුවත්, තත්ත්ව පාලන අදියරේදී නියැදිවල ප්‍රමාණය අඩු කරන ලදී. තත්ත්ව පාලන ක්‍රියාවලිය විසින් අධ්‍යයනය සඳහා අනුමත කරනු ලැබුවේ 119 දෙනෙකු පමණි. එම ක්‍රියාවලිය පිළිබඳ පසුව විස්තර කෙරෙනු ඇත.

ලබාගත් නියැදි තුළින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ශ්‍රී ලංකාවේ භාෂා පසුබිම් තුනම නියෝජනය වේ. එමෙන්ම, මෙම අධ්‍යයනය හරහා නගර, ගම්, විශාල නගර හෝ වැවිලි වතු ප්‍රදේශ යන භූගෝලීය පරිසර හතරෙන්ම පුද්ගලයින් නියෝජනය වේ. මෙම වාර්තාවේ හතරවන පරිච්ඡේදයේදී නිදර්ශන නියැදියක් ආදර්ශනය කිරීම සඳහා අධ්‍යයනයේදී යොදාගත් ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු විස්තරකොට ඇත. මෙම හේතූන් නිසා ලබාගත් නියැදිවල ප්‍රමාණය ප්‍රමාණවත් වේ.

### 3.1.3. පර්යේෂණ මෙවලම්

මෙම පර්යේෂණ සඳහා සහභාගී වූ සියලුම සහභාගීවන්නන්ගේ නිර්නාමික බව තහවුරු කරන ආකාරයේ ප්‍රශ්නාවලියක් සකසන ලදී. මෙම ප්‍රශ්නාවලිය කොටස් 5 කට බෙදා ඇති අතර, ඇතැම් කොටස්වල ඊට අදාළ අනු කොටස්ද අඩංගු වේ. මෙම ප්‍රශ්නාවලියේ ඇති ප්‍රශ්නවලින් වැඩි කොටසක් නිශ්චිත පිළිතුරු ලබාදෙන ප්‍රශ්න වූ අතර ඒවාට උත්තර සැපයීම සඳහා තෝරාගැනීම් සපයාදී තිබිණ. කෙසේනමුත්, 3 වන සහ 5 වන කොටස්වල අවිනිශ්චිත පිළිතුරු ලැබෙන ආකාරයේ ප්‍රශ්න කිහිපයක් ද අඩංගු කර තිබුණි. සෑම ප්‍රශ්නාවලියකටම හඳුනාගැනීමේ අංකයක් ද ලබාදී තිබිණ.

"ඔබ පිළිබඳ තොරතුරු" යන මාතෘකාව යටතේ තිබූ ප්‍රශ්නාවලියේ පළමු කොටස වෙන්කොට තිබුණේ මෙම පර්යේෂණයට අදාල ජනවිකාශන තොරතුරු ලබාගැනීමටයි. එය ප්‍රතිචාර දක්වන්නන්ගේ; වයස, ජනවර්ගය, ආගම, ලිංගික දිශානතිය, සම්බන්ධතා පිළිබඳ තොරතුරු, ජීවන රටාව, විෂමරිසි නොවන සම්බන්ධතාවල කාලපරාසය, ජීවත්වන ප්‍රදේශය, වැටුප් මට්ටම, අධ්‍යාපනය, රැකියා නියුක්තිය පිළිබඳ තොරතුරු සහ ඔවුන් ලිංගිකව ක්‍රියාකාරීද නැත්ද යන කරුණු සම්බන්ධ ප්‍රශ්න 12කින් සමන්විත විය.

2 වන කොටස තවදුරටත් 2A කොටස, 2B කොටස සහ 2C කොටස ආදී අනුකොටස් වලට බෙදා ඇත.

ප්‍රශ්නාවලියේ 2A කොටස නම් කර ඇත්තේ, “වෙනත් පුද්ගලයින් අතින් මුහුණපා ඇති අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ ඔබගේ අත්දැකීම” ලෙසිනි. ප්‍රශ්නාවලියේ මෙම කොටසේ එකිනෙකට වෙන්වූ ප්‍රශ්න 8ක් ඇති අතර, එක් ප්‍රශ්නයක් කොටස් තුනකින් සමන්විත වේ. සමස්තයක් ලෙස ගත්කල එහි අඩංගු වන්නේ, ප්‍රතිචාර දක්වන්නන් පසුගිය අවුරුදු 2ක කාලය තුළදී අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට ලක්වූ පරිසර, ඔවුන්ට අවමන් සහගත සැලකුවේ කුමන පදනමක් මතද සහ එසේ කරනු ලැබුවේ කවුරුන් විසින්ද ආදී තොරතුරුයි. එමෙන්ම, පුද්ගලයින් තමන් පිළිබඳව ඕපාදූප කතාවෙන බව දැන සිටියාද සහ/ හෝ කිසිඳු ආකාරයක වාචික, කායික හෝ මානසික අපයෝජනයක් සිදුව ඇත්දයි යන්න පිළිබඳවද 2A කොටස මගින් න් ඇගයීමට ලක්කෙරේ.

“රැකියා, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය ලබාගැනීම” යනාදිය ඇතුලත් ප්‍රශ්නාවලියේ 2B කොටස සමන්විත වන්නේ නම්කළ වටපිටාවන් තුළදී සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ විස්තරයි. ප්‍රශ්න දහතුනකින් යුත් එම කොටසේ ඇතැම් ප්‍රශ්න අනුකොටස් 3 කින් සමන්විත වූ අතර, ඉන් ලබාගැනීමට ඉලක්ක කරන ලද්දේ රැකියාවේදී, අධ්‍යාපනයේදී සහ සෞඛ්‍ය සේවාවලදී බැහැරකිරීමට ලක්වීම සහ එසේ වීමට බලපෑ හේතූන් පිළිබඳ විස්තරයි. තවද, සහභාගීවන්නන් විසින් ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ විවිධ වූ පුද්ගලයින් සමග ඇතිකරගෙන තිබූ සාකච්ඡා පිළිබඳව තොරතුරු රැස්කිරීමේ අරමුණින් යුතු ප්‍රශ්න ද මෙම කොටසට ඇතුළත් විය.

අවසාන වශයෙන් 2 වන කොටසේ 2C කොටස මගින් අවධානය යොමු කරන ලද්දේ අභ්‍යන්තරික වෙන්කොට සැලකීම සහ බිය පිළිබඳවයි. “අභ්‍යන්තරික වෙන්කොට සැලකීම (ඔබට තමන් පිළිබඳව හැඟෙන ආකාරය) සහ ඔබගේ බිය” ලෙසින් නම්කර තිබූ ප්‍රශ්නාවලියේ මෙම කොටස හරහා රැස්කරගනු ලැබුවේ ප්‍රතිචාර දක්වන්නන් සතු බිය සහ මතගාහී තීරණ ගැනීම් පිළිබඳ තොරතුරුයි. මෙම කොටස ප්‍රධාන ප්‍රශ්න 3 කින් සමන්විත වූ නමුත්, ඔව් සහ නැහැ යනුවෙන් ප්‍රතිචාර දැක්වීමට ඉඩ සලසා තිබූ ප්‍රකාශන ගණනාවක්ද ඇතුළත් විය.

“වෙනසක් ඇතිකිරීම” යනුවෙන් නම්කර තිබූ 3 වන කොටස හරහා සාකච්ඡා කරන ලද්දේ , අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් සහාය ලබාගැනීමට එල් ජී බී ටී පුද්ගලයින් සතු හැකියාව, එල් ජී බී ටී පුද්ගලයින්ට බලපෑ හැකි නීතිය පිළිබඳ ඔවුන්ට ඇති දැනුම සහ අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට ඔවුන් විසින් ලබාදෙන සහයෝගය පිළිබඳවයි. මෙම කොටසේ ඇතුළත් මුළු ප්‍රශ්න සංඛ්‍යාව 9 ක් වන අතර, ඊට නිශ්චිතෝත්තර සහ අවිනිශ්චිතෝත්තර ප්‍රශ්න යන දෙවර්ගයම ඇතුළත් විය.

“අනන්‍යතා හෙළිකිරීම සහ රහස්‍යභාවය” යනුවෙන් නම්කර ඇති ප්‍රශ්නාවලියේ 4 වන කොටස, ප්‍රතිචාර දක්වන්නන්ට නිශ්චිත ප්‍රශ්න හතරක් යොමු කරයි. සහභාගීවන්නන්ගේ ජීවිතවල සිටිනා විවිධ පුද්ගලයින් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත්තේ කෙසේද, ඔවුන්ට තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෙළිකිරීමට පීඩනයක් එල්ල වන්නේද, කිසියම් වෘත්තිකයෙක් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳ රහස්‍යභාවය කඩකර ඇත්ද සහ අවසාන වශයෙන්, සහභාගීවන්නන්ගේ ලිංගික නැඹුරුතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනුවත් පුද්ගලයින් ඒ සම්බන්ධව දැක්වූ ප්‍රතිචාරය කුමක්ද යන කරුණු පිළිබඳව ඒ හරහා අවධානය යොමු කළේය.

ප්‍රශ්නාවලියේ අවසාන කොටස, එසේත් නැත්නම් 5වන කොටසේ, ඇතුළත් කර ඇත්තේ අවිනිශ්චිතෝත්තර ප්‍රශ්න දෙකක් පමණි. “ගැටළු සහ අභියෝග” ලෙස නම් කර ඇති ප්‍රශ්නාවලියේ මෙම කොටස මගින් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින්නේ; එල් ජී බී ටී පුද්ගලයකු වීම සහ කැපවුණු සබඳතාවක් පැවැත්වීම සම්බන්ධයෙන් පවතින ප්‍රධාන අභියෝග හා ගැටළු මොනාවද යන්න ඔවුන්ගේම වචනවලින් ප්‍රකාශ කරන ලෙසයි.

ප්‍රශ්නාවලිය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී පළමුවෙන්ම සිදුකරන ලද්දේ, එල් ජී බී ටී පුද්ගලයින් 15 දෙනෙක් උපයෝගී කරගෙන නියමු ප්‍රශ්නාවලියක් පිරවීමයි. ඉන් අනතුරුව, ඔවුන්ගේ ප්‍රතිචාර මත පදනම්ව ප්‍රශ්නාවලිය

වැඩිදුරටත් ගොඩනගා, අවසාන ප්‍රශ්නාවලිය සම්මත කරගන්නා ලදී. එය අවසාන වූ පසු, ප්‍රශ්නාවලිය ප්‍රධාන නිල භාෂා තුන වන සිංහල, දෙමල සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතිය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට ප්‍රථමයෙන් ප්‍රශ්නාවලිය අනුමත කරගැනීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම ප්‍රජා සාමාජිකයින් සහ වෙනත් ආකාරවලින් එල් ජී බී ටී ප්‍රජාවට සම්බන්ධ ගැටළු පිළිබඳ කටයුතු කරන සංවිධාන සමග උපදෙස් ලබාගැනීමේ සාකච්ඡාවක ද නියැලිණි.

### 3.1.3.1. පර්යේෂණ මෙවලම් සම්බන්ධ ඇති ගැටළු

ප්‍රශ්නාවලිය ගොඩනැගීම සම්බන්ධයෙන් පැනනැලුන ප්‍රධානතම ගැටළුවක් වන්නේ, අධ්‍යයනය කිරීම සඳහා එල් ජී බී ටී ප්‍රජාව පිළිබඳව සිදුකරන ලද කිසිදු අධ්‍යයන වාර්තාවක් නොමැති වීමයි. මාර්ගෝපදේශනය සඳහා යොදාගැනීමට තිබූ එකම අධ්‍යයන වාර්තාව වූයේ එච් අයි වී සමග ජීවත් වන පුද්ගලයින් (පී එල් එච් අයි වී) කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය පමණි. කෙසේනමුත්, එච් අයි වී සමග ජීවත් වන පුද්ගලයින් (පී එල් එච් අයි වී) කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය භාවිතා කිරීමේ ගැටලුවක් වූයේ, එය පාදක කරගෙන ප්‍රශ්නාවලිය ආකෘතිගත කළහොත්, එය දැඩි ලෙස එච් අයි වී පිළිබඳව අවධානය යොමු කරන ප්‍රශ්නාවලියක් වීමට ඇති හැකියාවයි. කෙසේනමුත් ඉතා සාවධානව සිතා බැලීමෙන් පසු, මෙම අධ්‍යයනයේ ඉලක්ක සහ අරමුණු වලට ළඟාවීමට අවශ්‍ය වන තොරතුරු රැස්කරගැනීමට යෝග්‍ය වන අයුරින් ප්‍රශ්නාවලියක් නිර්මාණය කර ගැනීමට පර්යේෂණ කණ්ඩායමට හැකිවිය.

ප්‍රශ්නාවලිය පළමුව ඉංග්‍රී භාෂාවෙන් නිර්මාණය කිරීමෙන් පසු, එය දෙමළ සහ සිංහල යන භාෂාවලට පරිවර්තන කිරීමේ අවශ්‍යතාවක් ඇතිවිය. මෙම අධ්‍යනයට අදාළ ඇතැම් වැදගත් පාරිභාෂික වදන්වලට සමාන වචන එකී භාෂා ද්විත්වයෙන් කිසිඳු භාෂාවක නොමැතිවීම නිසා මෙම ක්‍රියාවලියද අභියෝගාත්මක එකක් විය.

## 3.2. දෙවන අදියර: පර්යේෂණ කණ්ඩායම

පර්යේෂණ කණ්ඩායම ප්‍රධාන පර්යේෂකයින් දෙදෙනෙකුගෙන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් හෝ පර්යේෂණ සහායකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය. ප්‍රධාන පර්යේෂකයින් දෙදෙනා ව්‍යාපෘති මෙවලම්, ක්‍රමවේදය හා වාර්තාව ගොඩනැගීම සහ ව්‍යාපෘති ක්‍රියාවලිය මෙහෙයවීම ඇතුළු සමස්ත අධ්‍යයනය සිදුකිරීම සම්බන්ධව කටයුතු කළහ. දත්ත රැස්කිරීම සහ සහභාගීවන්නන් සමග ඍජුව කටයුතු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ අවධානය යොමු කරන ලද්දේ පර්යේෂණ සහායකයින් විසින්ය. කුඩා මනෝ උපදේශන සැසි පැවැත්වීම සහ වෙනත් සේවාවන් වෙත යොමුකිරීම් සිදුකිරීමද ඊට ඇතුළත් විය.

මෙම අධ්‍යයනයේ ස්වභාවය සැලකූ කල පර්යේෂණ සහායකයින් ; එල් ජී බී ටී ප්‍රජාවේ අයවලුන් වීම, එල් ජී බී ටී ප්‍රජාව සමග ඉතා ගැඹුරින් කටයුතු කර තිබීම, මනෝ උපදේශන සේවාවන් සැපයීමේ කුසලතා යම්තාක් දුරකට තිබීම සහ සහභාගීවන්නන් ජීවත්වන ප්‍රදේශයට නුදුරින් ජීවත් වීම ආදී අවශ්‍යතා සපුරාලිය යුතු විය. මෙම නිර්ණායක සැලකිල්ලට ගැනීමෙන් බලාපොරොත්තු වූයේ, එල් ජී බී ටී ප්‍රතිචාර දක්වන්නන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන අවස්ථාවන්හිදී ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධ කරුණු පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීමේ හැකියාවක් පර්යේෂණ සහායකයින්ට ඇති බව තහවුරු කරගැනීමයි. තවද, සහභාගීවන්නන්ට වේදනාකාරී අත්දැකීම් සම්බන්ධ කරුණු විස්තර කිරීමට සිදුවුවහොත්, ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදීමට ද ඉන් හැකියාව ලැබිණි. අධ්‍යයනයට සහභාගීවූවන්ට දැරීමට සිදුවන වියදම් අවම කිරීමේ අරමුණින්, ඔවුන්ට වඩාත් ආසන්න ප්‍රදේශ තුළ අධ්‍යයනයට අදාළ කටයුතු සිදුකළ අතර, ඔවුන්ට සහාය අවශ්‍ය විය හැකි ආකාරයේ වේදනාකාරී ගැටළු සාකච්ඡා කිරීමට සිදුවුවහොත් එහිදී සහාය දීමටද ඒ හරහා පර්යේෂණ සහායකයින් ට අවස්ථාව ලැබුණි.

සියලුම පර්යේෂණ සහායකයින් දෙදින පුහුණුවකට සහභාගී වූ අයවලුන් වේ. මෙම පුහුණුව ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය යන සංකල්ප පිළිබඳ සාකච්ඡාවලින් සමන්විත විය. සම්මුඛ සාකච්ඡා සිදුකිරීමේදී පැනනැගිය හැකි මනෝ උපදේශන ගැටළු පිළිබඳවද ඔවුන්ව පුහුණු කරනු ලැබුවේය. පර්යේෂණ

මාර්ග සූචකය පිළිබඳ මෙම වැඩමුළුවේදී විස්තර කරන ලද අතර, සමීක්ෂණ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිය පිළිබඳව පර්යේෂණ කණ්ඩායමට පැහැදිලි කිරීමද මෙහිදී සිදුවිය. පර්යේෂණ කණ්ඩායමේ පුද්ගලයින් පර්යේෂණය සම්බන්ධ කාර්යයන් සහ අවශ්‍ය දත්ත රැස්කිරීමේ කාර්යයන් සිදුකරන අයුරු මෙම පුහුණු සැසියේදී රඟපා පුහුණු විය.

### 3.2.1. පර්යේෂණ කණ්ඩායම තෝරාගැනීමේ ගැටළු

මෙම ක්‍රියාවලියේදී පැනනැගි ප්‍රධානතම අභියෝගය වූයේ අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති පර්යේෂණ සහායකයින් සොයා ගැනීමයි. ඇතැම් පර්යේෂණ සහායකයින් එල් ජී බී ටී ප්‍රජාව සමග දීර්ඝ ලෙස කටයුතු කර තිබුනත්, ඔවුන් තමන් එල් ජී බී ටී පුද්ගලයෙකු ලෙස ස්වයං හඳුනාගැනීමක් සිදුකළේ නැත. අවශ්‍ය සුදුසුකම් සම්බන්ධයෙන් සලකන විට මෙය අභියෝගකාරී වූවත්, මෙම ගණනය කරන්නන් සහ ඔවුන් සිදු කර ඇති කාර්යයන් පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් හොඳින් දැන සිටි බැවින්, එය දත්ත රැස්කරගැනීමට බලපෑවේ නැත.

### 3.2.2. රහස්‍යභාවය

සහභාගීවූවන්ගේ ආරක්ෂාව සඳහා ඉතා ඉහල මට්ටමක රහස්‍යභාවයක් පවත්වාගෙන යාමට ව්‍යාපෘති ප්‍රතිපත්ති සහ මාර්ගසූචකය තුළින් හැකියාව ලැබිණි. සම්මුඛ සාකච්ඡාවන් මෙහෙයවන්නන් සියලුදෙනාම මේ පිළිබඳව දෙදින වැඩමුළුවේදී දැනුවත් කරන ලදී. එහිදී රහස්‍යභාවය සම්බන්ධ ගැටළු පිළිබඳ සකච්ඡා කරන ලද අතර, පුද්ගලයින්ගෙන් ලබාගන්නා තොරතුරු ඉහළ සංවේදීතාවකින් මෙන්ම රහස්‍ය ස්වභාවයකින් ද යුත් බව අවධාරණය කරන ලදී. තවද, පර්යේෂණ කණ්ඩායමට ඇතුළත්වීමට ප්‍රථම, ප්‍රතිචාර දක්වන්නන්ගේ රහස්‍යභාවය සහ නිර්නාමිකභාවය සුරකින බවට එකඟ වීමට ද පර්යේෂණ සහායකයින් සිදුවිය.

සම්මුඛ සාකච්ඡාව පැවැත්වෙන අවස්ථාවේදී, ඊට සහභාගීවන්නන් සහ පර්යේෂණ සහායකයින් යන දෙපාර්ශවයම රහස්‍යභාවය පිළිබඳ වූ ගිවිසුමකට අත්සන් කළෝය.

## 3.3. තෙවන අදියර: දත්ත එක්රැස් කරගැනීම

මෙම නියමු සමීක්ෂණය සඳහා 2011 සිව්වැනි කාර්තුවේ සිට 2012 ජනවාරි මස දක්වා එල් ජී බී ටී පුද්ගලයින් **135** දෙනෙකුගෙන් පමණ දත්ත රැස්කරගනු ලැබුවේය.

### 3.3.1. ක්‍රමවේදය

අදාළ දත්ත රැස්කරගනු ලැබුවේ සාකච්ඡාවලට සහභාගීවූවන් සහ පර්යේෂණ සහායකයින් පමණක් සහභාගී වූ සම්මුඛ සාකච්ඡා හරහා ය. මෙහිදී ප්‍රථමයෙන්ම පර්යේෂණ සහායකයින් විසින් ප්‍රතිචාර දක්වන්නන්ට මෙම අධ්‍යයනයේ පරාසය සහ ස්වභාවය පිළිබඳව පැහැදිලි කරනු ලැබුවේය. එසේ කිරීමෙන් අනතුරුව, සාකච්ඡාවට සහභාගීවන්නන් අධ්‍යයනයට ද සහභාගී වීමට එකඟතාවය පළකළ යුතුය. වඩාත් අව්‍යාජ සහභාගීත්වයක් ඇතිබවට තහවුරු වූ පසු, රහස්‍යභාවය සම්බන්ධ කරුණු සාකච්ඡාවට ගනු ලැබුවේය. සාකච්ඡාවට සහභාගීවන්නා සම්මුති පත්‍රය කියවූ සහ ඔහුට කියවනු ලැබූ අතර, ඊට ගණනය කරන්නා සහ සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා යන දෙදෙනාම අත්සන් කරනු ලබයි. එම ලියවිල්ලට රහස්‍යභාවය මෙන්ම සම්මුතිය පිළිබඳ පැනනැගිය හැකි ගැටළුද ඇතුළත් විය.

ඉන් අනතුරුව, සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාට ප්‍රශ්නාවලිය ලබාදෙනු ලැබේ. ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කිරීම උදෙසා පර්යේෂණ සහායකයින් සහ ප්‍රතිචාර දක්වන්නන් එකට අසුන් ගැනීම සිදුවූ අතර, එමගින් ඔවුන්ට පර්යේෂණ සහායකයින් සටහන් කරගන්නා ප්‍රතිචාර මොනවාද යන්න දැකගත හැකිවිය. අවශ්‍යතාවක් ඇතිවූ අවස්ථාවලදී, මනෝ උපදේශන සේවාවන් සැපයීමට ද පර්යේෂණ සහායකයින්ට සිදු විය. වඩාත් බරපතල සිද්ධීන්වලදී, විශේෂඥ සහාය සඳහා යොමු කරනු ලැබීය. ඇතැම් අවස්ථාවලදී වෙනත් ආකාරවල සේවාවන් වෙත යොමුකිරීම් සිදුකිරීමට අවශ්‍ය වූ අතර ඒ සඳහා සහාය ලබාදීමද සිදුකරන ලදී.

### 3.3.2. දත්ත ග්‍රහණය කරගැනීම සම්බන්ධ ගැටළු

සාමාන්‍යයෙන් මුහුණට මුහුණට සිදු කරන අධ්‍යයනයවලදී පැනනගින ගැටළුවක් වන්නේ සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නන්ට තමන්ගේ ගැටළු පිළිබඳ අවංකවම සාකච්ඡා කිරීමට තරම් පහසුවක් නොදැනීම හේතුවෙන් ඇතිවන මතග්‍රාහී වාතාවරණයයි. වැටුප් මට්ටම්, ලිංගික දිශානතිය සහ අනෙකුත් ඒ හා සමාන කරුණු සම්බන්ධයෙන් මෙම කාරණය සත්‍ය සහ අදාළ වූවත්, බොහෝ අවස්ථාවලදී එය එසේ නොවීය. ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් ප්‍රශ්නාවලියේ අඩංගු ඇතැම් කරුණු සම්බන්ධයෙන් විවෘතව ප්‍රතිචාර දැක්වූයේ නොමැති බැවින් ඇතැම් ප්‍රශ්නාවලීන් ප්‍රතික්ෂේප විය. දත්ත ග්‍රහණය කිරීම විස්තර කරන කොටසේදී මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කෙරෙනු ඇත.

බොහෝ ප්‍රශ්න නිශ්චිතෝත්තර ප්‍රශ්න විය, කෙසේනමුත්, නිශ්චිතෝත්තර ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේදී සාකච්ඡාවට සහභාගීවූවන් ඉතා දීර්ඝ ලෙස කරුණු විස්තර කළෝය. ඒ හේතුවෙන් දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය දැඩි ලෙස කාලය වැයවන ක්‍රියාකාරකමක් විය.

## 3.4. සිව්වන අදියර

පර්යේෂණයේ මෙම අදියර ප්‍රධාන වශයෙන්ම සැලකිලිමත් වූයේ දත්ත ග්‍රහණය කිරීම පිළිබඳවයි. කෙසේනමුත්, දත්තවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ප්‍රථමයෙන් තත්ත්ව පාලන පරීක්ෂාවක්ද සිදු කරන ලදී.

### 3.4.1. තත්ත්ව පාලනය

දත්ත කිසිදු වෙනස්වීමකට හෝ මතග්‍රාහීත්වයකට ලක්වූයේ නොමැති බවට තහවුරු කිරීම සඳහා, ඉතා නොලිහිල් තත්ත්ව පාලන ක්‍රියාවලියක් අනුගමනය කරන ලදී. මෙම තත්ත්ව පාලන ක්‍රියාවලිය සිදුකරන ලද්දේ ස්වාධීන ඇගයීම් නිලධාරීන් 3 දෙනෙකු විසින් වන අතර, සුදුසුකම් ලැබූ ප්‍රශ්නාවලි තොගයකින් පමණක් විශ්ලේෂණය කිරීම සඳහා නියැදි ඉදිරිපත් කරන ලද බව ඉන් තහවුරු කරන ලදී.

තනි තනි ගණනය කරන්නන්ගෙන් ප්‍රශ්නාවලීන් එකතු කරගත් පසු, ඒවා තත්ත්ව පාලන ක්‍රියාවලිය සඳහා ලබාදෙන ලදී. මෙම ක්‍රියාවලිය සිදු කරනු ලැබුවේ පර්යේෂණ කණ්ඩායම විසින් අනුමත කරන ලද මාර්ගසූචකය අනුවයි. තත්ත්ව පාලන මාර්ගසූචකය උපග්‍රන්ථයේ ඇතුලත් කොටඇත. (A උපග්‍රන්ථය) නොලිහිල් තත්ත්ව පාලන ක්‍රියාවලිය නිසා ප්‍රශ්නාවලි 16 ක් ප්‍රතික්ෂේප වූ අතර, ප්‍රශ්නාවලි 119 ක් පමණක් අධ්‍යයනයට යොදා ගනු ලැබුවේය. එමනිසා n = 119 ලෙස සැලකේ.

### 3.4.2. දත්ත ග්‍රහණය කිරීම

තත්ත්ව පාලන ක්‍රියාවලිය තුළින් දත්තවල පූර්ණභාවය සහ නිවැරදිභාවය තහවුරු විය. එය නිවැරදිව පවත්වාගෙන යාම සඳහා දත්ත රැස්කිරීමේ මෙවලම ලෙස එපි ඉන්ෆෝ 7 තෝරාගනු ලැබුවේය. එම වැඩසටහන මයික්‍රොසොෆ්ට් ඔෆිස් එක්සෙල් 2010 සමග භාවිතා කරන ලදී.

එපි ඉන්ෆෝ 7 මගින් ලබාදී ඇති ද්විත්ව දත්ත ඇතුලත් කිරීමේ හැකියාව භාවිතයෙන් දත්තවල නොගැලපීම් හඳුනාගැනීමට හැකියාව ලැබුණි. ප්‍රශ්නාවලිය නිර්මාණය කරනු ලැබුවේ එපි ඉන්ෆෝ 7 භාවිතයෙන් වන අතර, දත්ත ඇතුළත් කිරීම සඳහා එක හා සමාන මුත්, වෙන් වෙන් දත්ත පත්‍රිකා දෙකක් ගබඩා කරන ලදී.

ප්‍රථමයෙන්ම, දත්ත ග්‍රහණය කරන පුද්ගලයින් දෙදෙනෙක් ඔවුන්ගේ තනි පුද්ගල එපි ඉන්ෆෝ දත්ත ගබඩාවට ප්‍රශ්නාවලි 119 ක් ආශ්‍රයෙන් ලබාගත් දත්ත ඇතුළත් කළෝය. ඉන්පසු නිවැරදිභාවය සඳහා වන පළමු පරීක්ෂණය සිදු කරන ලදී.

ඉන් අනතුරුව දත්තගබඩා ලිපිගොනු ද්විත්වය එකට එකතු කළ අතර, ලිපිගොනු දෙකෙහිම සාවද්‍යතාවයන් සොයාගත් බැවින් දත්ත කට්ටල ප්‍රතික්ෂේප කරන ලදී. ඉන් අනතුරුව, ග්‍රහණය කරන ලද දත්ත සාවද්‍යතාවයන් අඩංගු නොවන තුරු නැවත ඇතුළත් කරන ලදී. කෙසේනමුත්, දත්ත ද්විත්වයම සාර්ථකව ග්‍රහණය කරගැනීමට හැකිවී යැයි විශ්වාස කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින්, දත්ත මයික්‍රොසොෆ්ට් ඔෆිස් එක්සෙල් 2010 ට ඇතුලත් කර අවසාන පරීක්ෂාව සඳහා පිළියෙළ කරන ලදී.

පද්ධතිගත දත්ත තුළ තිබිය හැකි සාවද්‍යතාවයන් පරීක්ෂා කිරීමට තනි පරීක්ෂා 3ක් ද ඉදිරිපත් කරන ලදී. මෙහි අරමුණ වන්නේ, එපි ඉන්ෆෝ 7 දත්ත ගබඩාව තුල අඩංගු තොරතුරු සැබැවින්ම ප්‍රශ්නාවලි තුල අඩංගු දත්ත ඉදිරිපත් කරනවාදැයි තහවුරු කරගැනීමයි. එහෙයින්, සැබෑ ප්‍රශ්නාවලි සමග ඔෆිස් එක්සෙල් වෙතට යොමුකරන ලද දත්ත සසඳා බලන ලදී. පරීක්ෂා 3න්ම වාර්තා වූයේ, සැබෑ ප්‍රශ්නාවලි තුලින් දැක්වුණු දත්තම දත්ත ගබඩාව තුළිනුත් නිවැරදිව ඉදිරිපත් වී ඇති බවයි. ඉන්පසු එම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අනුමත කරන ලදී.

### 3.4.2.1. දත්ත ග්‍රහණය කිරීමේ වාසි

ප්‍රශ්නාවලිය නැවත සැලසුම් කිරීමෙන්, පර්යේෂණ සහායකයින් සතු ප්‍රමාදදෝෂ මගහැර ගුණාත්මකභාවයෙන් යුත් දත්ත ලබාගැනීමට හැකියාව ලැබේ. මනුෂ්‍ය ප්‍රමාද දෝෂ සැලකිල්ලට ගනිමින්, ප්‍රශ්නාවලියේ කොටස් කිහිපයක් තුළදීම සාකච්ඡාවට සහභාගීවන්නාට උපදෙස් ලබාදී තිබිණ. නමුත් ඇතැම් සහභාගීවන්නන් ඔවුන් විසින් පිළිතුරු සැපයිය නොයුතු කොටස් පවා ආවරණය කර තිබිණි. කෙසේ නමුත්, එපි ඉන්ෆෝ 7 හරහා ප්‍රශ්නාවලිය නැවත නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී, පිළිතුරු සැපයිය නොයුතු ප්‍රශ්න මගහැර යාමට පරීක්ෂා-ක්ෂේත්‍ර වැඩසටහන නිර්මාණය කලේය.

ඉහත සඳහන් කළ ආකාරයට, ද්විත්ව දත්ත ඇතුලත් කිරීම හරහා සැබෑ ප්‍රශ්නාවලියේ පිටපත් එලෙසම ඉදිරිපත් කිරීමට වැඩසටහන තුළින් ඉඩ ලැබිණ. මෙයත්, අනෙකුත් දත්ත ග්‍රහණ ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්ය පටිපාටීන් තුළින් දත්ත ග්‍රහණයේදී සිදුවිය හැකි මනුෂ්‍ය ප්‍රමාද දෝෂ මර්දනය කළ අතර, නිවැරදි දත්ත භාවිතය යන සරල උපක්‍රමයෙන් දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදී.

## 3.5. පස්වන අදියර: දත්ත විශ්ලේෂණය

ඉහත අදියර 1 සිට 4 දක්වා සම්පූර්ණ වූ පසු, පර්යේෂණ ක්‍රමවේදයේ ඊළඟ අදියර වන්නේ දත්ත විශ්ලේෂණයයි. දත්ත ප්‍රමාණාත්මක ස්වභාවයෙන් යුක්ත වන අතර, සංඛ්‍යාත්මකව වර්ගීකරණය කළ හැක. එසේම මෙම අධ්‍යයනය තුළ සීමාසහිත, ගුණාත්මක දත්ත ද ඇතුලත් වේ. ගුණාත්මක දත්ත ඉදිරිපත් කරනු ලබන්නේ මෙහි ඇතුළත් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීමේ සම්බන්ධ ගැටළු පිළිබඳ දැක්ම සවිස්තරාත්මකව ඉදිරිපත් කළයුතු කොටස්වලදී පමණි. සංඛ්‍යාත්මක දත්ත සම්බන්ධයෙන් ගත් කල, දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක සංඛ්‍යාන විද්‍යාත්මක ප්‍රවේශයක් භාවිත කරයි.

මෙහිදී භාවිතාකරන ලද ප්‍රධාන ක්‍රමය සුලබතා විශ්ලේෂණයයි. වගු සහ රේඛා සටහන් මගින් සුලබතාවන් පැහැදිලි කෙරේ.. එපමණක් නොව, හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය ද භාවිතා කෙරේ. මේ ආකාරයේ විශ්ලේෂණයක් තුලින් අධ්‍යයනය තුළදී හමුවන දත්ත භාණ්ඩ ද්විත්වයක් සංසන්දනය කිරීමේ හැකියාව ලැබේ. ඉන් විචලායයන්ගේ සංඛ්‍යානමය ස්වාධීනත්වය පිළිබඳ නිගමනවලට එළඹීමට සහාය ලැබේ.

### 3.5.1. දත්ත විශ්ලේෂණයේ සීමාවන්

**මෙම පර්යේෂණය හරහා සිදුකරන ලද සොයාගැනීම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන දත්ත රැසක් මෙම අධ්‍යයනය හරහා ලැබෙන අතර, දත්තවල ස්වභාවය නිසා සංඛ්‍යානමය විශ්ලේෂණයක් කිරීමේදී සීමාවන් ඇතිවේ. හරස්-වගුගත විශ්ලේෂණයක් සිදුකරන නමුත්, එය සිදුකරන්නේ විචල්‍යයන් අතර සම්බන්ධයක් ගොඩනැගීමට වඩා විචල්‍යයන් අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කිරීමටයි. විචල්‍යයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ඇති සම්බන්ධය, විශේෂයෙන්ම විචල්‍යයන් එකිනෙකින් ස්වාධීන ද නැතහොත් පරාධීන ද යන්න, විග්‍රහ කිරීමට භාවිතාකරනු ලබන කයි වර්ග පරීක්ෂාවට අදාළ වන කොන්දේසිවලට දත්ත අනුකූල නොවූ බැවින්, මෙම අධ්‍යයනය සිදුකිරීමේදී හරස්-වගුගත විශ්ලේෂණය සීමා කරන ලදී.**

**එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකය සඳහා අනුගමනය කරන ලද නොලිහිල් ක්‍රමවේදය පිළිබඳව මෙම පරිච්ඡේදය තුළින් ඉදිරිපත් කර ඇත.**

# සිවුවන පරිච්ඡේදය

## 4. ප්‍රතිඵල සහ සාකච්ඡාව

**ශ්‍රී ලංකාවේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් 119 දෙනෙකුගෙන් එක්රැස් කරගත් දත්ත පිළිබඳ අධ්‍යයනයේ මෙම කොටස තුළින් විශ්ලේෂණයක් සිදුකෙරෙනු ඇත. අධ්‍යයනයේ අරමුණු වෙත ළඟාවීමේ අරමුණින්, ප්‍රතිචාර දක්වන්නන්ට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලිය සම්පූර්ණ වශයෙන්ම විශ්ලේෂණය කර ඇත. සමස්තයක් ලෙස ගත් කල, මෙම පරිච්ඡේදය ඉලක්ක කරගන්නේ සමීක්ෂණයේ සොයාගැනීම් ඉදිරිපත් කිරීම මෙන්ම, ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාවට එරෙහිව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ අවබෝධයක් ඇතිකිරීම සඳහා ඉහත කී සොයාගැනීම් විශ්ලේෂණය කිරීමයි.**

**මනා පැහැදිලිතාවක් සඳහා ප්‍රශ්නාවලියේ ආකෘතියට ගැලපෙන අයුරින් එහි විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව ඉදිරිපත් කර ඇත්තේ වාර්තාව අධ්‍යයනය කරද්දී සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි.**

### 4.1. මෙම පර්යේෂණයේ අඩංගු තොරතුරු අර්ථකථනය කිරීම

**මෙම ව්‍යාපෘතියේදී භාවිතා කළ තත්ත්ව පාලන පරීක්ෂණයෙන් ප්‍රශ්නාවලි 119 ක් පමණ සමත් වූ අතර, පහත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීම වැදගත් වේ:**

- **දත්තවල නිවරදතාව: මෙම පර්යේෂණයේ ක්‍රමවේදය තුළින් පැහැදිලි කර ඇති ස්ථායී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද්දේ, ප්‍රශ්නාවලිය තුළ අඩංගු වූ දත්ත ම විශ්ලේෂණය කළ දත්ත හරහා ද ඉදිරිපත් වන බව සහතික කිරීමටයි.**

- **සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ සියලු දෙනාම සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයුවේ නැත, එනිසා,**

- **ප්‍රශ්නාවලියෙහි අඩංගු විවිධ ප්‍රශ්න විශ්ලේෂණය කිරීමේදී ලැබෙන මුළු එකතුව වෙනස් වනු ඇත.**

- **ප්‍රතිඵල මගින් හමුවන ‘ලබාගැනීමට නොහැකි වූ’ යන වදන අදාළ වන්නේ අවශ්‍ය තොරතුරු අඩංගු නොවූ ප්‍රශ්නාවලි ගණනට යි.**

## 4.2. ප්‍රජාවිද්‍යාත්මක දත්ත විශ්ලේෂණය

**වාර්තාවේ මෙම කොටස තුළ අඩංගු වන්නේ එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ දර්ශකයේ හමුවන නියැදිවල ලක්ෂණ පිළිබඳ දළ විශ්ලේෂණයකි. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ 119 දෙනාගේ ප්‍රජාවිද්‍යාත්මක ආකෘතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඒ හරහා සැපයේ. ප්‍රශ්නාවලියේ පළමු කොටස තුළ අඩංගුවූ දත්ත පිළිබඳ වාර්තාවක් ලබාදීම හරහා මූලිකවම බලාපොරොත්තු වන්නේ, මනා එල් ජී බී ටී ප්‍රජා නියෝජනයක් සිදුවූ බව තහවුරු කිරීමට නියැදි උපායමාර්ග හරහා ගන්නා ලද වෑයම නිරූපණය කිරීමයි.**

ප්‍රතිචාර දැක්වූවන්ගේ වයස්

වගුව 1: සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ වයස් ව්‍යාප්තිය

| වයස් | නියැදිය | ප්‍රතිශතය |
|---|---:|---:|
| අවු. 18 – 24 අතර වැඩිහිටි | 22 | 18.49% |
| අවු. 25 – 29 අතර වැඩිහිටි | 34 | 28.57% |
| අවු. 30 – 39 අතර වැඩිහිටි | 34 | 28.57% |
| අවු. 40 – 49 අතර වැඩිහිටි | 19 | 15.97% |
| අවු. 50ට වැඩි වැඩිහිටි | 10 | 8.40% |
| එකතුව | **119** | **100.00%** |

**ස්වකැමැත්ත පළකරන වැඩිහිටියන් දෙදෙනෙකු අතර සිදුවන සමරිසි සම්බන්ධතා හා ලිංගික ක්‍රියාකාරකම් අපරාධීකරණය කරන ශ්‍රී ලංකාවේ නීතිය එකම පනතක් යටතේ (ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය) පවතින බැවින්, මෙම පර්යේෂණයට සහභාගීවන්නේ ස්වකැමැත්ත පළකළ හැකි වයස්වල වැඩිහිටියන් පමණක් බව තහවුරු කිරීමට අතිශය සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලදී. එබැවින්, සම්මුඛ පරීක්ෂණයට සහභාගී කරගනු ලැබුවේ වයස අවුරුදු 18 ට වැඩි වැඩිහිටියන් පමණි.**

ජනවර්ගය

වගුව 2: ප්‍රතිචාර දැක්වූවන් අයත්වන ජනවර්ගවල ව්‍යාප්තිය

| ජනවර්ගය | නියැදිය | ප්‍රතිශතය |
|---|---:|---:|
| බර්ගර්/ යුරේශියානු | 4 | 3.36% |
| මැලේ | 1 | 0.84% |
| මිශ්‍ර/ වෙනත් | 10 | 8.40% |
| මුස්ලිම් | 17 | 14.29% |
| සිංහල | 79 | 66.39% |
| දෙමළ | 8 | 6.72% |
| එකතුව | **119** | **100.00%** |

2001 ජන සංගණන වාර්තාවලින් ඉදිරිපත් කෙරෙන ආකාරයට, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 73.8% ක් සිංහල, 7.2% ක් යෝනක, 8.5% ක් දමිළ වන අතර, ඉතිරි 10.5% විවිධ වූ නම්කළ සහ නම් නොකළ ජනවර්ග වලට අයත් වේ.

ලබාගත් නියැදි වලින් 66.39% ක් සිංහලත්, 6.72% ක් දමිළත් තවත් 12.6% ක් බර්ගර්/ යුරේශියානු, මැලේ සහ වෙනත් නම්කළ ජනවර්ගවලට අයත්වන බැවින්, ඉහත දත්ත අපක්ෂපාතී ස්වභාවයක් පෙන්නුම් කරයි. ලබාගත් නියැදිවලින් 14.29% ක් යෝනක වන අතර, එය දේශීය සංඛ්‍යාන වාර්තාවල ඇති දත්ත මෙන් දෙගුණයකට ආසන්න වීම අවධානයට ලක්වීමට තුඩුදිය හැක. කෙසේනමුත්, ප්‍රශ්නාවලි 16 ක් පමණ තත්ත්ව පරීක්ෂණය සමත් නොවූ බවත්, එසේ නොවුනේනම් ජනවාර්ගික අනුපාතය සමබර වනු ඇති බවත් සැලකිල්ලට ගත යුතුය.

ආශ්‍රිත ආගම්

වගුව 3: ප්‍රතිචාර දක්වන්නන්ගේ ආගම පිලිබඳ ව්‍යාප්තිය

| ආගම | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| බුද්ධාගම | 65 | 54.62% |
| ක්‍රිස්තියානි | 24 | 20.17% |
| හින්දු | 7 | 5.88% |
| ඉස්ලාම් | 18 | 15.13% |
| ඉහත කිසිවක් නොවේ | 4 | 3.36% |
| වෙනත් | 1 | 0.84% |
| එකතුව | **119** | **100.00%** |

බෞද්ධාගමික, ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දු යනුවෙන් දිවයිනේ ප්‍රධාන ආගමික කණ්ඩායම් හතරක් සිටී. 2001 වසරේ පළාත් ජන සංගණන දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 69.1% ක් බෞද්ධ ලෙසත්, 7.6% ක් මුස්ලිම් ලෙසත්, 7.1% ක් හින්දු ලෙසත්, 6.2 % ක් ක්‍රිස්තියානි ලෙසත් ඉතිරි 10% ස්ථිරව කිසිවක් ප්‍රකාශ නොකළ බවත් වාර්තා වේ.

ඉදිරිපත් කර ඇති දත්ත අනුව, සෑම ආගමික කණ්ඩායමකින්ම විශාල නියෝජනයක් පවතී. තවද, මූලිකව එම දත්ත අපක්ෂපාතී බව සැලකිය හැක. ක්‍රිස්තියානි සහ මුස්ලිම් පුද්ගල සංඛ්‍යාව ඉහළ මට්ටමක් ගැනීමට හේතුවී ඇත්තේ, මුස්ලිම් ජනගහනය මූලිකවම සෑදී ඇත්තේ මැලේ සහ යෝනක පිරිස් වල සංයෝජනයෙන් වීම සහ ක්‍රිස්තියානි ජනගහනය සෑදී ඇත්තේ මූලිකවම සිංහල, බර්ගර් සහ දෙමළ ජන පිරිස් වලින් වීමයි.

අධ්‍යාපනය

වගුව 4: ප්‍රතිචාර දැක්වූවන්ගේ අධ්‍යාපනික පසුබිම

| අධ්‍යාපනය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| ක්‍රමවත් අධ්‍යාපනයක් නොමැති | 2 | 1.68% |
| ප්‍රාථමික පාසැල් අධ්‍යාපනය | 15 | 12.61% |
| ද්විතීක පාසැල් අධ්‍යාපනය | 49 | 41.18% |
| තාක්ෂණික විද්‍යාලය හෝ විශ්වවිද්‍යාලය | 53 | 44.54% |
| එකතුව | **119** | **100.00%** |

**පර්යේෂණයට සම්බන්ධ වූ පුද්ගලයින් විවිධ වූ අධ්‍යාපනික පසුබිම් නියෝජනය කරන බව ඉහත වගුව නිරූපණය කරයි. ශ්‍රී ලාංකිකයින්ට තෘතියීක අධ්‍යාපනය පවා නොමිලයේ ලැබෙනා මුත්, සෑම ශ්‍රී ලාංකිකයෙක්ම තෘතියීක අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය ලබාගන්නේ නැත. විවිධ පුද්ගලයින් විවිධ වූ හේතූන් මත පාසැල් හැරයන බව පෙනීයයි. කෙසේනමුත්, ඉහත වගුවේ නිරූපණය වන තොරතුරු අනුව, පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන ප්‍රමාණයට වඩා පාසල හැර යන ප්‍රමාණය අඩු බව සිතිය හැකිය.**

රැකියා නියුක්තිය

වගුව 5: ප්‍රතිචාර දැක්වූවන්ගේ රැකියා තත්ත්වය පිළිබඳ ව්‍යාප්තිය

| රැකියා තත්ත්වය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| සේවා නියුක්තිකයෙක් ලෙස පූර්ණ-කාලීන රැකියා | 66 | 55.46% |
| සේවා නියුක්තිකයෙක් ලෙස අර්ධ-කාලීන රැකියා | 13 | 10.92% |
| පුහුණු රැකියා | 3 | 2.52% |
| පූර්ණ-කාලීන ස්වයං රැකියා | 14 | 11.76% |
| අර්ධ-කාලීන ස්වයං රැකියා හෝ ස්ථිර නොවන සේවක | 13 | 10.92% |
| රැකියාවක් නොමැති හෝ කිසිඳු රැකියාවක නොයෙදෙන | 9 | 7.56% |
| පඩි නොලබන ස්වෙච්ඡා සේවක | 1 | 0.84% |
| එකතුව | **119** | **100.00%** |

**රටක පුරවැසියන්ට රැකියා ලබාදීම තුළින් ඔවුන්ව ආර්ථික සංවර්ධනයට දායක කරගත හැකි බවත්, එසේ කිරීමෙන් රටකට නොනැසී පැවැත්මට හැකියාව ලැබෙන බවත් විශ්වාසයක් පවතී. එනිසා, මෙම අධ්‍යයනය තුළින් වඩ වඩාත් පුද්ගලයින් රැකියා නියුක්තියේ යෙදීමට දිරිමත් කරනු ඇති බව බලාපොරොත්තු වෙමු.**

**මෙම දත්ත නිරූපණයට අනුව, විවිධ වූ ආර්ථික පසුබිම් ඇති පුද්ගලයින් මෙම අධ්‍යයනයට සහභාගී වූ බව පෙන්නුම් කරයි.**

වාසස්ථාන පිහිටි ප්‍රදේශ

වගුව 6: ප්‍රතිචාර දැක්වූවන් වාසය කරන විවිධ ප්‍රදේශ පිළිබඳ ව්‍යාප්තිය

| ඔබ වාසය කරන ප්‍රදේශය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| විශාල නගර | 77 | 64.71% |
| වැවිලි වතු ප්‍රදේශ | 3 | 2.52% |
| ග්‍රාමීය ප්‍රදේශ/ ගම් | 20 | 16.81% |
| නගර | 19 | 15.97% |
| එකතුව | **119** | **100.00%** |

ප්‍රතිචාර දැක්වූවන් නියෝජනය කළේ දිස්ත්‍රික්ක 5 ක් පමණක් වූවත්, වෙනත් විවිධ වූ ප්‍රදේශ නියෝජනය කරමින් පුද්ගලයින් සහභාගී කරගැනීමට ද ප්‍රයත්න දරන ලදී. වඩා වැඩියෙන් බලාපොරොත්තු වූයේ විශාල නගර වලින් වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් සහභාගී කරගැනීමට යි. වැවිලි වතු ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශවල සිට බොහෝ ජනතාවක් දිවයින පුරා ඇති නගරවලට සංක්‍රමණය වන බව 2001 ජන සංගණන වාර්තා අනුව පෙන්නුම් කෙරේ.

ආදායම

වගුව 7: පසුගිය මාස 12 තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ආදායම

| පසුගිය මාස 12 තුළ ආදායම | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| රු. 10,000 ට අඩු | 16 | 13.45% |
| රු. 10,000 සිට 25,000 දක්වා | 30 | 25.21% |
| රු. 25,000 සිට 40,000 දක්වා | 24 | 20.17% |
| රු. 40,000 ට වැඩි | 49 | 41.18% |
| එකතුව | **119** | **100.00%** |

විවිධ ආර්ථික පසුබිම් සහිත පුද්ගලයින් මෙම සමීක්ෂණයට සහභාගී වූ බව ඉහත දත්ත නිරූපණය කරයි.

ලිංගික දිශානතිය

වගුව 8: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය

| ලිංගික දිශානතිය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| ද්විරිසි ස්ත්‍රී | 8 | 6.72% |
| ද්විරිසි පුරුෂ | 22 | 18.49% |
| සමරිසි පුරුෂ | 30 | 25.21% |
| සමරිසි ස්ත්‍රී | 34 | 28.57% |
| සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් | 22 | 18.49% |
| සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් | 3 | 2.52% |
| එකතුව | **119** | **100.00%** |

**පළමුව දත්ත මගින් ආවරණය කරගැනීමට බලාපොරොත්තු වුයේ ද්විරිසි (පුරුෂ සහ ස්ත්‍රී), සමරිසි පුරුෂ, සමරිසි ස්ත්‍රී, සංක්‍රාන්ති (සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික) යන එකිනෙකින් වෙනස් කණ්ඩායම් 4 න් පුද්ගලයින් 30 දෙනෙකු පමණි. දත්ත රැස්කරගැනීමේ දෝෂ තිබූ අතර, ඒවා මුල් අවස්ථාවේදීම හඳුනාගනු ලැබුවේ අමතර ප්‍රශ්නාවලි සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවක් ද මතු කරමිනි. මුළු ප්‍රශ්නාවලි 135 ක් සම්පූර්ණ කරනු ලැබුවේය. කෙසේනමුත්, ඉතා නොලිහිල් තත්ත්ව පාලන ක්‍රියාවලියෙන් සමත් වූයේ ඉන් 119 ක් පමණි. අවාසනාවකට මෙන්, සෑම කණ්ඩායමක්ම නියෝජනය කිරීමට තරම් ප්‍රශ්නාවලි සංඛ්‍යාවක් සම්පූර්ණ කරගැනීමට හැකියාවක් ලැබුනේ නැත.**

**කෙසේනමුත්, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 28.57% ක් සමරිසි ස්ත්‍රී ලෙසත්, 25.21% ක් සමරිසි පුරුෂ ලෙසත්, 25.21% ක් ද්විරිසි ලෙසත්, ඉතිරි ප්‍රමාණය සංක්‍රාන්ති සමාජභාවී ලෙසත් ඔවුන්ව හඳුනාගැනීම තුළ, දත්ත බොහෝදුරට සමබර ව්‍යාප්තියක් දක්වයි.**

සම්බන්ධතා පිළිබඳ තත්ත්වය

වගුව 9: ප්‍රතිචාර දක්වන්නන්ගේ සම්බන්ධතා පිළිබඳ තත්ත්වය

| සම්බන්ධතා පිළිබඳ තත්ත්වය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| කැපවූ සම්බන්ධතා | 48 | 40.34% |
| විෂමරිසි සම්බන්ධතා / විවාහ | 4 | 3.36% |
| විෂමරිසි සම්බන්ධතා / විවාහ සහ තවත් සමරිසි සම්බන්ධතා | 11 | 9.24% |
| විවෘත සම්බන්ධතා | 17 | 14.29% |
| තනි පුද්ගල (සම්බන්ධතා නොපවත්වන) | 39 | 32.77% |
| එකතුව | **119** | **100.00%** |

**විවිධ වූ පසුබිම්වල සම්බන්ධතා වල සිටිනා පුද්ගලයින්ගේ මනා නියෝජනයක් තිබූ බව මෙම දත්ත මගින් නිරූපණය කෙරේ.**

ජීවන තත්ත්වය

වගුව 10: විෂමරිසි නොවන සම්බන්ධතා සිටින බව ප්‍රකාශ කළ පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය

| විෂමරිසි නොවන සම්බන්ධතා සිටින පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| ඔබ සහ ඔබගේ සහකරු/ සහකාරිය එකට ජීවත් වේ | 23 | 30.26% |
| ඔබ සහ ඔබගේ සහකරු/ සහකාරිය එකට ජීවත් නොවේ | 53 | 69.74% |
| එකතුව | **76** | **100.00%** |

සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට ඔවුන් රිසි පරිදි සමලිංගයකට අයත් සහකරුවෙක් සමග ජීවත් වීමට නිදහස නොමැත. තදබල සමාජයීය, සංස්කෘතිකමය සහ ආර්ථිකමය සීමා පැවතීම හේතුවෙන්, බොහොමයක් පිරිස් ඔවුන්ට විරුද්ධ ලිංගික පුද්ගලයකුව විවාහ කරදෙන තුරු පවුල තුළ රැඳී සිටී. එවැනි ශ්‍රී ලාංකික සන්දර්භයක් තුළ, එකට ජීවත්වන සහ වෙන්ව ජීවත් වන පිරිස් අතර ඇති පරතරය සලකා බැලිය යුතුය. එසේම, මෙම වාර්තාව හරහා අවධානය යොමු කරන එකාකෘතිවලට සම්බන්ධ ආරක්ෂක ගැටළු, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ආදී කරුණු හේතුවෙන් එල් ජී බී ටී පුද්ගලයින්ගෙන් වැඩි කොටසක් ඔවුන්ගේ සමලිංගික සහකරුවා සමග ජීවත්නොවන බව ද අවධාරණය කළ යුතුය.

සමරිසි සබඳතාවල කාල පරාසය

වගුව 11: ප්‍රතිචාර දක්වන්නන් සිය සමරිසි සහකරුවන්/ සහකාරියන් සමග එකට ජීවත්වූ කාලපරාසය පිලිබඳ ව්‍යාප්තිය

| විෂමරිසි නොවන සබඳතාවයේ කාල පරාසය | නියැදිය | ප්‍රතිශතය |
|---|---|---|
| මාස 0 - 11 අතර | 13 | 17.11% |
| අවුරුදු 10 - 14 අතර | 6 | 7.89% |
| අවුරුදු 1 – 4 අතර | 33 | 43.42% |
| අවුරුදු 15 ට වැඩි | 9 | 11.84% |
| අවුරුදු 5 - 9 අතර | 15 | 19.74% |
| එකතුව | **76** | **100.00%** |

දත්ත ලබාගන්නා දිනය වනවිට සම්බන්ධතා නොපැවැත්වූ පුද්ගලයින්ව මෙම අධ්‍යයනයට සම්බන්ධ කරගනු ලැබූ නමුත්, ලිංගික සම්බන්ධතා නියැලී සිටි පුද්ගලයින්ද මෙහිදී සලකා බැලූ බව මෙම වගුගත වාර්තාව මගින් නිරූපණය කරයි.

විවිධ කණ්ඩායම් සහ පසුබිම් නියෝජනය කළ පුද්ගලයින් මෙම අධ්‍යයනයට සහභාගී වූ බව ඉහත දත්ත තුළින් නිරූපණය වේ. ඇතැම් කණ්ඩායම් තුළ බහුතර නියෝජනයක් පෙන්නුම් කරන අතර එය අවධානයට ගත යුතුය. එක් කණ්ඩායමකට වඩා තවත් කණ්ඩායමකට විශාල සමාජිකයින් ගණනක් අඩංගු වන අවස්ථා සාමාන්‍ය ශ්‍රී ලාංකික ජනගහනය කෙරෙන්ද නිරූපණය වන බැවින්, ඇතැම් කණ්ඩායම්වලට වඩා වෙනත් කණ්ඩායම් විශාලව නියෝජනය වී ඇතැයි යන කරුණ තුළින් මතග්‍රාහීත්වයක් අදහස් නොවේ.

## 4.3. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධ පෞද්ගලික අත්දැකීම්

අධ්‍යයනයේ මෙම කොටස හරහා අවධානය යොමු කරන්නේ ප්‍රතිචාර දක්වන්නන් සතු අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධ අත්දැකීම් පිළිබඳවයි. ඔවුන් ගොදුරු වී ඇති අභ්‍යන්තරකරණය වූ සහ බාහිරමය අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් යන කරුණු ද්විත්වය පිළිබඳවම මෙතුළින් අවධානය යොමු කරයි.

### 4.3.1. අනෙකුත් පුද්ගලයින්ගෙන් ඇතිවූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධ අත්දැකීම්

ප්‍රශ්නාවලියේ 2A කොටස ඉලක්ක කරගන්නේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති ලිංගික සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් විසින් විවිධ වූ පරිසර/ ස්ථාන වලදී අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් අත්දකින්නේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙම කොටස තුළින් සමාජ හමු, ආගමික ක්‍රියාකාරකම් සහ/ හෝ ස්ථාන සහ පවුලේ කටයුතු වලින් බැහැරකිරීම් ද සලකා බලන ලදී.

තවද, එල් ජී බී ටී පුද්ගලයින් එකී පරිසර/ ස්ථාන වලදී අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට මුහුණදෙන්නේ කෙසේද යන්න පිළිබඳවද 2A කොටස තුළින් ඇගයීමට ලක්කරනු ලබයි. තමන් පිළිබඳව ඕපාදූප කතා කරනු ලැබූ අවස්ථා, වාචික හිංසන, කායික හිංසන, චිත්තවේගාත්මක සහ මානසික අපයෝජන පිළිබඳව මෙන්ම, මුදල් වෙනුවෙන් තර්ජනය කිරීම් සහ පරිවාරණයේ ගොදුරු බවට පත්වීම් පිලිබඳව ද සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් විසින් තොරතුරු සපයන ලදී.

ප්‍රස්තාර සහ වගු ආශ්‍රයෙන් දත්ත නිරූපණය කිරීම සිදුකර ඇත. විචල්‍යයන් අතර ඇති සම්බන්ධතාව ඇගයීමේ කාර්ය සඳහා, හරස්-වගුගත විශ්ලේෂණය යොදාගෙන ඇත.


මෙම කොටසේ අතුළත් වගු අධ්‍යයනය කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය;

1- "ලිංගික" යනු, ලිංගික නැඹුරුතාවය මත පදනම් වූ බැහැරකිරීමයි,
2- "ස්ත්‍රී-පුරුෂ සමාජභාවය" යනු, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය මත පදනම්වූ කරුණුයි,
3- "ද්විත්වයම" යනු, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය යන දෙකම මත පදනම් වූ බැහැරකිරීමයි,
4- "වෙනත්" යන්නෙන් නිරූපණය වන්නේ අනෙකුත් හේතූන් නිසා බැහැරකිරීමයි,
5- "සියල්ල" යනුවෙන් හැඳින්වෙන්නේ ඉහත සඳහන් සියල්ලම මත පදනම්ව සිදුවන බැහැරකිරීමයි. එනම්, ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ වෙනත් හේතූන් මත සිදුවන බැහැරකිරීමයි.
6- "නිශ්චිත නැත" යන්නෙන් අදහස් කරන්නේ හේතුවක් නිශ්චිත නොමැති බවයි.

විචල්‍යයන් ඇතුළත්කර ඇත්තේ ප්‍රතිචාර දක්වන්නන් විසින් ඒවා තෝරාගනු ලැබූ අවස්ථාවල පමණක් බව කරුණාවෙන් සලකන්න. එනිසා, ඇතැම් වගුවල ඉහත විචල්‍යයන්ගෙන් කිහිපයක් නිරූපණය කෙරෙන අතර, අනෙකුත් ඒවා සියල්ලම අඩංගු වේ.

**සමාජ හමුවන්ගෙන්/ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම**

**රූපසටහන 1: පසුගිය අවුරුදු දෙක ඇතුළත, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය/ ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සමාජ හමු සහ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම**




**පසුගිය මාස 24 තුලදී විවාහ උත්සව, අවමංගල උත්සව, සාද සහ සමාජශාලා හමු වැනි සමාජ හමුවලින් සහ ක්‍රියාකාරකම්වලින් තමන්ව කී වරක් බැහැරකරනු ලැබුවේද යන්න පිලිබඳ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. සෑම ප්‍රදේශයක්ම (ගම්, නගර ආදී) නියෝජනය කළ ප්‍රතිචාර දක්වන්නන් විසින් එවැනි බැහැරකිරීම් සම්බන්ධ අත්දැකීම් ලබා තිබිණ. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බොහොමයක් දෙනා එවැනි බැහැරකිරීම වලට මුහුණ පා නොතිබූ අතර, 28.57% ක් පමණ එක්වරක් හෝ එවැනි අත්දැකීමකට මුහුණපා තිබිණ. තවත් 25.21% ක් එවැනි සිදුවීමවලට එක්වරකට වඩා මුහුණදී තිබිණ.. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ එක් අයකු එම ප්‍රශ්නයට පිළිතුරු දීමට අපොහොසත් විය.**

**වගුව 12: සමාජ ක්‍රියාකාරකම් සහ සමාජ හමුවන් වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපාන හේතුන් පිලිබඳ හරස් - වගුගත කිරීමේ විශ්ලේෂණය**


| | බැහැර කිරීමට හේතූන් | | | | | |
|---|---|---|---|---|---|---|
| බැහැර කිරීමේ වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියල්ල | එකතුව |
| කිහිප වතාවක් | 6 | 6 | 10 | 2 | 0 | 24 |
| නිතරම | 2 | 1 | 3 | 0 | 0 | 6 |
| එක් වරක් | 1 | 1 | 1 | 0 | 1 | 4 |
| එකතුව | **9** | **8** | **14** | **2** | **1** | **34** |

සමාජ හමුවලින් බැහැර කරනු ලැබූ පුද්ගලයින් 34 දෙනාගෙන්, 41.18% ක් ඊට මුහුණදී තිබුනේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය යන කරුණු දෙකම හේතු කොටගෙනයි. විශේෂයෙන්ම, 26.47% ක් වූ ප්‍රතිචාර දක්වන්නන් එවැනි බැහැරකිරීම්වලට මුහුණ දී තිබුනේ ඔවුන්ගේ ලිංගික දිශානතිය නිසා වන අතර, 23.53% ක් පමණ ඊට මුහුණදුන්නේ ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙනි. ප්‍රතිචාර දක්වන්නන් 34 දෙනාගෙන් තවත් 5.88% ක් පමණ දෙනා එවැනි බැහැරකිරීම් වලට මුහුණ පෑවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයට සම්බන්ධ හේතූන් නිසා නොවන අතර, ඉතිරි 2.94% දෙනා බැහැර කිරීමට මුහුණ පෑවේ ඔවුන්ගේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ට සම්බන්ධ වෙනත් හේතූන් නිසා වේ.

මෙම ප්‍රශ්නයට ලැබුණු ප්‍රතිචාර මගින් නිරූපණය වන පරිදි, සමස්ත ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 26.89% ක පමණ පිරිසක් පසුගිය අවුරුදු දෙක තුළදී ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්වූ මතග්‍රාහීත්වය නිසාම සමාජ හමුවල යෙදීම අඩුකර ඇත. මෙය එල් ජී බී ටී පුද්ගලයින් හුදකලාවීම වැඩිකිරීමට හේතුවන අතර, අනාගතයේදී ඔවුන් සමාජ හමුවලින් / සමාජ කටයුතුවලින් ඈත්වීමට ද බලපායි. ඒ හේතුවෙන්, පුද්ගලයින්ගේ පුද්ගල සංවර්ධනයට උදවුවන සාධකවලින් සාර්ථක වර්ධනයක් ඇති කරගැනීමට නොහැකි වේ.

ආගමික ස්ථානවලින් හෝ කටයුතුවලින් බැහැරකිරීම

රූපසටහන 2: පසුගිය අවුරුදු දෙක තුළදී ලිංගික නැඹුරුතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව ආගමික ක්‍රියාකාරකම්වලින් හෝ ආගමික ස්ථානවලින් බැහැරකරනු ලැබූ වාර ගණන




පසුගිය මාස 24 තුල ආගමික ස්ථානයකින් හෝ ක්‍රියාකාරකමකින් කිසිඳු ආකාරයක බැහැරකිරීමකට ලක්වී ඇත්දැයි යන්න ඇගයීම අරමුණු කොටගෙන යොමුකරන ලද ප්‍රශ්නයට දෙදෙනෙක් ප්‍රතිචාර දැක්වූයේ නැත. 100 දෙනෙක් පමණ පැවසුයේ පසුගිය මාස 24 තුල ඔවුන් එවැනි ස්වභාවයක අවමන් සහගත සැලකීමකට හෝ වෙනස්කොට සැලකීමකට ලක්වී නොමැති බවයි; ඒ සංඛ්‍යාව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 86.55% ක් පමණ වේ. ඉතිරි 11.76% ක් පමණ වන ප්‍රතිචාර දක්වන්නන් අවම වශයෙන් එක්වතාවක්වත් එවැනි ආකාරයක බැහැරකිරීමකට ලක්වී ඇති අතර, 10.08% ක් එක්වරකට වඩා එවැනි අවස්ථාවන්ට මුහුණ දී ඇත.

ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 4.2% ක් පමණ පසුගිය මාස 24 තුල එවැනි බැහැරකිරීම් වලට නිතර මුහුණදී ඇති බව පැවසීම සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි.

කිසිදු ආකාරයක ආගමික බැහැරකිරීම්වලට ලක්වී නොමැති ප්‍රතිචාර දක්වන්නන් විශාල ප්‍රමාණයක් සිටින අතර, එම කරුණ පාදක කොටගෙන, මෙය ශ්‍රී ලාංකික එල් ජී බී ටී පුද්ගලයින්ගේ ජීවිතවලට බලපාන ප්‍රමුඛ ගැටළුවක් බව පිළිනොගැනීම නොකල යුතුය. ආගමික පසුබිම් තුලින් එල්ලවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් හේතුවෙන්, මිනිසුන් තම ලිංගික නැඹුරුතාවය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය පිලිබඳ විවෘතව ජීවත් නොවන බව සැලකිල්ලට ගතයුතුය. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් අතිවිශාල ප්‍රමාණයක් ආගමික පසුබිම් තුලදී ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය පිලිබඳ හෙළිකර නොමැතිබව මෙම වාර්තාවේ පසුබාගයෙදී අවබෝධ වනු ඇත.

ආගම, පුද්ගලයින්ගේ ජීවිත තුළ ඉතා වැදගත් භූමිකාවක් දරයි. පුද්ගලයකුට තමන් සමාජයට අයත් අයකු බව හැඟීමක් ඒ හරහා ඇතිකෙරෙන අතර, පුද්ගලයින්ව ආගමික ක්‍රියාකාරකම්වලින් බැහැර කිරීම තුලින් සිදුවන්නේ ඔවුන් තුළ සමාජයට ඇතුලත් පුද්ගලයකුව සිටීමට ඇති අවශ්‍යතාව අඩපණ කිරීමයි.


වගුව 13: ආගමික ස්ථානවලින් සහ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපා ඇති හේතූන් පිලිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | බැහැරකිරීමට බලපෑ හේතූන් | | | |
|---|---|---|---|---|
| බැහැරකිරීමේ වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වය ම | එකතුව |
| කිහිපවරක් | 2 | 2 | 3 | 7 |
| නිතරම | 2 | 2 | 1 | 5 |
| එක් වරක් | 0 | 1 | 1 | 2 |
| එකතුව | **4** | **5** | **5** | **14** |

ආගමික ක්‍රියාකාරකම්වලින් තමන්ව බැහැර කරනු ලැබූ බව ප්‍රකාශ කළ මුළු පුද්ගලයින් 14 දෙනාගෙන්, 34.71% ක් මෙම බැහැරකිරීම ට මුහුණපෑවේ හුදෙක්ම ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙනි. තවත් 28.57% ක් දෙනා ආගමික ක්‍රියාකාරකම්වලින්/ ස්ථානවලින් බැහැර කිරීමට ලක්වූයේ ලිංගික දිශානතිය හේතුවෙන් වන අතර, ඉතිරි 35.71% ක් දෙනා බැහැරකිරීමට ලක්වූයේ ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය යන කරුණු දෙකම මත පදනම්ව යි. ආගමික බැහැරකිරීම් සිදුවන්නේ හුදෙක් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හා සම්බන්ධ වෙනස්කොට සැලකීම් මත පදනම්ව බව මෙම දත්ත මගින් අනාවරණය වේ. මෙවැනි ආකාරයේ බැහැර කිරීම් පුද්ගලයින්ගේ පුද්ගලිකත්වය සිඳ දමන අතර, කිසිදු මානුෂීය වටිනාකමක් ලැබීමට නුසුදුසු පුද්ගලයින් සේ සලකමින් අන්‍යයන්ගෙන් වෙන් කරයි.

පවුලේ කටයුතු වලින් බැහැරකිරීම

රූපසටහන 3: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව පවුලේ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් අතිමහත් බහුතරය විසින් කිසිඳු දිනක පවුලේ කටයුතුවලින් බැහැරකිරීමකට මුහුණපා නොමැත. කෙසේනමුත්, 21.85% ක් පමණ දෙනා අඩුම තරමින් එක්වරක් හෝ එසේ පවුලෙන් බැහැරකරනු ලැබ ඇති අතර, 3.36% ක් නිතර නිතර එවැනි බැහැරකිරීම්වලට ලක්ව ඇත. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 17.65% ක් පසුගිය මාස 24 තුළදී කිහිප වරක් පවුලේ කටයුතුවලින් බැහැරකිරීමට ලක්ව ඇති අයුරු සලකා බැලීමෙන් හැගී යන්නේ, පවුල් ඒකකය තුළ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පවතින ආකාරය සැලකිල්ලට භාජනය කළ යුතු බවයි.

වගුව 14: පවුලේ ක්‍රියාකාරකම් වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපෑ හේතූන් පිලිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | බැහැරකිරීමට බලපෑ හේතූන් | | | |
|---|---|---|---|---|
| බැහැරකිරීමේ වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | එකතුව |
| කිහිපවරක් | 3 | 12 | 6 | 21 |
| නිතරම | 0 | 2 | 2 | 4 |
| එක් වරක් | 0 | 1 | 0 | 1 |
| එකතුව | **3** | **15** | **8** | **26** |

පසුගිය අවුරුදු 2 තුළ පවුලේ කටයුතුවලින් බැහැරකරනු ලැබූ පුද්ගලයින් 26 දෙනෙකු අතරින්, 57.69% ක් වන බහුතරය එසේ බැහැරකිරීමට ලක්වී ඇත්තේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය හේතුවෙනි. ලිංගික නැඹුරුතාවය මත පදනම්ව පවුලේ කටයුතුවලින් බැහැරකර ඇති පිරිස 11.54% ක් පමණ වන අතර, ඉතිරි 30.77% බැහැරකිරීමට ලක්ව ඇත්තේ ලිංගික නැඹුරුතාවය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය යන කරුණු දෙකම මත පදනම්වයි.

ආහාර පිසීම, එකට ආහාර ගැනීම සහ අන්‍යයන් සමග එකම කාමරයේ නිදාගැනීම වැනි ඉතා මූලික පවුලේ කටයුතුවලින් පවා පුද්ගලයින්ව බැහැරකිරීම දැඩි ලෙස සැලකිල්ලට භාජනය කළයුතු වේ. පුද්ගලයින්


මුහුණදෙන එවැනි ආකාරයේ කොන්කිරීම් පවුල් ඒකකය බිඳවැටීමට හේතුවන අතර පුද්ගලයකුගේ අගය පිළිබඳව ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇති කරයි. පවුලෙන් වෙන්ව හුදකලාවීමට නැඹුරු වන, ඌකවරණයක් හෝ පවුලට අයිති බවක් නොදැනෙන පුද්ගලයින් ද මීට අයත් වේ.

### 4.3.1.1. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ප්‍රකාශ කිරීම

අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් විවිධ පරිසර තුළ සිදුවනවා මෙන්ම, විවිධ ආකාරවලින් ද සිදු වේ. පසුගිය මාස 24 තුළ ප්‍රතිචාර දක්වන්නන් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මුහුණපා ඇති ආකාර පිළිබඳව ප්‍රශ්නාවලියේ 2A කොටසේ අඩංගු වූ විශේෂිත ප්‍රශ්න හරහා විමසන ලදී.

**ඕපාදූප**

රූපසටහන 4 : පසුගිය මාස 24 තුළ තමන් පිළිබඳ ඕපාදූප කතාවීම පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් සතු අත්දැකීම්




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරය තමන් පිළිබඳ ඕපාදූප කතාවන බව දැනසිටි බව වාර්තා කළහ. පසුගිය අවුරුදු 2 ඇතුළත තමන් පිලිබඳව ඕපාදූප කතාවූ බව නොදැනුවත් බව වාර්තා කළේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 25.21% ක් පමණි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 74.79% ක් පමණ පසුගිය මාස 24ක කාලය තුළ තමන් පිළිබඳ ඕපාදූප කතාවන බව දැන සිටි බව වාර්තා කළ අතර, ඉන් 46.07% ක් නැවත නැවතත් මෙම අභියෝගයට මුහුණ දේ.

වගුව 15: ඕපාදූපවලට හේතුවූ හේතු සහ ඊට ලක්වන වාර ගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය


| | ඕපාදූපවලට හේතුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඕපාදූප වලට ලක්වන වාරගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියල්ලම | ස්ථිරවම නොදන්නා | එකතුව |
| කිහිපවරක් | 27 | 4 | 6 | 3 | 2 | 2 | **44** |
| නිතරම | 21 | 2 | 14 | 1 | 2 | 1 | **41** |
| එක් වරක් | 1 | 1 | 1 | 1 | 0 | 0 | **4** |
| එකතුව | **49** | **7** | **21** | **5** | **4** | **3** | **89** |

**තමන් ගැන ඕපාදූප පැතිර ඇති බව දැනසිටි බව පැවසූ පුද්ගලයින් 89 දෙනා අතුරින්, ඕපාදූප පැතිරුණේ තම ලිංගික දිශානතිය ඉලක්ක කරගෙන බව අතිමහත් බහුතරයක් දෙනා පැවසීය. මේ ගැටලුවට මුහුණපාන පිරිසගෙන්, ඒ පිරිස 55.06% ක් පමණ වේ.. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් තවත් 23.6% ක් ප්‍රකාශ කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය යන කරුණු දෙකම මත පදනම්ව ඕපාදූපවලට ලක්වූ බවයි. ඕපාදූප තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්වූ ඒවා බව ඔවුන්ගෙන් 7.87% ක් සඳහන් කළෝය. තමන් පිළිබඳ ඕපාදූප පැතිර යන බව ඇතැම් පුද්ගලයින් දැන සිටියත්, ඊට පාදක වූ හේතුව කුමක්ද යන්න පිළිබඳ නිශ්චිතව දැනසිටියේ නැත. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 5.62% ක පමණ පිරිසක් සඳහන් කළේ, තම ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය ට සම්බන්ධ නොමැති කරුණු මත පදනම්ව ඕපාදූප පැතිර තිබුණු බවයි.**

**ඕපාදූප පැතිරීම තුළින් නිරූපණය වන්නේ අනුමත නොකිරීම/ අප්‍රසාදය යි. එසේම, ඉන් පුද්ගලයින්ව අන්‍යන්ගෙන් ඈත්කිරීමට හැකියාවක් පවතී. තම ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය සමග බැඳුණු තවත් හේතූන් මත තමන් ගැන ඕපාදූප පැතිර ඇති බව දැනසිටි බව, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 4.5% ක් පමණ වාර්තා කිරීම සැලකිල්ලට ගත යුතු කරුණකි. එවැනි අවස්ථාවලදී, තමන් තමන්ව අයත් ප්‍රජාවට නොගැලපෙන බවක් පුද්ගලයින්ට හැඟීයයි. එමෙන්ම තමන් කණ්ඩායමක හෝ ප්‍රජාවක කොටසක් යන හැඟීම මින් දුර්වල වේ.**

වාචික අපහාස, හිංසන සහ/ හෝ තර්ජන

රූපසටහන 5: පසුගිය වසර දෙක තුළ වාචිකව අපහාසයට, හිංසනයට සහ/ හෝ තර්ජනයට ලක්වීම සම්බන්ධයෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ ප්‍රතිචාර




පසුගිය මාස 24 තුළ තමන් වාචික අපහාසවලට, හිංසනවලට සහ/ හෝ තර්ජනවලට ගොදුරු වී ඇත්දැයි ප්‍රශ්නාවලියේ 2A කොටසේ ප්‍රශ්න අංක 5a හරහා ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 62.18% ක් මේ ආකාරයේ හිංසනයන්ට ලක්ව තිබූ අතර, 37.82% ක් එවැනි අපයෝජනයන්ට, හිංසනයන්ට සහ/ හෝ තර්ජනයන්ට ලක්ව තිබුනේ නැත. පසුගිය මාස 24 තුළදී එවැනි හිංසනයන්ට ගොදුරු වී නොතිබුනත්, ඉහත පුද්ගල සංඛ්‍යාවම කිහිප විටක් එවැනි හිංසනයන්ට ලක්වූ බව පැවසීය. තවත් 13.45% ක් පමණ පසුගිය මාස 24ක කාලසීමාව තුළදී වාචික අපයෝජනයට, හිංසනයට සහ/ හෝ තර්ජනයට ලක්ව තිබූ බව වාර්තා කලෝය.

නැවත නැවතත් වාචික හිංසන සිදුවීම තුළින් ගෞරවය දැක්වීමේ අඩුකමක් නිරූපණය කරනවා මෙන්ම, පුද්ගලයින් තුල පවතින බිය වර්ධනය වීමක්ද සිදු වේ.

වගුව 16: ප්‍රතිචාර දක්වන්නන් මුහුණපා ඇති වාචික අපහාසකිරීම්, හිංසන සහ/ හෝ තර්ජන සහ එසේ කිරීමට බලපෑ හේතුන් පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | වාචික අපහාසකිරීම්, හිංසන සහ/ හෝ තර්ජනය කිරීම් වලට හේතුන් | | | | | |
|---|---|---|---|---|---|---|
| වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියලුම | එකතුව |
| කිහිපවරක් | 4 | 26 | 14 | 1 | 0 | **45** |
| නිතරම | 1 | 9 | 5 | 0 | 1 | **16** |
| එක් වරක් | 0 | 7 | 4 | 0 | 1 | **13** |
| එකතුව | **5** | **42** | **23** | **1** | **2** | **74** |


සමස්ත ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාවෙන් 74 ක් පමණ දෙනා තමන් වාචික අපහාසකිරීම්වලට, හිංසනයන්ට සහ/ හෝ තර්ජනවලට මුහුණපා ඇති බව සඳහන් කරන ලදී.

මින් බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් එවැනි අත්දැකීම්වලට ලක්වීමට හේතුව ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය හෝ, ඇතැම් අවස්ථාවලදී, එම කරුණු දෙකම වේ. මෙවැනි ආකාරවල අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට හුදෙක්ම ලිංගික දිශානතිය නිසා පමණක් මුහුණපෑ පුද්ගලයින් ප්‍රමාණය 6.76% ක් වේ. මුළුමනින්ම තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිසා එවැනි ආකාරයේ හිංසනයන්ගේ ගොදුරක් බවට පත්ව ඇති පිරිස 56.76% ක් පමණ වේ. වාචික අපහාසකිරීම්, හිංසන හෝ තර්ජන වලට මුහුණපෑ 74 ක් පමණ වන ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 31.08% ක් ඒවාට මුහුණ පා ඇත්තේ තමන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙනි.

2.7% ක් තම ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය ට සම්බන්ධ හේතු සහ වෙනත් හේතු මත වාචික අපහාසකිරීම්, හිංසන සහ/ හෝ තර්ජන වලට ලක්වී ඇත. එමගින් නිරූපණය වන්නේ වෙනස්කොට සැලකීම් ඉතා තදබල ලෙස පවතින බවයි. යම් පුද්ගලයෙක් නිතර නිතර එවැනි ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට ලක්වීම මගහැරිය දැමිය යුතු කරුණක් නොවන බවට මේවා සාක්ෂි සපයයි. ඇතැම් අවස්ථාවල වෙනස්කොට සැලකීමේ මට්ටම අධික වියහැකි අතර, පුද්ගලයාගෙන් පුද්ගලයාට එය වෙනස් ආකාරවලින් බලපෑ හැකි බවට මේ සාක්ෂි වේ.

කායික අපයෝජනය, හිංසනය, තර්ජනය, පහරදීම, දූෂණය කිරීම හෝ අඩන්තේට්ටම් කිරීම

රූපසටහන 6: පසුගිය වසර දෙක තුළ කායිකව අපයෝජනයට, හිංසනයට, තර්ජනයට, පහරදීමට සහ/ හෝ දූෂණයට හෝ අඩන්තේට්ටම්වලට ගොදුරුවීම පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ලබාදුන් ප්‍රතිචාර




පුද්ගලයින්ට එරෙහිව ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්, ඕපාදූප සහ හුදු අපහාසකිරීම් වලින් ඔබ්බට යන බව මෙම අධ්‍යයනය සමගින් අනාවරණය විය. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 63.03 %ක් පමණ කායික අපයෝජන, තර්ජන, පහරදීම්, දූෂණය කිරීම් සහ අඩන්තේට්ටම්වලට ලක්ව නොමැති බව සඳහන් කළ අතර, පසුගිය මාස 24ක කාලසීමාව තුළදී එවැනි හිංසනවල ගොදුරක් බවට පත්ව ඇති බව තවත් 36.97% ක් වාර්තා කළෝය. එවැනි ආකාරවල වෙනස්කොට සැලකීම්වල ගොදුරක් බවට පත්වූ පිරිසෙන් බහුතරයක් පසුගිය වසර 2 තුළ එවැනි සිදුවීම්වලට එක වරකට වඩා මුහුණ දී ඇත.

වගුව 17: කායික අපයෝජන, හිංසන, තර්ජන, පහරදීම්, දූෂණය කිරීම් සහ/ හෝ අඩම්තේට්ටම් කිරීමේ වාර ගණන සහ එසේ කිරීමට හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය


| | කායික වදහිංසාවට ලක්වීමට බලපෑ හේතූන් | | | | |
|---|---|---|---|---|---|
| වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | එකතුව |
| කිහිපවරක් | 1 | 11 | 7 | 0 | **19** |
| නිතරම | 0 | 5 | 2 | 0 | **7** |
| එක් වරක් | 0 | 6 | 9 | 3 | **18** |
| එකතුව | **1** | **22** | **18** | **3** | **44** |

තමන් කායිකව හිංසනයට ලක්වූ බව වාර්තා කළ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් හරියටම 50% ක් පමණ දෙනා එවැනි අත්දැකීම්වලට මුහුණ දී ඇත්තේ ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය හේතුවෙනි. තවත් 40.91% ක් දෙනා සඳහන් කලේ, ඔවුන් ඒ ආකාරයේ අත්දැකීම් ලැබුවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය යන කරුණු දෙකම නිසා බවයි. තමන් කායිකව හිංසනයට ගොදුරුවූයේ තමන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය ට සම්බන්ධතාවක් නොදක්වන හේතුවක් (හේතූන්) නිසා බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් වාර්තා කළහ.

කායික හිංසන සමග බැඳී ඇති බරපතලකම දැඩි සැලකිල්ලට භාජනය කළ යුතුයි. පසුගිය වසර 2 තුළදී කිසියම් ආකාරයක කායික හිංසනයකට ලක්වූ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් ඒවාට මුහුණ දී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය හේතු කොටගෙන ය. සමාජගත ස්ත්‍රී-පුරුෂ සමාජභාවී භූමිකා සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රකාශන සමාජය විසින් බලගන්වන බව සහ, වෙනස් අන්දමකින් හැසිරීමට හෝ වෙනස් වීමට උත්සාහ දරන අයවලුන්ට එරෙහිව තදින් ක්‍රියාත්මක වන බව මින් පෙන්නුම් කෙරේ. සිය ලිංගික දිශානතිය මත පදනම්ව කායික හිංසනයට ලක්වී ඇති බව සඳහන් කළේ එක් පුද්ගලයකු පමණක් වීම සන්දර්භීය වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රකාශනය පහසුවෙන් දෘශ්‍ය වුවත්, ලිංගික දිශානතිය එසේ නොවේ. මෙම විශ්ලේෂණය සමග ඉදිරියට යාමේදී, එකී කරුණු ලිංගිකදිශානතිය පිළිබඳ හෙළිකිරීම සමග සම්බන්ධ වනු ඇති අතර, තොරතුරු කුඩා සංඛ්‍යාවන්ගෙන් වාර්තා වූ පමණින් මෙම කරුණු මග නොහැරිය යුතු බව ඉන් වැටහේ.

චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පනය හෝ හිංසනය

රූපසටහන 7: පසුගිය මාස 24 තුළදී චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පන හෝ හිංසන වල ගොදුරු බවට පත්වීම පිළිබඳව ලැබූ ප්‍රතිචාර




පසුගිය මාස 14 ක කාලය තුළදී කිසියම් වූ ආකාරයක චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පනයකට හෝ හිංසනයකට ලක්වී ඇත්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. තමන් කිසිදු ආකාරයක චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පනයකට හෝ හිංසනයකට ලක්ව නොමැති බව සඳහන් කළේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 37.82% ක් පමණි. කෙසේනමුත්, සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගෙන් 62.81% ක් පසුගීය මාස 14 ක කාලය තුළ දී කිසියම් වූ ආකාරයක චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පනයකට හෝ හිංසනයකට ලක්ව තිබිණ. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 52.94% ක් පසුගිය වසර 2 තුළ එක්වරකට වඩා චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පනයකට හෝ හිංසනයකට ලක්ව තිබිණ; එය මුළු ප්‍රතිචාර දක්වන්නන්ගේ සංඛ්‍යාවෙන් අඩකටවත් වඩා වැඩිය.

වගුව 18: මානසික හෝ චිත්තවේගාත්මක කම්පන හෝ අපයෝජන අත්දැකීමේ වාර ගණන සහ ඒවාට බලපෑ හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | හේතූන් | | | | | |
|---|---|---|---|---|---|---|
| වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියලු | එකතුව |
| කිහිපවරක් | 4 | 14 | 11 | 3 | 2 | 34 |
| නිතරම | 0 | 18 | 9 | 2 | 0 | 29 |
| එක් වරක් | 2 | 3 | 3 | 2 | 1 | 11 |
| **එකතුව** | **6** | **35** | **23** | **7** | **3** | **74** |


චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පන හෝ හිංසන අත්දැකීම් කලින් සාකච්ඡා කරන ලද අනෙකුත් විවිධාකාරයේ හිංසනවලට ලක්වීම්වලට වඩා ඉහළ මට්ටමක් පෙන්නුම් කරයි. මෙවරත්, වැඩිම වශයෙන් මතුව

පෙනෙන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රකාශනය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හා සම්බන්ධ අත්දැකීම් ය; ප්‍රතිචාර දක්වන්නන් 74 දෙනෙකු මීට අදාළ වන අතර, ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 47.30% ක් පමණ වේ. ඔවුන්ගෙන් 31.08% ක් පමණ දෙනා හුදෙක්ම ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ/ හෝ ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය සම්බන්ධ හේතු නිසා මේ ආකාරයේ වෙනස්කොට සැලකීම්වල ගොදුරක් බවට පත් වී ඇත.

තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ/ හෝ ප්‍රකාශනය ට සම්බන්ධයක් නොමැති වෙනත් හේතූන් මත ද පුද්ගලයින් මේ ආකාරයේ හිංසනවලට මුහුණපාන බව ලැබී ඇති දත්ත මගින් පෙනී යයි. මෙම පුද්ගලයින්ගෙන් 85.14% ක්ම අඛණ්ඩ චිත්තවේගී සහ මානසික හිංසන සහ හිරිහැරවලට නැවත නැවතත් ලක්වීම, ඔවුන්ගේ ස්ව-බලය පිලිබඳ ඇති හැඟීම අභියෝගයට ලක්ව ඇති බවට සාක්ෂි ලෙස සැලකිය හැක. ඔවුන්ගේ ස්ව-බලය පිලිබඳ ඇති හැඟීම අඛණ්ඩව යටපත් කර ඇත.

ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය සහ/ හෝ පරිවාරණය කිරීම

රූපසටහන 8: පසුගිය වසර 2 ඇතුළත, ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය සහ/ හෝ පරිවාරණය කිරීම් අත්දැක ඇති වාර ගණන




ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය කිරීම සහ/ හෝ පරිවාරණය ට නැවත නැවතත් ලක්වී ඇත; ඔවුන්ගෙන් 31.93% ක් කිහිප වරක් එවැනි අත්දැකීම්වලට මුහුණපා ඇති අතර, 6.72% ක් ඊට නිතර මුහුණපාන බව පෙනී යයි. එසේම, ඔවුන්ගෙන් 53.78% ක් පමණ පිරිස පසුගිය මාස 24 තුළ ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය කිරීම් සහ/ හෝ පරිවාරණය කිරීම්වල ගොදුරක් බවට පත්ව නැත.

වගුව 19: මුදල් වෙනුවෙන් තර්ජනය කිරීම සහ/ හෝ අයුතු ලෙස පරිහරණය කිරීම සිදුවන වාරගණන සහ එසේ සිදුවන වාරගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | හේතූන් | | | | | |
|---|---|---|---|---|---|---|
| වාරගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියල්ලම | එකතුව |
| කිහිපවරක් | 3 | 22 | 11 | 0 | 2 | 38 |
| නිතරම | 2 | 5 | 1 | 0 | 0 | 8 |
| එක් වරක් | 1 | 6 | 1 | 1 | 0 | 9 |
| එකතුව | **6** | **33** | **13** | **1** | **2** | **55** |

ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය සහ/ හෝ පරිවාරණය කිරීම්වල ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ - ඒ හේතුවෙන් ඊට ලක්වූවන් තුළට භීතිය ඇතුල්වීම සහ ඇතැම් අවස්ථාවලදී, ඔවුන් සාමාන්‍යයෙන් හැසිරෙන ආකාරයට වඩා වෙනස් වූ ආකාරයකට හැසිරීම යි. ඉන් පුද්ගලයකුගේ තෝරාගැනීමේ නිදහස සහ ස්ව-බලය උදුරාගනු ලබයි. පුද්ගලයකුගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය ට සම්බන්ධ හේතූන් මත ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය කිරීම්වලට සහ/ හෝ පරිවාරණවලට ලක්වූවන් ප්‍රමාණය සමස්තයෙන් 60% ක් පමණ වේ. මේ ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට ලක්වූ පුද්ගලයින්ගෙන් තවත් 23.64% ක් පමණ ඊට මුහුණපා ඇත්තේ හුදෙක්ම ස්වකීය ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව ය. වෙනත් හේතූන් මත මේ ස්වභාවයේ හිංසනයන්ට ලක්වන පුද්ගලයින් ප්‍රමාණය අඩු ය. 10.91% ක් මේ ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට ලක්ව ඇත්තේ ඔවුන්ගේ ලිංගික දිශානතියට සම්බන්ධ හේතූන් නිසා පමණක් වේ.

නැවත නැවතත් ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය සහ/ හෝ පරිවාරණය කිරීම් සිදුකිරීම තුළින් පුද්ගලයින්ව මහත් සේ යටපත් කිරීමකට ලක්වේ.

### 4.3.1.2. එල් ජී බී ටී පුද්ගලයින්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම්වලට වගකිව යුතු පාර්ශවයන්

සමස්තයක් වශයෙන් ගත්කල, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් දෙනා වෙනස්කොට සැලකීමට මුහුණපා ඇත්තේ ඔවුන්ගේ පවුල්වලින්, මිතුරන්ගෙන් සහ අසල්වැසියන්ගෙනි. එසේම, සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ඔවුන්ගේ සේවා ස්ථානයේදී සගයින්ගෙන් සහ සේවා යෝජකයින්ගෙන් වැනි පාර්ශව වලින් එල්ලවූ වෙනස්කොට සැලකීම්වලටද ලක්ව ඇත. එල් ජී බී ටී පුද්ගලයින්ට හිංසනය කිරීමට පූජ්‍ය පක්ෂය ම මුල්වූ අවස්ථාද ඇත.


ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ ලිංගික සහකරුවන්ගෙන් අතින්ද අපයෝජනයට ලක්ව ඇත; බොහොමයක් අවස්ථාවලදී එසේ සිදුවඇත්තේ එක්ව ජීවත්වන සහකරුවන් අතර යි. මෙවන් පුද්ගලයින්ට කිසිදු ආකාරයක සහයක් නොලැබේ. එසේම, රජයේ නිලධාරීන්, ආරක්ෂක අංශ, නීති නිලධාරීන් සහ පොලිසිය ආදී පාර්ශවයන්ගෙන් එල්ලවී ඇති හිංසන පිළිබඳවද ප්‍රතිචාර දක්වන්නන් වාර්තා කර ඇත. නමුත්, එවැනි පුද්ගලයින්ගෙන් කිසිදු අයෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවට කිසිදු ප්‍රතිචාර දක්වන්නෙක් වාර්තා කර නොමැත. සමස්තයක් ලෙස, වාර්තාවේ මෙම කොටස තුළින් නිරූපණය වන්නේ භීතිය ඇතිවීමේ සහ පුද්ගල බලය අහිමිවීමේ මට්ටම යි. පුද්ගලයින්ගේ වටිනාකම සහ වගකීම හා යහපැවැත්ම පිළිබඳ ස්ව හැඟීම හීනවීමේ ස්වභාවයක් ද ඉන් අනාවරණය වේ.

### 4.3.2. රැකියා අවස්ථා, සෞඛ්‍ය සේවා, නිවාස සහ අධ්‍යාපන අවස්ථාවන් භුක්ති විඳීමේ අවස්ථා

සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති ලිංගික සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට පරිපූර්ණ ජීවිතයක් ළඟාකරගැනීම සඳහා ඇති අයිතිය, ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය කෙරෙහි සමාජයේ පවතින මතග්‍රාහීත්වය නිසා අභියෝගයට ලක්ව ඇත. ප්‍රශ්නාවලියේ 2B කොටස හරහා අවධානය යොමුකරන්නේ; තෘප්තිමත් වියහැකි රැකියා, ප්‍රමාණවත් නිවාස පහසුකම් සහ අවම තරමින් ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලබාගැනීම සම්බන්ධව පවතින පුද්ගල අයිතීන් උල්ලංඝනය වීම පිළිබඳ තොරතුරු ලබාගැනීම වෙතයි. එමෙන්ම, අවමන් සහගත සැලකීම් හරහා ඔවුන්ගේ පවුල් බලපෑමට ලක්ව ඇත්තේ කෙසේද සහ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධ ගැටළු විවෘතව සාකච්ඡා කිරීමට ඔවුන්ට ඇති හැකියාව දෙසට ඉන් අවධානය යොමු කරයි.

නිවාස පහසුකම් භුක්ති විඳීම

රූපසටහන 9: පසුගිය මාස 24 ක කාලසීමාව තුළ තමා වාසය කළ වාසස්ථානය වෙනස් කිරීමට සිදුවූ හෝ එම කාලය තුළදීම නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකිවූ ප්‍රතිචාර දක්වන්නන්




පසුගිය අවුරුදු දෙකක කාලය තුළ තම වාසස්ථානය වෙනස් කිරීමට සිදුවී හෝ නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකි වී ඇත්දැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගෙන් විමසන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 75.63% කට පසුගිය අවුරුදු දෙකක කාලය තුළ වාසස්ථානය වෙනස් කිරීමට අවශ්‍ය නොවී ඇති අතර, නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකි වී නොමැත. නමුත්, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 18.49 %කට පමණ දිගින් දිගටම තම වාසස්ථානය වෙනස් කිරීමට සිදුවී ඇති අතර, නවාතැනක් කුලියට ලබාගැනීමට ද නොහැකි වී ඇත. ඉතිරි 5.88% ට පසුගිය අවුරුදු 2 තුළදී එක්වරක් හෝ තම වාසස්ථානය වෙනස් කිරීමට සිදුවී හෝ නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකි වී ඇත.

වගුව 20: වාසස්ථානය වෙනස් කිරීමට හේතුව හෝ නවාතැනක් කුලියට ලබාගැනීමට ඇති නොහැකියාව සහ එම තත්ත්වයන්ට මුහුණදී ඇති වාරගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය


| | හේතූන් | | | | | |
|---|---|---|---|---|---|---|
| වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | සියල්ලම | එකතුව |
| කිහිපවරක් | 1 | 4 | 9 | 1 | 2 | 17 |
| නිතරම | 2 | 2 | 0 | 0 | 1 | 5 |
| එක් වරක් | 0 | 3 | 4 | 0 | 0 | 7 |
| එකතුව | **3** | **9** | **13** | **1** | **3** | **29** |

අවමන් සහගත සැලකීම සහ වෙනස්කොට සැලකීම නිසා මනා ජීවන තත්ත්වයක් ලබාගැනීමේ හැකියාව අභියෝගයට ලක්ව ඇත. තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ට සම්බන්ධයක් නොමැති හේතූන් නිසා තම වාසස්ථානය වෙනස් කිරීමට සිදුව හෝ නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකිව ඇති බව වාර්තා කළේ එක් පුද්ගලයකු පමණි. පසුගිය අවුරුදු 2ක කාලය තුළ හුදෙක්ම තම ලිංගික දිශානතිය නිසා නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකිවූ හෝ වාසස්ථානය වෙනස් කිරීමට සිදුවූ ප්‍රමාණය මුළු පුද්ගලයින් සංඛ්‍යාව වන 29 දෙනාගෙන් 10.34% කි. තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය නිසා බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රමාණය 31.03% ක් වන අතර, වෙනත් හේතූන් අතුරින් තම ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය නිසා බලපෑම් ඇතිවූ ප්‍රමාණය 10.34% කි.

මෙම පුද්ගලයින්ගෙන් 18.49% කට පමණ පසුගිය මාස 24 තුළ විටින් විට තම වාසස්ථානය වෙනස් කිරීමට සිදුවීම අවධානයට ලක්විය යුතු කරුණකි. ඉන් ඉහළ වෙනස්කොට සැලකීමේ සහ කොන්කිරීමේ මට්ටමක් පෙන්නුම් කරයි. තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය දන්නා, තම ආරක්ෂාව අභියෝගයට ලක්ව ඇති ස්ථානයක පුද්ගලයකුට නිදහසේ වාසය කිරීමට නොහැකි බව ඉන් ගම්‍ය වේ.

රැකියා අවස්ථාවන්ට ප්‍රවේශ වීම

රූපසටහන 10: පසුගිය අවුරුදු 2 තුළ රැකියා අහිමිවීම සම්බන්ධ අත්දැකීම්




සමස්ත ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 25.21% කට පමණ පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අවම වශයෙන් එක්වරක් හෝ තම රැකියාව අහිමි වී ඇත. වඩාත් සැලකිල්ලට ලක්විය යුතු කරුණක් වන්නේ, පසුගිය මාස 24ක කාලසීමාව තුළ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 15.97% කට පමණ තම රැකියාව නැවත නැවතත් අහිමිවී තිබීමයි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 74.79% ක් පසුගිය අවුරුදු 2 තුළ තම රැකියාව සුරක්ෂිත කරගැනීමට සමත්වීම සන්දර්භීය කළ යුතුය; ඔවුන්ගෙන් විශාල ප්‍රමාණයක් ස්වයං රැකියාවල යෙදී සිටී.

වගුව 21: ප්‍රතිචාර දක්වන්නන්ගේ රැකියා අහිමිවීමේ වාරගණන සහ ඊට බලපෑ හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

| | හේතූන් | | | | |
|---|---|---|---|---|---|
| වාරගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | වෙනත් | එකතුව |
| කිහිපවරක් | 2 | 4 | 3 | 0 | **9** |
| නිතරම | 6 | 1 | 4 | 0 | **11** |
| එක් වරක් | 1 | 4 | 4 | 1 | **10** |
| එකතුව | **9** | **9** | **11** | **1** | **30** |


මෙහිදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය පදනම් කොටගෙන හිරිහැරයට ලක්වූ පුද්ගලයින් ප්‍රමාණය 30% ක් බැගින් ගණනය කොට ඇත. පසුගිය අවුරුදු 2 තුළ තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයට/ ප්‍රකාශනයට සම්බන්ධ නොවූ හේතූන් නිසා තම රැකියාව අහිමිවූ බව වාර්තා කළේ එක් පුද්ගලයකු පමණි. සහභාගී වූ පුද්ගලයින් 30 දෙනාගෙන් ඉතිරි 36.67% ට තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ප්‍රකාශනය යන හේතූන් ද්විත්වයම හේතුවෙන් රැකියා අහිමි වී ඇත.

රූපසටහන 11: තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රකාශනයට/ අනන්‍යතාවයට සහ/ හෝ ලිංගික දිශානතිය සම්බන්ධ වූ හේතු නිසා පසුගිය අවුරුදු 2 ඇතුළත රැකියාව හෝ රැකියා අවස්ථා ප්‍රතික්ෂේප කරනු ලැබූ ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාව



පසුගිය අවුරුදු 2 ක කාලසීමාව තුළ රැකියා අවස්ථා වලින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්දැයි සමීක්ෂණයට සහභාගී වූ පුද්ගලයින්ගෙන් විමසන ලදී. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයුවේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 113 ක් පමණි. අතිවිශාල පුද්ගලයින් සංඛ්‍යාවක් මීට “නැහැ” යනුවෙන් පිළිතුරු සැපයූ නමුත්, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 21.85 %ක් පමණ සඳහන් කළේ හුදෙක්ම ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත පදනම්ව රැකියාවන් හෝ රැකියා අවස්ථා අහිමිව ඇති බවයි.

රූපසටහන 12: පසුගිය අවුරුදු 2 ක කාලසීමාව තුළදී ප්‍රතිචාර දක්වන්නන්ගේ රැකියාවේ වගකීම්, රැකියාවේ ස්වභාවය වෙනස්කිරීම සහ වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප කිරීම සිදුව ඇති වාර ගණන




වෘත්තීමය ලෝකය තුළ බහුතරයක් පුද්ගලයින්ගේ රැකියාවේ ස්වභාවය වෙනස් වනුයේ ඔවුන්ගේ හැකියාවන් අනුව වන නමුත්, ඇතැම් පුද්ගලයින්ට ඊට මුහුණදීමට සිදුවන්නේ හුදෙක්ම ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව යි. පසුගිය මාස 24 ඇතුළත තමන් වෘත්තීමය උසස්වීම් අහිමිවීම්වලට හෝ රැකියාවේ ස්වභාවය හෝ වගකීම් වෙනස්කිරීම්වලට මුහුණ දී ඇති බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 11.76% ක් විසින් සඳහන් කරන ලදී.

වගුව 22: වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප වීම් හෝ හේතු විරහිතව රැකියාවේ වගකීම් වෙනස්වීම් වලට මුහුණදීමට සිදුවූ ප්‍රතිචාර දක්වන්නන් පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය


| | හේතුන් | | | |
|---|---|---|---|---|
| වාර ගණන | ලිංගික | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | ද්විත්වයම | එකතුව |
| කිහිප වරක් | 2 | 3 | 3 | 8 |
| එක වරක් | 2 | 2 | 2 | 6 |
| එකතුව | 4 | 5 | 5 | 14 |

පසුගිය අවුරුදු 2 ඇතුළත සිය රැකියාවේ වගකීම් හෝ ස්වාභාවය වෙනස්වූ හෝ, වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප කරනු ලැබූ පුද්ගලයින් 14 දෙනාගෙන් 28.57% ක් පමණ ඊට මුහුණපෑවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හේතුවෙනි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 21.43% ක් පමණ දෙනා ස්ව රැකියාවේ වගකීම් හෝ ස්වාභාවය වෙනස්කිරීමට හෝ වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප කිරීමට මුහුණ පෑවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය යන සාධක දෙකම හේතුවෙනි.

මෙවැනි අසාධාරණ මතග්‍රාහීත්වයන් නිසා පුද්ගලයකුට වෘත්තීමය වශයෙන් විශිෂ්ටත්වයට පත්වීමට ඇති හැකියාවට බාධා ඇති වේ. ඉන් පුද්ගලයකුට ඔහුගේ පූර්ණ හැකියාවන් ට ළඟාවීමට ඇති හැකියාව ද අහිමි වේ. මතග්‍රාහීත්වය සහ අවමන් සහගත සැලකීම් නිසාම පුද්ගලයකුට තම ජීවිකාවට අවශ්‍ය සම්පත් උපායගැනීමට ඇති හැකියාව ඔවුන්ගෙන් උදුරාගෙන ඇති බව මෙහි ඉදිරිපත් කර ඇති දත්ත හරහා අනාවරණය වේ. එයම වෙනස්කොට සැලකීමකි. ඔවුන්ට ස්ව-බලය පිළිබඳ ඇති හැඟීම, ස්ව යහපැවැත්මට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ යහපැවැත්මට මූල්‍යමය වශයෙන් දායකවීමට ඇති හැකියාව, උග්‍ර ලෙස අභියෝගයට ලක්ව ඇත.

අධ්‍යාපන අවස්ථාවන්ට ප්‍රවේශවීම

රූපසටහන 13: පසුගිය මාස 24 ක කාලසීමාව තුළ හුදෙක්ම ප්‍රතිචාර දක්වන්නන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය සම්බන්ධ මතග්‍රාහීත්වයන් මත පදනම්ව අධ්‍යාපන ආයතනයකින් ඉවත් කිරීම, තාවකාලිකව තහනම් කිරීම හෝ පැමිණීමෙන් වැළැක්වීම පිළිබඳ සාක්ෂි





පසුගිය අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත ස්ව ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව අධ්‍යාපන ආයතනයකින් ඉවත් කිරීමට, තාවකාලිකව තහනම් කිරීමට හෝ පැමිණීමෙන් වැළැක්වීමට මුහුණපා ඇත්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. මෙම ප්‍රශ්නය බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන්ට සැලකිය යුතු මට්ටමකට අදාළ නොවීය. එම ප්‍රශ්නයට ප්‍රතිචාර දැක්වූ පුද්ගලයින් 20 දෙනාගෙන් 4.2% ක්, නිතරම මුහුණදී තිබූ අතර, 5.04% ක් එක්වරක් සහ 3.36% ක් කිහිපවතාවක් වශයෙන් ඊට මුහුණ දී තිබිණ. ප්‍රතිචාර දක්වන්නගෙන් ඉතිරි 4.2.% පසුගිය මාස 24 ක කාලසීමාව තුළ, ස්ව ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව අධ්‍යාපන ආයතනයකින් ඉවත් කිරීමට, තාවකාලිකව තහනම් කිරීමට හෝ පැමිණීමෙන් වැළැක්වීමට මුහුණදී තිබුණේ නොමැත.

මෙතුළින් පුද්ගලයෙකුට අධ්‍යාපනයට ඇති අයිතිය අහිමි වේ. වඩාත් අවධානය යොමුකළ යුතු කරුණක් වන්නේ, සියලුම පුරවැසියන්ට නොමිලේ අධ්‍යාපනය ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකාව පුරසාරම් නගන මුත්, මතග්‍රාහීත්වය හේතුකොට ගෙන ඇතැම් පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාගැනීමට නොහැකියාවක් පවතින බව පිළිගැනීමට අසමත් වී තිබීමයි.

**සෞඛ්‍ය පහසුකම් සහ සේවාවන්ට ප්‍රවේශවීම**

**රූපසටහන 14: පසුගිය අවුරුදු 2ක කාල සීමාව තුළ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතු කොටගෙන සෞඛ්‍ය සේවාවන් ප්‍රතික්ෂේප කිරීම**





ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය පිළිබඳ නොසලකා, සෞඛ්‍ය පහසුකම් සහ සේවා ලබාගැනීමේදී ඕනෑම පුද්ගලයකුට මුහුණපෑමට සිදුවන ඕනෑම ආකාරයක මතග්‍රාහීත්වයක් පිළිබඳ සාක්ෂි දැඩිලෙස සැලකිල්ලට ගත යුතුය. බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් පසුගිය අවුරුදු දෙක ඇතුළත සෞඛ්‍ය සේවා භුක්ති විඳීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කරනු ලැබුවේ නොමැති බව වාර්තා කළත්, කිහිප දෙනෙක් එවැනි සිද්ධීන්වලට මුහුණපා තිබීම නොසලකා හැරිය නොහැක. එක් පුද්ගලයෙකු විසින් වරින්වර සෞඛ්‍ය සේවා ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට ලක්වීම පිළිබඳ වාර්තා කර තිබීම ඉන් විශේෂ වේ. හුදෙක්ම පුද්ගලයකු එල් ජී බී ටී ප්‍රජාවට අයත් බව හඳුනාගැනීම මත පදනම්ව ඔහුට සෞඛ්‍ය සේවා ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබීම මගින් පිළිබිඹු වන්නේ මිනිසුන්ගෙන් කොටසකට එරෙහිව සිදුවන මතග්‍රාහී සැලකීමයි. එනිසා, එවැනි සැළකීම්වලින් බලපෑමට ලක්වන්නේ එක් පුද්ගලයකු පමණක් නොවේ. කොන්කිරීමට සහ වෙනස්කොට සැලකීමට ලක්ව ඇති සමස්ත ප්‍රජාවකටම ඉන් බලපෑම් ඇති වේ, ඉන් ජීවිත අහිමිවීම පවා සිදුවිය හැක.

මිනිසුන්ට මූලික මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති අවස්ථාව පිළිබඳ වාර්තාවේ මෙම කොටස තුළින් වඩාත් යථාර්ථවාදී දැක්මක් සපයා ඇත. රැකියා, නිවාස, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා එල් ජී බී ටී ප්‍රජාවට ඇති අයිතිය ප්‍රත්‍යක්ෂ ලෙසම අභියෝගයට ලක්වී තිබේ. සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය සම්බන්ධ අභියෝග වලට වඩා රැකියා සහ නිවාස සම්බන්ධ අභියෝග අඩුවෙන් අත්දකින මුත්, රජයට මෙම අංශ දෙක කෙරෙහිම සෘජු බලපෑම් කිරීමට හැකියාවක් ඇති හෙයින්, මෙම කරුණු දෙකම කෙරෙහි අවධානය යොමු කිරීම අතිශයින් වැදගත් වේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් කල, පුද්ගලයකු එල් ජී බී ටී බව දැනුවත් ව සිටින අවස්ථා 4 කින් 3 කදීම, අධ්‍යාපන ආයතනයකින් ඉවත් කිරීම, තාවකාලිකව තහනම් කිරීම හෝ පැමිණීමෙන් වැළැක්වීම සිදුකිරීමට හැකියාවක් ඇති බව දත්ත තුළින් අනාවරණය වේ.

එනිසා, පුද්ගලයින්ට තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ බොරු කිරීමට සිදු වේ. ඒ හේතුවෙන්, පුද්ගලයින්ට වංක වීමට ද අනුබලයක් ලැබේ.

#### 4.3.2.1. පවුල් වෙත එල්ලවන කොන්කිරීම් සහ වෙනස්කොට සැලකීම්


රූපසටහන 15: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් කිසියම් ආකාරයක අවමන් සහගත සැලකීමකට හෝ වෙනස්කොට සැලකීමකට ලක්වී ඇති ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පිළිබඳ ව්‍යාප්තිය




වෙන්කොට සහ වෙනස්කොට සැලකීම පැහැදිලි ලෙසම සෘජුව හෝ වක්‍රව බලපෑමට ලක්වී ඇති අයවලුන්ගේ පවුල්වලට බලපායි. පසුගිය මාස 24 තුළදී, ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා කිසිදු ආකාරයක වෙනස්කොට හෝ අවමන් සහගත සැලකීමකට මුහුණපා නොතිබුනේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 17.64% කගේ පවුල් සාමාජිකයින් පමණි. අනෙක් අතට, මෙම පවුල්වලින් අවමන් සහගත සැලකීම්වලට ලක්වී නොතිබුනේ 44.54% ක් පමණි. මෙම වෙනස්කොට සැලකීම විශේෂයෙන්ම හුදකලා කිරීම සහ සමාජයෙන් නෙරපා හැරීම හරහා ප්‍රකාශ වන අතර, සමරිසිභාවය ව්‍යාප්ත වීමට ඉඩ ඇති හෙයින් ඔවුන් සමග සමාගමය පැවැත්වීම අනුමත කළ නොහැකි බවට විශ්වාසක් පවතින බවත් ඉන් පිළිබිඹු වේ. තමන් පුළුල් ප්‍රජාවට අයත් යන හැඟීම සහ ඊට දායකවීමට ඇති හැකියාව අභියෝගයට ලක්වීම නිසා, පවුලේ එල් ජී බී ටී සාමාජිකයින් පවුලෙන් ඈත්කිරීමට පවුල් නැඹුරුවීමට ඊට හේතුවේ. පවුලේ සාමාජිකයින් වෙත එල්ලවන කායික සහ වාචික හිංසන තුළින් පවුල් ඒකකය යටපත් කර දමන අතර, ඔවුන්ගේ ස්ව-ශක්තිය අහිමි කිරීමක්ද සිදු කරයි.


**4.3.2.2. ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ සාකච්ඡා**

රූපසටහන 16: සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් පසුගිය අවුරුදු 2 ක කාලසීමාව තුළ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව කිසියම් ආකාරයක සාකච්ඡාවක යෙදී ඇත්දැයි යන්නට ලැබුණු ප්‍රතිචාර





ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ පසුගිය මාස 24 ක කාලය තුළ කිසියම් ආකාරයක සාකච්ඡාවක් සිදුකර ඇතිබව ප්‍රතිචාර දක්වන්නන් බහුතරයක් විසින් පවසන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක්, එකී සාකච්ඡාවන් පවත්වා තිබුණේ ඔවුන්ගේ සමරිසි සහකරුවා සමග යි. එසේම, බොහෝ පිරිසක් එවැනි සාකච්ඡා තම මිතුරන් සහ සෞඛ්‍ය සේවාවල සේවය කරන්නන් සමග ද පවත්වා ඇත. වැඩි දෙනෙක් පවුලේ සාමාජිකයින්, සේවා යෝජකයින් හෝ සගයින් සමග එවැනි සාකච්ඡා සිදුකර තිබුණේ නොමැති අතර, පූජ්‍ය පක්ෂය සමග එවැනි සංවාද පවත්වා තිබුනේ පුද්ගලයින් 5 දෙනෙකුටත් අඩු ප්‍රමාණයකි.

රූපසටහන 17: පසුගිය අවුරුදු 2 තුළ සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ කිසියම් වූ ප්‍රගතිශීලී සාකච්ඡාවක් සිදුකර ඇත්දැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ගෙන් විමසූ විට ඊට ලැබුණු ප්‍රතිචාර





පසුගිය මාස 24 තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය පිළිබඳව කිසිඳු ආකාරයක ප්‍රගතිශීලී සාකච්ඡාවක් සිදුකර ඇත්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් එසේ කර තිබුණි. කෙසේනමුත්, බහුතරයක් එවැනි සංවාද පවත්වා තිබුනේ තම සමරිසි සහකරුවා සහ සමීප මිතුරන් සමග ය. ඉතා කුඩා ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාවක් පමණක් සාකච්ඡා කර තිබුණේ ඔවුන්ගේ සගයින් සහ සේවා යෝජකයින් සමග යි. ඇතැම් පුද්ගලයින් තම ස්වාමිපුරුෂයා සමග හෝ බිරිඳ සමග සාකච්ඡා කර තිබූ අතර, අනෙකුත් පිරිස් එසේ සාකච්ඡා කර තිබුනේ සෞඛ්‍ය සේවා සපයන්නන් හා පවුලේ සාමාජිකයින් සමග වේ. ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් පූජ්‍ය පක්ෂය සමග ද සාකච්ඡා කළෝය.

රූපසටහන 18: පසුගිය මාස 24 තුළදී තම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධ කරුණු පිළිබඳ සෞඛ්‍ය සේවා සපයන්නන් සමග කිසියම් ආකාරයක ප්‍රගතිශීලී සාකච්චාවක් සිදුකර ඇත්දැයි යන්නට සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන් ලබාදුන් ප්‍රතිචාර





පසුගිය මාස 24 තුළදී සෞඛ්‍ය සේවා සපයන්නන් සමග තම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව කිසියම් ආකාරයක ප්‍රගතිශීලී සාකච්ඡාවක් සිදුකර ඇත්දැයි යන්න සඳහන් කරන ලෙස ප්‍රතිචාර දක්වූවන්ගෙන් විමසන ලදී. ඉන් 28.57% කට එසේ කිරීමට හැකිවූ බව වාර්තා වීමෙන් නිරූපණය වන්නේ සෞඛ්‍ය සේවා සපයන්නන් මෙවැනි කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට කිසියම් මට්ටමක විවෘතභාවයක් සහ කැමැත්තක් දක්වන බවයි.

රූපසටහන 19: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය සේවා සපයන්නන් සමග සිදුකර ඇති සාකච්ඡාවලට ලැබූ ප්‍රතිචාර




පැහැදිලිවන වන ආකාරයට, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය වැනි වඩාත් සංවේදී කරුණු පිළිබඳව සෞඛ්‍ය සේවා සපයන්නන් සමග සාකච්ඡා කිරීමට හැකිවී ඇත්තේ අඩු පිරිසකට යි. ඉන් තවදුරටත් නිරූපණය වන්නේ මෙම ගැටළුව සම්බන්ධයෙන් පවතින වෙනස්කොට සැලකීම යි.

රූපසටහන 20: ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ මනෝ උපදේශකවරයකු හෝ සමාජ සේවකයකු සමග සිදුකර ඇති ඵලදායී සාකච්ඡා





පසුගිය අවුරුදු 2 තුළදී බහුතරයක් පුද්ගලයින් සිය ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව සමාජ සේවකයකු හෝ මනෝ උපදේශකවරයකු සමග හෝ සාකච්ඡා කර නොතිබූ මුත්, 31.93% ක ප්‍රමාණයක් එසේ සිදුකර තිබුණි.

රූපසටහන 21: පසුගිය අවුරුදු 2 තුළ මනෝ උපදේශකයකු සමග හෝ සමාජ සේවකයකු සමග ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ප්‍රගතිශීලී සාකච්ඡාවක් පවත්වා ඇත්ද යන්නට සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන් ලබාදුන් ප්‍රතිචාර




පසුගිය මාස 24 ක කාලය ඇතුළතදී මනෝ උපදේශකයකු සමග හෝ සමාජ සේවකයකු සමග ස්ව ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ප්‍රගතිශීලී සාකච්ඡාවක් පවත්වා ඇති පුද්ගලයින් සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමක පවතී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 40.34% ක් පමණ එවැනි ආකාරයේ අත්දැකීම් ලබා තිබීම තුළින් පෙනී යන්නේ, සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් ගේ පාර්ශවයෙන්ද යම් ආකාරයක උද්යෝගයක් ඇති බවයි.


රූපසටහන 22: පසුගිය අවුරුදු 2 තුළ මෙවැනි ආකාරයේ සාකච්ඡාවන් පවත්වා නොතිබීමට ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කළ හේතු



පසුගිය අවුරුදු 2 ඇතුළත ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් තම ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ/ හෝ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සාකච්ඡාවක් පවත්වා තිබුණේ නැත. ඊට විවිධ වූ හේතූන් බලපා තිබූ අතර, ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් එක හේතුවකට වඩා ඉදිරිපත් කරන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් අඩුම ප්‍රතිශතයක් නියෝජනය කළ පිරිසට මෙම සේවාවන් භාවිතා කිරීමට අවස්ථාව නොලැබිණ. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් දෙනා වාර්තා කළේ ඔවුන්ට රෝගයක් නොමැති බවයි. ඉන් අදහස් වන්නේ ඔවුන් ඉහත කී එක් පුද්ගලයකු සමග හෝ සම්බන්ධව සිටියා නම්, ඔවුන් ඒ පිළිබඳව සාකච්ඡාවක යෙදීමට කැමැත්ත දැක්වීමට අවස්ථාවක් ඇති බවයි.

අනෙක් අතට, ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් විශ්වාස කිරීම සම්බන්ධ ගැටළු ඇති බව පැවසීමෙන් පෙනෙන්නේ ඔවුන් එකී ආකාරයේ සාකච්ඡා පැවැත්වීමට අකමැත්තක් දක්වන බවයි. අවමන් සහගත සැලකීම් පුද්ගලයින්ට කොතරම් දුරට බලපානවාද යන්න මින් පෙන්නුම් කරයි. අනෙකුත් සියලුදෙනාම තමන්ට වෙනස්කොට සලකනු ඇතැයි ඔවුන්ට බියක් පවතී, එනිසා, ඔවුන් තම ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට පවා කැමැත්තක් නොදක්වයි.

රූපසටහන 23: සාකච්ඡා කිරීම් පිළිබඳ අත්දැකීම්




මෙවැනි ආකාරයේ සාකච්ඡා කිරීම් පිළිබඳව තම අත්දැකීම් විස්තර කිරීම සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට පිළිතුරු කිහිපයකින් යුතු තේරීමක් සිදුකිරීමට ඉඩ ලැබුණි. පසුගිය මාස 24 තුළදී, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් අවම වශයෙන් 19.33% ක්වත් තම ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ/ හෝ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ කිසියම් ආකාරයක සාකච්ඡාවක් පවත්වා ඇත. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයකට මෙම අත්දැකීම ධනාත්මක අත්දැකීමක් විය.

ප්‍රතිචාර දක්වන්නන් විසින් සෞඛ්‍ය සේවා නිලධාරීන්, සමාජ සේවකයින් සහ මනෝ උපදේශකයින් සමග පවත්වා ඇති සාකච්ඡා සම්බන්ධයෙන් ඇතැම් සෘණාත්මක කරුණු ද පවතී. සෞඛ්‍ය සේවා නිලධාරීන්, සමාජ සේවකයින් සහ මනෝ උපදේශකයින් ගෙන් සුළු පිරිසකට ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව මෙන්ම, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳවද මනා දැනුමක් නොතිබිණ. සමාජ සේවකයෙක් හෝ මනෝ උපදේශකයෙක් තමන්ට විරුද්ධතාවක් පෙන්වා ඇති බව වාර්තා කළේ එක් ප්‍රතිචාර දක්වන්නෙක් පමණක් වුවත්, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සාකච්ඡා කිරීමේදී, ඒ සම්බන්ධව නොසලකා නොහැරිය යුතුය. සාමාන්‍යයෙන් සමාජයේ ජීවත්වන ආදර්ශවත් පුද්ගලයින් ලෙසින් සලකන මනෝ උපදේශකයින් හෝ සමාජ සේවකයකයින් තුළින් මිනිසුන් දක්නට බලාපොරොත්තුවන විශ්වාස ද මෙවැනි ක්‍රියාවලින් කඩවේ.


### **4.3.3.** අභ්‍යන්තරකරණය වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්

අවමන් සහගත සැලකීම් සමාජගත වී ඇත්තේ ඊට ලක්වන පුද්ගලයින්ට නිරන්තරයෙන් පෞද්ගලික ගැටළු ඇතිවන ආකාරයකිනුයි. ප්‍රජාවේ බහුතරය සමග ගැලපීමට නොහැකිවීම පිළිබඳ සිතිවිලි හේතුවෙන්, ස්වයං-සැකය, වෙනස් පුද්ගලයකු ලෙස හැඟීම, වරදකාරී බවක් දැනීම සහ අනෙකුත් ආකාරයේ සෘණාත්මක හැඟීම් ඇතිවේ. ඇතැම් අවස්ථාවලදී ඔවුන් තමන් කෙරෙහිම හෝ තමන් සමග එකම මතයේ සිටින අනෙකුත් අය කෙරෙහි වෙනස්කොට සැලකීම් සිදුකිරීමට යොමු වන අතර, ඒ හරහා අවමන් සහගත සැලකීම් ඇතිවේ.

අධ්‍යනයේ මෙම කොටස තුළින් අවධානය යොමු කෙරෙන්නේ ප්‍රතිචාර දක්වන්නන් සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් මුහුණපා ඇති අභ්‍යන්තරකරණය වූ වෙන්කොට සැලකීම් හඳුනාගැනීම පිළිබඳවයි.


සෘණාත්මක හැඟීම් පිළිබඳ අත්දැකීම්

රූපසටහන 24: ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය මත පදනම්වූ සෘණාත්මක හැඟීම් පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 1




ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය යන කරුණු සමග බැඳී ඇති ඉහළ මට්ටමක අවමන් සහගත සැලකීම් හේතුවෙන් ලැජ්ජාවක් සහ අසාමාන්‍ය බවක් දැනෙනා අතිමහත් පුද්ගල සංඛ්‍යාව පුදුමයට කරුණක් නොවේ. තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව මහත් ලැජ්ජා සහගත හැඟීම් ඇති පුද්ගලයින් සංඛ්‍යාව ඉතා ඉහළ සංඛ්‍යාවක් වන අතර, ඔවුන්, මෙම අධ්‍යනයේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 45.38% ක් පමණ වේ. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ 119 දෙනෙකුගෙන් 32.77% කට තමන් අසාමාන්‍ය පුද්ගලයකු යැයි දැනී ඇත. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 25% කට ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හේතුවෙන් පවුකාරයින් ලෙස දැනී ඇති අතර, 7.56% කට පමණ තමන් රෝගයකින් පෙළෙන බව හැඟී ඇත.

රූපසටහන 25: ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය හේතුවෙන් සෘණාත්මක සිතිවිලි පහළවීම පිළිබඳ අත්දැකීම - ප්‍රස්තාරය 2




ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිසා සිදුවන අවමන් සහගත සැලකීම් හේතුවෙන්, පුද්ගලයින් තමන්ගේ චරිතය තුළ ඇති බව කියවෙන 'දෝෂය' මත පදනම්ව තමන්ටම දෝශාරෝපණය කරගනී. තමන්ගේ වෙනසක් ඇති බව විශ්වාස කරමින් තමන්ටම දෝශාරෝපණය කරගන්නා ප්‍රතිචාර දක්වන්නන් ප්‍රමාණය 30.25% ක් පමණ වේ. අන්‍යන්ට දෝෂාරෝපණය කරන්නන් පිරිස 18.49% ක් පමණ වේ. 41.18% කට පමණ පුද්ගලයින් පිරිසක් විශ්වාස කරන්නේ මෙය තමන්ගේ කර්මයේ ප්‍රතිඵලයක් ලෙසයි. බොහෝ ප්‍රතිචාර දක්වන්නන්ට තමන් එල් ජී බී ටී වීම පිළිබඳව වරදකාරී හැඟීමක් තිබිණ; එම පිරිස 36.61% ක් පමණ වේ.

රූපසටහන 26: ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ/ හෝ ලිංගික දිශානතිය නිසා සෘණාත්මක හැඟීම් ඇතිවීම පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 3





අවමන් සහගත සැලකීම් කෙතරම් මුල්බැස ගෙන ඇත්දැයි කියනවා නම්, එල් ජී බී ටී වීම හේතුවෙන් තමන්ට දඬුවම් ලැබිය යුතුයැයි ඇතැම් පුද්ගලයින්ට තේරුම් යයි.  සියදිවි නසාගැනීම පිළිබඳ සිතිවිලි සහිත පුද්ගලයින් සංඛ්‍යාව දැඩි ලෙස සැලකිල්ලට ගත යුතුය, එය 26.89% ක් පමණ වේ. සමරිසි පුද්ගලයකු සමග සබඳතාවයක් පවත්වාගෙන යාමට නම් තමන් විරුද්ධ ලිංගික පුද්ගලයකු බවට පත්විය යුතු යැයි 30.25% ක් පමණ ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාවක් විශ්වාස කරයි. ඉන් අවමන් සහගත සැලකීම් සහ වෙන්කොට සැලකීම් පිළිබඳ දැනටමත් අප දන්නා කරුණු සමග එකඟවීමේ අවශ්‍යතාවක් පෙන්වයි. එසේම, ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය කෙරෙහි පවත්නා අවමන් සහගත සැලකීම් හේතුවෙන් මිනිසුන්ගේ ආත්ම-සම්මානය දුර්වල වේ. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 32.77% කට පමණ පහල ආත්ම-සම්මානයක් ඇත.

සාමාන්‍යයෙන්, ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ විශ්වාස හෝ ආධ්‍යාත්මික ස්වභාවය සම්බන්ධයෙන් සෘණාත්මක සිතුවිලි ඇතිකරගනී. ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් තුළ පවුකාරී හැඟීමක් ඇතිවන අතර, ඔවුන්ගේ ලිංගික දිශානතිය කර්මය සමග සම්බන්ධතාවක් ඇති බව ඔවුන් විශ්වාස කරයි. ප්‍රතිචාර දක්වන්නන් ම වෙනස්කොට සැලකීමට නැඹුරු වන අතර, තමන්ට දඬුවම් ලැබිය යුතු යයිද ඔවුන් විශ්වාස කරයි. මින්, එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ශ්‍රී ලංකාව තුළ කෙතරම් මුල්බැසගෙන ඇත්දැයි පෙන්නුම් කෙරේ.

තනිකිරීම, මගහැරීම, වෙන්කිරීම, අනුකූලවීම සහ ප්‍රතිකාර කිරීම්/ සුවකිරීම්

අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සමග ගනුදෙනු කිරීමට මිනිසුන් විවිධ වූ වෙනස් ක්‍රම සොයාගැනීමට උත්සාහ කරයි. ඇතැමුන් සමාජයීය මත සමග එකඟ වීමට උත්සාහ කරන අතර, තවත් සමහරුන් තමන්ව අනුමත කරන වෙනත් පරිසරවලට සංක්‍රමණය වේ. ඇතැම් අවස්ථාවලදී මිනිසුන් තමන්ගේ සමරිසිභාවය හෝ සංක්‍රාන්ති සමාජභාවය සුවකරගැනීමට උත්සාහ කිරීම වැනි අන්තයන්ට යාමට ද පෙළඹේ. ඔවුන් එසේ කරන්නේ එම ලක්ෂණ සුව කිරීමට හැකි, එසේත් නැත්නම් ප්‍රතිකාර කළ හැකි රෝගයක් බව විශ්වාස කිරීම හේතුවෙනි.


රූපසටහන 27: පසුගිය අවුරුදු 2 තුළ ප්‍රතිචාර දක්වන්නන් විසින් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාව නිසා ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 1




ප්‍රතිචාර දක්වන්නන් විසින් අත්දකින ලදැයි යැයි වාර්තා කළ මට්ටමේ වෙනස්කොට සැලකීම් සැලකිල්ලට ගත් විට, ඉතා විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් තනිවීමට නැඹුරුවීම පුදුමයට පත්විය යුත්තක් නොවේ. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 28.57% ක් පමණ තම පවුලෙන් වෙන්ව තනිවීම දැඩි ලෙස සැලකිල්ලට ලක්විය යුතු කරුණකි. මිනිසුන් තම පවුලෙන් වෙන්ව තනිවීම අවධානයට යොමු විය යුත්තකි; මන්ද, ඉන් පුද්ගලයකුගේ අනන්‍යතාවය පිලිබඳව ඇති ස්ව-හැඟීම දැඩිලෙස අභියෝගයට ලක්වේ. සමාජ හමු හෝ උත්සවවලට සහභාගී වීමෙන් වැළකී සිටීමට තීරණය කර තිබූ 26.05% ක් පමණ වන ප්‍රතිචාර දක්වන්නන් තුළින් පෙනී යන්නේ, ප්‍රජාවක සාමාජියෙක් වීම පිළිබඳ ස්ව-හැඟීම දැඩි ලෙස අභියෝගයට ලක්වී ඇති බවයි.


ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 15.13% ක් පමණ ආගමික ස්ථානවලට යාමෙන් වැළකී සිටීමට තීරණය කර ඇති අතර, 4.2% ක් පමණ ස්ව-විශ්වාසය වෙනස් කිරීමට තීරණය කර ඇති බව ප්‍රකාශ කළහ. 8.4% ක් පමණ ප්‍රතිචාර දක්වන්නන් ප්‍රමාණයක්, සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සමග ගනුදෙනු කිරීමට ආධ්‍යාත්මික ප්‍රතිකාර සඳහා යොමු වී තිබිණ. ලිංගික දිශානතිය යනු රෝගයක්, සහ ඊට ප්‍රතිකාර කළ හැකි යැයි යන විශ්වාසය ඔවුන් තුළින් නිරූපණය විය.

රූපසටහන 28: පසුගිය අවුරුදු 2 තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය නිසා ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 2




පුද්ගලයින් විසින් මුහුණපා ඇති වෙනස්කොට සැලකීමේ බරපතලකම සහ සේවාස්ථානයේදී ඔවුන් සතු ස්ව-බලය අහිමිවීම හේතුවෙන් ඇතැම් පුද්ගලයින් අවසානයේදී සේවය කිරීම මුළුමනින්ම නවතා දැමීම සාමාන්‍ය දෙයක් නොවේ. මින් පෙනී යන්නේ මිනිසුන් එදිනෙදා ජීවිතයේදී මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් අඩුකරගැනීමේ අරමුණින්, දැඩි තීරණ පවා ගැනීමට සූදානම් බවයි. එපමණක් නොවේ, දිගටම අධ්‍යාපනය ලබාගැනීම නැවත්වීමට පවා මිනිසුන් තීරණය කරයි. රැකියාවන් හෝ වෘත්තීමය උසස්වීම් සඳහා අයදුම් නොකිරීමට තීරණය කර ඇති 10.08% ක් පමණ වන පිරිසෙන් පෙනී යන්නේ, මිනිසුන් තමන් කෙරෙහි අනවශ්‍ය අවධානයක් යොමු වීමට අකමැති බවයි. එමෙන්ම, පුද්ගලයින් මෙන්ම ඔවුන්ගේ හැකියාවන් ද නිශ්ශබ්ද කර ඇති බවද ඉන් හැඟේ.

රූපසටහන 29: පසුගිය අවුරුදු 2 තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය නිසා ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 3





තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිසා සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් හේතුවෙන් ඇතැම් මිනිසුන් සෞඛ්‍ය සේවා ලබාගැනීමට පවා පියවර නොගැනීමට කණගාටුවට කරුණකි. මින් නිරූපණය වන්නේ අවමන් සහගත සැලකීමේ සහ වෙනස්කොට සැලකීමේ භයානක ප්‍රතිඵල වන අතර, ප්‍රතිචාර දක්වන්නන් 119 දෙනාගෙන් 25.21% ක් පමණ සෞඛ්‍ය සේවා ලබා නොගැනීමට තීරණය කර තිබීම අනර්ථකාරී විය හෝ නොවිය හැක. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 5.04% ක් පමණ තම ලිංගික අනන්‍යතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සුවකරගැනීමේ ක්‍රම අනුගමනය කර තිබීම තුළින්, තමාව සුවකරගැනීමට හැකියාවක් ඇතැයි දරන මතය පිළිබඳ සාක්ෂි ලැබේ.

මනෝ උපදේශකයකු හෝ මනෝ වෛද්‍යවරයකු හමුවීමට පියවර ගෙන තිබූ 15.97% ක් පමණ වන ප්‍රතිචාර දක්වන්නන් පිරිස එසේකර ඇත්තේ ඔවුන් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් කළමනාකරණ කරගැනීමට ද, එසේත් නැත්නම් එල් ජී බී ටී පුද්ගලයකු වීමෙන් සුවවීමට හෝ ඊට ප්‍රතිකාර ලබාගැනීමටද යන්න අවබෝධ කරගැනීමට තවත් පර්යේෂණ සිදුකළ යුතුය.


අධික සංඛ්‍යාත වූ සංක්‍රමණික ජනතාව ඕනෑම රටකට තර්ජනයකි. සහභාගී වූවන්ගෙන් 26.05% ක් පමණ පසුගිය අවුරුදු 2 තුළදී නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීමට තීරණය කර ඇති අතර, 28.57% ක් පමණ විදේශ රටවල්වලට පවා සංක්‍රමණය වීමට තීරණය කොට තිබිණ. තමන්ගේම රට තුළදී තමන් අනවශ්‍ය පුද්ගලයකු බව දැනෙනා විට, තමන්ගේම ප්‍රජාව, පවුල සහ මිතුරන් හැරයාමට මිනිසුන්ට සිදු වීම අවාසනාවත තත්ත්වයකි. ඊටත් වඩා, එය රටේ සංවර්ධනය කෙරෙහි බලපාන අවාසනාවන්ත තත්ත්වයකි. මෙම සංක්‍රමණික තත්ත්වය ශ්‍රී ලංකාවේ බුද්ධි ගලනය වැනි ගැටළුවලට හේතු වන අතර, ආර්ථික සංවර්ධනයට සෘණාත්මකව බලපෑම් සිදුකිරීමට ද හැකියාවක් ඇත.

රූපසටහන 30: පසුගිය අවුරුදු 2 තුළ ප්‍රතිචාර දක්වන්නන් විසින් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 4




විවාහ වීමට හෝ නොවීමට තීරණය කිරීමට සිදුවීමේ බලපෑම් සෑම විටම පැහැදිලි නොමැත. එසේ කරන්නේ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණ දීමටද, එසේත් නැත්නම්, තමන්ගේ ස්ව මතයේ සිටීමට ද යන්න පිළිබඳව අවබෝධයක් ලබාගෙන නොමැත. නැවත වතාවක්, අවමන් සහගත සහ වෙනස්කොට සැලකීමෙන් පුද්ගලයකුගේ සෞඛ්‍ය කෙරෙහි බලපෑමට ඇති වන බවත්, ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 5.88% ක් පමණ ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය සේවා ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇති බවත් අවධාරණය කළ යුතුය.

රූපසටහන 31: පසුගිය අවුරුදු 2 තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 5





පසුගිය අවුරුදු දෙක ඇතුළතදී ඇතැම් පුද්ගලයින් සිය සබඳතාවලින් වෙන්වීමට හෝ දික්කසාද වීමට තීරණය කර ඇති බව සඳහන් කර ඇත. ඇතැම් පුද්ගලයින් ස්ව සමරිසි සහකරුවාවෙන් වෙන්වීමට තීරණය කර තිබූ අතර, ඇතැමුන් ලිංගිකව හැසිරීම නවතා ඇත.

මන්ද, බොහෝ අවස්ථාවලදී සමරිසිභාවය ලිංගික ක්‍රියාවකට පමණක් සීමා වී ඇත. ප්‍රතිචාර දක්වන්නන් විසින් ලිංගිකව හැසිරීමෙන් වැළකීමට ගෙන ඇති තීරණය, සමාන ලිංගයට අයත් පුද්ගලයකු සමග ලිංගිකව හැසිරීමෙන් තමන් සිදුකරනවා යැයි විශ්වාස කරන "සදාචාරාත්මක පව" (විශ්වාසයන් මත පදනම් වූ) නිසා සිදුකරන්නක්ද, එසේත් නැත්නම්, විරුද්ධ ලිංගිකත්වයට ආකර්ෂණයක් නොමැති හෙයින් විරුද්ධ ලිංගයට අයත් පුද්ගලයින් සමග ලිංගිකව හැසිරීමට කැමැත්තක් නොදැක්වීම නිසාද යන්න නිර්ණය කරගැනීමට වැඩිදුර තොරතුරු රැස්කරගැනීමට අවශ්‍ය වේ.


බිය පිළිබඳ අත්දැකීම්

රූපසටහන 32: පසුගිය අවුරුදු 2 තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් විසින් මුහුණපා ඇති බිය පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 1





ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් කිසියම් ආකාරයක බිය පිළිබඳ හැඟීමක් අත්විඳියි. තමන් පිළිබඳ ඕපාදූප කතාවෙනවාට වැඩි පිරිසක් බියක් දක්වයි. පසුගිය අවුරුදු 2 තුළදී තමන් කිසිදු ආකාරයක ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය කිරීමකට හෝ පරිචාරණයකට මුහුණපා නැතැයි ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළද, තමන්ට එවැනි අත්දැකීම්වලට මුහුණදීමට සිදුවෙනු ඇතැයි බියෙන් පසුවන පුද්ගලයින් රැසක් සිටිනා බව පෙනී යයි. තනි පුද්ගලයින් සහ සමස්ත ඒකකයන් කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම සහ වෙනස්කොට සැලකීම් තුළින් ඇතිවන බලපෑම් පිළිබඳ දැනගැනීමෙන් පසුත්, තම සම ලිංගික සම්බන්ධය බිඳී යා හැකි යැයි ඇතැම් පුද්ගලයින් නිරන්තර බියෙන් පසුවීම පිළිබඳව වටහා ගත හැකිය.

රූපසටහන 33: පසුගිය අවුරුදු 2 තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා ඇතිවූ බිය සම්බන්ධ අත්දැකීම් - ප්‍රස්තාරය 2





තම නිවස, රැකියාව අහිමිවීම පිළිබඳ මෙන්ම තනිකිරීම සහ අන්‍යයන්ගෙන් අප්‍රසාදයට ලක්වීම පිළිබඳවද මිනිසුන් බියක් දක්වයි. ශ්‍රී ලංකාව තුළ සාමාන්‍යයෙන් තවමත් බලහත්කාරී විවාහවලට ඉඩ දේ, එනිසා, එල් ජී බී ටී පුද්ගලයින්ද එවැනි බලහත්කාරී විවාහවලට යොමු කරන බව වටහාගත හැක. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් හරහා සිදුවන්නේ මිනිසුන්ව වෙනස් හෝ සාමාන්‍ය නොවන අය ලෙස සලකා සමාජයෙන් වෙන් කර දැමීමයි. එනිසා, බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් එල් ජී බී ටී වීම නිසා අන්‍යයන්ගෙන් අප්‍රසාදයට ලක්වීමේ බියෙන් ජීවත් වන බව තේරුම් ගත හැක.

රූපසටහන 34: පසුගිය අවුරුදු 2 තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා ඇතිවූ බිය සම්බන්ධ අත්දැකීම් - ප්‍රස්තාරය 3



ශ්‍රී ලංකාව තුල ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් කොතරම් දරුණු ලෙස පවතිනවාද යත්, එල් ජී බී ටී පුද්ගලයකු වීම නිසා තමන්ව මරා දැමිය හැකියැයි පවා මිනිසුන් විශ්වාස කරයි. වෙනස්කොට සැලකීම දූෂණය වැනි බරපතල භෞතික හානි වලින් සමන්විත බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් පිරිසකට හැඟීම, අවධානය යොමු විය යුතු කරුණකි. ස්වකීය ලිංගිකත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා මිනිසුන්ට අසරණ බවක් දැනෙන අතර, වෙනස්කොට සැලකීම ලිංගික අපයෝජන ආකාරයෙන් සිදුවනු ඇතැයි බියෙන් සිටී.

රූපසටහන 35: පසුගිය අවුරුදු 2 තු< තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් මුහුණපා ඇති බිය පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 4




ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය හරහා ස්ව කැමැත්තෙන් පවත්වන සමරිසි සම්බන්ධතා අපරාධීකරණය කිරීම සැලකිල්ලට ගත්කල, එල් ජී බී ටී වීම නිසා සිරගත කිරීමට ලක්වනු ඇතැයි මිනිසුන් බියෙන් ජීවත්වීමේ තත්ත්වය මනාව වටහා ගත හැක. මෙම නීතිය මිනිසුන්ගේ ජීවිතය කෙරෙහි ඇති කරන බලපෑම ඉතා වැදගත් වේ. පසුගිය අවුරුදු 50 තුළදී සමරිසිභාවය මත පදනම්ව කිසිවෙකුට එරෙහිවවත් චෝදනා නැඟීමට මෙම නීතිය භාවිතා නොකළත්, තමන්ට විරුද්ධව මෙම නීතිය භාවිතා කරනු ඇතැයි මිනිසුන් බියෙන් ජීවත් වේ.

මනෝවිද්‍යාත්මක හෝ අධ්‍යාත්මික ප්‍රතිකාර ලබාගැනීමට තමන්ට බලකරනු ඇතැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 18.49 %ක් පමණ බියක් දැක්වීම තුළින්, තමන්ගේ ජීවිත පාලනය කිරීමට තරම්වත් තමන්ට බලයක් ඇති බව මිනිසුන් විශ්වාස නොකරන බවට සාක්ෂි සැපයේ. පැහැදිලිවම, තමන් වෙනුවෙන් තමන් විසින්ම තීරණ ගැනීමේ දී, ඔවුන්ගේ බලය පිළිබඳ හැඟීම අහිමිවී ඇත. ඒ, මිනිසුන් ඕපාදූපවලට ලක්වීමට මෙන්ම වාචික හිංසනවලට ලක්වීමට ද බියක් දක්වන ආකාරයෙන්ම යි. මින් නිරූපණය වන්නේ ශ්‍රී ලාංකික සමාජය තුළ මෙවැනි ආකාරයේ වෙනස්කොට සැලකීම් බහුල ව පවතින බවයි.

### 4.4. වෙනසක් ඇතිකිරීම


අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට මිනිසුන්ව දුර්වල කිරීමේ හැකියාවක් ඇත; මිනිසුන් ඔවුන්ගේ වටිනාකම ප්‍රශ්න කරයි, හේතු විරහිත තීරණ ගනී, එමෙන්ම බොහෝ අවස්ථාවලදී සමාජයට අනුගතවීම හෝ තමන්ව හුදකලා කරගැනීම සිදුකරයි. මෙම වාර්තාවේ මෙතෙක් දුරට එය ප්‍රත්‍යක්ෂ වී ඇත. පුද්ගලයින් කණ්ඩායමක් කොන්කිරීමට ලක්වන විට, එසේ වෙනස්කොට සැලකීමට ලක්වන පිරිස සමග

තමන්ව ඇදා  සැලකීමට මිනිසුන් නැඹුරුවන බැවින්, වෙනස්කොට සැලකීමට මුහුණ නොපාන පුද්ගලයින්ට පවා තමන් තර්ජනයට ලක්ව ඇති සෙයක් දැනේ.


වාර්තාවේ මෙම කොටස තුළින් උත්සාහ කෙරෙන්නේ මෙම කණ්ඩායම කොතරම් උග්‍ර ලෙස බලපෑමට ලක්ව ඇත්දැයි ඇගයීමටයි. පවතින තත්ත්වය වෙනස් කිරීමට සහ තමන් මුහුණපාන වෙනස්කොට සැලකීම් අවම කිරීමට හෝ මුලිනුපුටා දැමීමට හෝ, අඩුම තරමින් ශ්‍රී ලාංකික එල් ජී බී ටී ප්‍රජාවගේ ජීවන තත්ත්වය සංවර්ධනය කිරීමට වත් තමන්ට හැකියාවක් ඇත්දැයි මෙම පුද්ගල කණ්ඩායම විශ්වාස කරනවාදැයි යන්න ද ඇගයීමට ලක්කරනු ඇත.

කොන්කිරීමට මුහුණදීමට සහාය

රූපසටහන 36: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට සහාය ලබාගත හැක්කේ කොහෙන්ද යන්න පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන්ගේ දැනුම




රූපසටහන 37: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට අවශ්‍ය සහාය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 1





ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සඳහා උදව් ලබාගත යුත්තේ කොහෙන්දැයි බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් දැනුවත් ය. තමන්ට අවශ්‍ය සහාය ලබාගැනීම සඳහා යොමුවිය හැකි එල් ජී බී ටී සංවිධානයක් පිළිබඳව බොහොමයක් පුද්ගලයින් දැනුවත් ය. වෙනත් පුද්ගලයින්ට එල් ජී බී ටී සහාය කණ්ඩායමක් හෝ වෙනත් පුද්ගලයකු වෙත යොමුවීමට හැකියාවක් ඇත. බොහොමයක් නොතිබුනත්, එල් ජී බී ටී නොවන, ප්‍රජා මූල මානව හිමිකම් සංවිධාන වෙතට යාමට මිනිසුන්ට හැකියාවක් ඇත.

රූපසටහන 38: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට අවශ්‍ය සහාය ලබාගැනීම සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 2




නීතිමය කටයුතු සඳහා රාජ්‍ය නොවන සංවිධාන වලට මෙන්ම අනෙකුත් සංවිධාන වෙත යොමු වීමට හැකියාවක් මිනිසුන්ට ඇත. එමෙන්ම, ඇතැම් පුද්ගලයින් වෙන්කොට සැලකීම්වලට ලක්වීම සඳහා සහාය ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධාන වෙත යාමට කැමැත්තක් දක්වයි.

රූපසටහන 39: රූපසටහන 38: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධව අවශ්‍යවන සහාය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 3




අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සඳහා විශ්වාසය පදනම් කරගත් සංවිධාන වෙතින් සහාය ලබාගත හැකිවෙතැයි ප්‍රතිචාර දක්වන්නගෙන් වැඩි දෙනෙක් විශ්වාස නොකරයි. ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් සහාය ලබාගත හැකි, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සඳහා වන සායන සහ අනෙකුත් ඒඩ්ස් පාලන වැඩසටහන් පිළිබඳව ප්‍රතිචාර දක්වන්නන් දැනුවත්ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය හා බැඳුණු වෙනස්කොට සැලකීම් සඳහා සහාය ලබාගැනීමට යා හැකි කාන්තා අයිතිවාසිකම් සංවිධානයක් පිළිබඳව ද එක් ප්‍රතිචාර දක්වන්නෙක් දැනුවත් ය.


රූපසටහන 40: පසුගිය අවුරුදු 2 තුළ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට මුහුණදීම සඳහා සහයෝගය ලබාගැනීමට උත්සාහ කළ ප්‍රතිචාර දක්වන්නගේ ව්‍යාප්තිය





අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණදීම සඳහා සහාය ලබාගැනීමට යා යුතු ස්ථාන පිළිබඳ බොහෝ පිරිසක් දැනුවත් වුවත්, එසේම ඔවුන්ගෙන් බොහොමයක් දෙනා ඉතා බරපතල අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට නිරන්තරයෙන් ලක්වුවත්, සැබෑ වශයෙන්ම යම් ආකාරයක සහයෝගයක් ලබාගැනීමට පියවර ගත්තේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 20.19% ක් පමණි. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණදීමට සිදුවුවත්, ඇතැම් පුද්ගලයින් ඒ සඳහා උපකාර ලබාගැනීම ප්‍රතික්ෂේප කරන්නේ මන්දැයි සොයාබැලීමට වැඩිදුර පර්යේෂණ කළ යුතුව ඇත.

අන්‍යයන් විසින් ලබාදී ඇති සහාය

රූපසටහන 41: පසුගිය අවුරුදු 2 තුළ අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට කිසියම් ආකාරයක සහයක් හෝ උපකාරයක් ලබාදී ඇත්දැයි යන්න පිළිබඳ ව්‍යාප්තිය




රූපසටහන 42: පසුගිය මාස 24 තුළ අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට ලබාදී ඇති සහයේ ස්වභාවය




ප්‍රතිචාර දක්වන්නන් විසින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් කෙරෙහි ඉතා උපකාරී බවක් පෙන්වන බව පෙනී යයි. මින් වැඩිදුරටත් නිරූපණය වන්නේ, එකිනෙකාගේ අවශ්‍යතා සහ අත්දැකීම් කෙරෙහි පවතින එක්තරා ආකාරයක අවබෝධයකි. බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් පසුගිය මාස 24 තුළදී අනෙකුත් එල් ජී බී ටී පුද්ගලින්ට චිත්තවේගීමය සහාය ලබා දී ඇත. එමෙන්ම බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාවක් විසින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට ආහාර හෝ මුදල් වැනි භෞතිකමය සහාය ද ලබා දී ඇත.

ප්‍රතිචාර දක්වන්නන් විසින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට වෘත්තීමය සේවාවන් පවා ලබාදුන් අතර, ප්‍රතිචාර දක්වනන්ගෙන් 23.53 %ක් පමණ එල් ජී බී ටී පුද්ගලයින්ව වෙනත් සේවාවන්ට යොමු කර ඇත.

එල් ජී බී ටී ප්‍රජාව ඉලක්ක කොටගත් සංවිධාන සමග ඇති සම්බන්ධතාවය

වගුව 23: එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී ඇති ප්‍රතිචාර දක්වන්නන් සහ එල් ජී බී ටී සංවිධානයක් සමග සම්බන්ධ විය යුතුයැයි විශ්වාස කරන ප්‍රතිචාර දක්වන්නන් පිළිබඳ හරස්-වගුගත විශ්ලේෂණය


| | එල් ජී බී ටී සංවිධානයක් සමග සම්බන්ධ විය යුතු යැයි විශ්වාස කරන | | |
|---|---|---|---|
| එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී ඇති | ඔව් | නැහැ | එකතුව |
| ඔව් | 34 | 0 | **34** |
| නැහැ | 39 | 46 | **85** |
| එකතුව | **73** | **46** | **119** |

එල් ජී බී ටී ප්‍රජාවගේ ගැටළු ඉලක්ක කරගෙන කටයුතු කරන කිසියම් වූ සංවිධානයක ලියාපදිංචි වී ඇත්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. මින් අවධානය යොමු කලේ සමස්ත එල් ජී බී ටී ප්‍රජාවගේ ගැටළු පිළිබඳව කටයුතු කිරීමට සාකල්‍ය ප්‍රවේශයක් ගන්නා සංවිධාන පිලිබඳ පමණක් නොවේ, සංක්‍රාන්ති සමාජභාවය පිලිබඳ පමණක් කටයුතු කරන සංවිධාන වැනි, එල් ජී බී ටී ප්‍රජාවට අයත් එක් කණ්ඩායමක් වෙනුවෙන් කටයුතු කරන සංවිධාන පිළිබඳව ද මින් අවධානය යොමු කරන ලදී. එල් ජී බී ටී සංවිධාන සමග ලිපාපදිංචි වී තිබුණේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 28.57% ක් පමණි. ඉතිරි පුද්ගලයින් 85 දෙනා එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී නොතිබූ අතර, ඔවුන්ගෙන් 45.88% කට පමණ තමන්ට එවැනි සංවිධානයක් සමග සම්බන්ධවීමේ අවශ්‍යතාවක් ඇති බව ප්‍රකාශ කර සිටියෝය. ඇතැම් පුද්ගලයින් එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී තිබුනේ නැති අතර, ඔවුන්ට එසේ සම්බන්ධවීමේ අවශ්‍යතාවයක් ද තිබුණේ නැත.


එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී ඇති සහ එසේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවයක් ඇති බව හැඟෙන පුද්ගලයින් සංඛ්‍යාව තුළින් පිළිබිඹු වන්නේ, සමාජය තුළ තමන් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට කිසියම් වූ ආකාරයක සහයෝගයක් ලබාගැනීමට මිනිසුන් උනන්දුවක් දක්වන බවයි. එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී තිබූ පුද්ගලයින්ගෙන් බොහොමයක්, තමන් මුහුණපෑ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට උපකාර ලබාගැනීමට උත්සාහ කළ පිරිසමයි.

ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයට සම්බන්ධ නීති

රූපසටහන 43: ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාවට බලපාන නීති පිළිබඳව ප්‍රතිචාර දක්වන්නන්ගේ දැනුවත්භාවය





රූපසටහන 44: එල් ජී බී ටී ප්‍රජාවට බලපාන නීති පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් සතු සාමාන්‍ය දැනුම




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 77.31% ක් පමණ ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාවට බලපාන නීතිය පිළිබඳ දැනුවත් බව වාර්තා කළ නමුත්, ප්‍රතිචාර දක්වන්නන් 92 දෙනෙකුගෙන් නීතිය පිළිබඳ නිවැරදි දැනුමක් තිබුණේ 63.04% කට පමණි. දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය යටතේ සමරිසිභාවය සාපරාධීකරණය කර තිබෙන අතර, අවුරුදු 2 සිට 10 දක්වා වන සිර දඬුවමකට භාජනය විය හැකිය.

වයාපෘති සහ/ හෝ වැඩසටහන් වලට සම්බන්ධ වීම


රූපසටහන් 45: එල් ජී බී ටී ප්‍රජාවට අයත් පුද්ගලයින්ට අනුග්‍රහය දක්වන වැඩසටහන් සහ/ හෝ වයාපෘති සමහ ප්‍රතිචාර දක්වන්නන්ගේ සම්බන්ධවීම




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් පැවසුවේ ඔවුන් මූලිකවම එල් ජී බී ටී ප්‍රජාවට. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් එවැනි වැඩසටහන්/ වයාපෘති සමග සම්බන්ධ ව සිටින්නේ 37.82% ක් පමණක් වුවත්, එසේ සම්බන්ධ නොවීමේ අනුපාතය 1:1.63 ක් පමණක් වීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. මින් අදහස් වන්නේ තම ජීවන සංවර්ධනය සහ දැඩි ලෙස අවමන් සහගත සැලකීම්වලට ලක්ව ඇති එල් ජී බී ටී ප්‍රජාවේ අන්‍යන්ගේ ජීවන සංවර්ධනය උදෙසා විවිධ කටයුතුවලට සම්බන්ධ වීමට එල් ජී බී ටී පුද්ගලයින් උද්යෝගයක් දක්වන බවයි.

තීරණවලට බලපෑම් කිරීමට ඇති හැකියාව


රූපසටහන 46: විවිධ අංශවල තීරණවලට බලපෑමක් කිරීමට තමන්ට කිසියම් හැකියාවක් ඇතැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් තුළ පවතින විශ්වාසය




ප්‍රතිචාර දක්වනන්ගෙන් බහුතරයක් එල් ජී බී ටී ප්‍රජාව පිළිබඳ කිසිදු ආකාරයක ප්‍රතිපත්ති, වැඩසටහන්, නීතිමය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු හෝ ඒ සම්බන්ධ වෙනත් ව්‍යාපෘතිවලට කිසිදු බලපෑමක් ඇතිකිරීමට තමන්ට හැකියාවක් නොමැති බව විශ්වාස කරයි. කෙසේනමුත්, එල් ජී බී ටී ප්‍රජාවට ප්‍රතිලාභ සලසන දේශීය ව්‍යාපෘතිවල ගමන් මාර්ගය ට බලපෑම් ඇතිකිරීමට තමන්ට හැකියාවක් ඇතැයි ඔවුන්ගෙන් 31.09 % කට පමණ හැගේ. එල් ජී බී ටී පුද්ගලයින්ට බලපාන නීතිමය අයිතිවාසිකම් පිළිබඳ කටයුතුවලට බලපෑම් කිරීමට තමන්ට හැකියාවක් ඇතැයි මීන් බොහෝ පිරිසක් විශ්වාස කරයි. එල් ජී බී ටී ප්‍රජාවට බලපාන ජාතික ප්‍රතිපත්ති වලට සහ එල් ජී බී ටී ප්‍රජාවට ප්‍රතිලාභ සලසන ජාතික වැඩසටහන් වලට බලපෑමක් කිරීමට තමන්ට හැකියාවක් ඇති බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් පිළිවෙලින් 13.45% සහ 17.65% අතර පිරිසක් විශ්වාසය පළ කිරීම ධෛර්යමත් කරවන කරුණකි.

අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට සහනය සැලසීම ඉලක්ක කරගැනීම

රූපසටහන 47: එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට විරුද්ධව කටයුතු කරන සංවිධාන සහ පුද්ගලයින් විසින් අවධානය යොමුකළ යුතු වඩාත් වැදගත් කරුණ යැයි ප්‍රතිචාර දක්වන්නන් විශ්වාස කරන කරුණු





එල් ජී බී ටී පුද්ගලයින් විසින් මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධව කටයුතු කරන සංවිධාන සහ පුද්ගලයින් අවධානය යොමු කළයුතු වැදගත්ම කරුණ කුමක්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් පැවසුයේ, එල් ජී බී ටී ප්‍රජාවගේ අයිතීන් සහ පිළිගැනීම පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු බවයි. අවධානය ප්‍රධාන ලෙසම යොමු කල යුත්තේ නිර්අපරාධීකරණය අරමුණු කොටගත් උද්දේශන කටයුතු කිරීම වෙනුවෙන් යනුවෙන් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 25% කට අධික පිරිසක් විශ්වාස කළෝය. තවත් 8.4% ක්, සමාන අයිතිවාසිකම් දිනාගැනීම සඳහා සිදුකරන උද්දේශන කටයුතුවලටත්, තවත් 7.56% ක් එල් ජී බී ටී ප්‍රජාවගේ අයිතීන් පිළිබඳව දැනුවත් කිරීමටත්, ප්‍රමුඛතාව ලබා දිය යුතු බව පැවසීය. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් සුළුතරය විශ්වාස කරන්නේ පුද්ගලයින් සහ සංවිධාන වැඩි අවධානය යොමු කළ යුත්තේ චිත්තවේගාත්මක, ශාරීරික සහාය සහ වෙනත් සේවාවන්ට යොමු කිරීම් ඇතුළු අනෙකුත් සේවාවන් ලබාදීම කෙරෙහි බවයි.

## 4.5. අනන්‍යතා හෙළිදරව් කිරීම සහ රහස්‍යභාවය

පුද්ගලයින් කණ්ඩායමක් කෙරෙහි අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් එල්ලවන විට, ඉන් සෘජුවම බලපෑම් එල්ල නොවන කණ්ඩායම් සාමාජිකයින් පවා එම කණ්ඩායම සමග සම්බන්ධ නොවී සිටීමට කටයුතු කිරීමට නැඹුරුතාවයක් පෙන්වයි. ඔවුන් තුළ විශ්වාසය පිළිබඳ ගැටළු ඇතිවන අතර, තමන්ට හානියක් නොකෙරෙනු ඇතැයි ඔවුන් විශ්වාස කරන පුද්ගලයින්ට පමණක් කරුණු හෙළිකිරීමට ඔවුන් පෙළඹේ. අනෙක් අතට, අවමන් සහගත සැලකීම් සිදුවන විට, මිනිසුන් ඊට සැලකීමට ලක්වූවන්ට වෙනස්කොට සැලකීමට නැඹුරු වේ; ඒ හරහා ඔවුන් ලැජ්ජාවීමට හෝ හුදකලාවීමට හෝ එසේත් නැත්නම් සමාජයෙන් වෙන්වීමට ද පෙළඹේ. බොහෝ අවස්ථාවලදී එල් ජී බී ටී පුද්ගලයින්ගේ අනන්‍යතාවය පිළිබඳව හෙළිකරන්නේ ඔවුන්ව විශ්වාස කරන පුද්ගලයින් හෝ ඔවුන් එල් ජී බී ටී විය හැකි යැයි අනුමාන කරන පුද්ගලයින් විසින්ය.


වාර්තාවේ මෙම කොටස හරහා අවධානය යොමු කරන්නේ ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව මිනිසුන් පළමුව දැනගත් අයුරු පිළිබඳවයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ලිංගික දිශානතිය සමග බැඳුණු විශ්වාසය සම්බන්ධ ගැටළු පිළිබඳවත් ඉන් තොරතුරු සැපයේ. සිවිල් සේවකයින්

රූපසටහන 48: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය-සේවා සේවකයින් විසින් දැනගත් ආකාරය





සෞඛ්‍ය සේවා සේවකයින් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනුවත් බව වාර්තා කළ 52.1% ක් පමණ වන පුද්ගලයින්ගෙන්, ඒ පිළිබඳව ඔවුන් විසින්ම පවසා ඇත්තේ 41.94% ක් පමණි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් තවත් 3.23% ක් සඳහන් කළේ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය-සේවා සේවකයින්ට පැවසීමට තවත් පුද්ගලයකුට තමන් විසින් අනුමැතිය ලබා දී තිබූ බවයි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 50% කට වැඩි ප්‍රමාණයක් වාර්තා කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය-සේවා සේවකයින් නොදන්නා බවයි.

රූපසටහන 49: තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසුව ප්‍රතිචාර දක්වන්නන් කෙරෙහි සෞඛ්‍ය-සේවා සේවකයින් දැක්වූ ප්‍රතිචාරය





තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය-සේවා සේවකයින් දන්නා බව වාර්තා කළ පුද්ගලයින් 28 දෙනාගෙන්, පිළිවෙලින් 50% ක් සහ 35.71% ක් වාර්තා කළේ තමන් පිළිබඳ දැනගැනීමෙන් පසුව සෞඛ්‍ය-සේවා සේවකයින් කිසිදු වෙනසක් නොමැතිව ඔවුන්ට සැලකූ බව සහ සහයෝගයෙන් යුතුව කටයුතු කළ බවයි. සෞඛ්‍ය-සේවා සේවකයින් කෙරෙන් වෙනස්කොට සැලකීම, සංක්‍රාන්ති සමාජභාවී හීතිකාව සහ සමරිසිහීතිකාව ප්‍රකාශ වූ බව වාර්තා කළ 14.29% ක් පමණ වන පුද්ගලයින් සංඛ්‍යාවගෙන් හෙළිවන්නේ, වෙනස්කොට සැලකීම සෞඛ්‍ය සේවා පද්ධතියට ත් ව්‍යාප්තව ඇති බවයි.

රූපසටහන 50: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් දැනගත් ආකාරය




තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ සමාජ සේවකයින් හෝ මනෝ උපදේශකයින් විසින් දැනසිටියා යැයි වාර්තා කළ පුද්ගලයින් 41 දෙනාගෙන්, 82.29% ක් පමණ ඒ පිළිබඳව හෙළිදරවු කර තිබිණ. අන්‍යයන් ලවා තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය අනාවරණය කිරීමට ලක්වූ පුද්ගලයින් 7 දෙනාගෙන්, ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාදී තිබුනේ 14.29% ක් පමණක් වන අතර, ඉතිරි පිරිස කිසිසේත්ම ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුනේ නැත. එසේ අනන්‍යතාවය පිළිබඳව සමාජ සේවකයින්ට සහ/ හෝ මනෝ උපදේශකයින්ට හෙළිදරවු කිරීම ද්වේශසහගත ව සිදුවුවක්දැයි නිර්ණය කිරීමට වැඩිදුර පර්යේෂණ සිදු කළ යුතුව ඇත. පූර්ව අනුමැතිය රහිත ව සිදුවන අනන්‍යතා හෙළිදරවු කිරීම වෙනස්කොට සැලකීමට හේතුවුවක්ද, එසේත් නැත්නම්, එල් ජී බී ටී පුද්ගලයින්ට කිසියම් ආකාරයක සහනයක් ලබාගැනීමේ වැයමක්ද යන්න දැනගැනීම ඉතා වැදගත්ය.

රූපසටහන 51: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් ඔවුන් කෙරෙහි දැක්වූ ප්‍රතිචාරය





ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරය පැවසුවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු, සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් විසින් සහයෝගය පෙන්වන සුළු හෝ වෙනසක් නොපෙන්වන ආකාරයෙන් කටයුතු කළ බව යි. ඇතැම් සමාජ සේවකයින් විසින් වෙනස්කොට සැලකීමක් පෙන්වීමේ ගැටළුවක් පවතී.

රූපසටහන 52: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ රාජ්‍ය අංශයේ නිලධාරීන් ට හෙළිකිරීම





රාජ්‍ය අංශයේ නිලධාරීන් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ දැනගත් බව වාර්තා කළේ පුද්ගලයින් 6 දෙනෙක් පමණි. එමෙන්ම, ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳව හෙළිකරන ලද්දේ ඔවුන් විසින්ම සහ තවත් කෙනෙකු එසේ කළ බව ඔවුන්ගෙන් 50% ක් පමණ වාර්තා කළහ.

රූපසටහන 53: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය දැනගත් පසු ඔවුන් කෙරෙහි රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන්ගේ ප්‍රතිචාරය




තම අනන්‍යතාවය පිළිබඳව තමන් විසින්ම හෙළිදරවු කල බව වාර්තා කළ පිරිසම, ඔවුන්ට ඉන් පසු කිසිදු වෙනසකින් තොරව සැලකුම් ලැබුණු බව හෝ සහයෝගය ලැබුණු බව වාර්තා කළහ. තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව අන්‍යයන් විසින් හෙළිකරනු ලැබූ බව වාර්තා කළ පුද්ගලයින් තිදෙනා වැඩිදුරටත් වාර්තා කළේ, රජයේ සේවකයින් අතින් සංක්‍රාන්ති සමාජභාවී භීතික, සමරිසි භීතික හෝ වෙනස්කොට සලකන සුළු අකාරයේ සැලකුම් ලැබුණු බවයි. මෙම දත්ත තුලින් හැඟවෙන්නේ මිනිසුන් තමන්ට වෙනස්කොට නොසලකනු ඇතැයි හැඟුණහොත්, එල් ජී බී ටී පුද්ගලයින් වැඩි වශයෙන් තම අනන්‍යතාවය හෙළිකිරීමට නැඹුරු වන බවයි.

රූපසටහන **54:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පොලිසිය දැනගත් ආකාරය




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩිදෙනෙක් විසින් විසින් සඳහන් කළේ, ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව හෙළිකරනු ලැබුවේ ඔවුන් හැර වෙනත් පුද්ගලයින් විසින් බවයි. පොලිසියට තමන් විසින්ම තම අනන්‍යතාවය හෙළිදරවු කළ බව ප්‍රකාශ කළේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් **5.88%** ක් පමණි. අදාළ පුද්ගලයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිකරනු ලැබුවේ බලපෑම් වලට යටත්වද එසේත් නැත්නම් ස්ව කැමැත්තෙන්ද යන්න දැනගැනීමට වැඩිදුර පර්යේෂණ කළ යුතුව ඇත.

**රූපසටහන 55: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු පොලිසිය විසින් දැක්වූ ප්‍රතිචාරය**





**තමාගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පොලිසිය දැනගත්තේ අන්‍යයන්ගෙන් බව ප්‍රකාශ කළ එකම පුද්ගලයාට ඊට සෘණාත්මක ප්‍රතිචාරයක් ලැබී ඇත. එල් ජී බී ටී පුද්ගලයින් කෙරෙහි පොලිසිය සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතික සහ වෙනස්කොට සලකන සුළු ආකාරයකින් කටයුතු කරන බව පැහැදිලිව පෙනේ. එල් ජී බී ටී යැයි දැනසිටි හෝ සැක කළ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 88.89% ක් කෙරෙහි ඔවුන් මේ අකාරයේ හැසිරීමක් ප්‍රදර්ශනය කර ඇත.**

**අනෙක් අතට, ඇතැම් පොලිස් නිලධාරීන් එල් ජී බී ටී පුද්ගලයින්ට සහයෝගය පෙන්වමින් මානුෂීය ගුණාංග ප්‍රදර්ශනය කර ඇත. අනෙකුත් පොලිස් නිලධාරීන් එල් ජී බී ටී පුද්ගලයින්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය දැනගනීමෙන් පසුව වුවත් කිසිදු වෙනසක් නොමැතිව ඔවුන්ට සලකා ඇත. මෙයිනුත් අදහස් වන්නේ පොලිසිය තමන්ට වෙනස්කොට නොසලකනු ඇතැයි විශ්වාස කළ හැකි අවස්ථාවලදී ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිකිරීමට නැඹුරුතාවක් දක්වන බවයි.**


පවුල සහ මිතුරන්

රූපසටහන 56: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ දෙමවුපියන් ට හෙළිදරව් කිරීම





තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව තම දෙමවුපියන් නොදන්නා බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් පිරිසක් වාර්තා කළහ. තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තම දෙමවුපියන් දැනුවත් බව ප්‍රකාශ කළ පුද්ගලයින් 58 දෙනාගෙන්, 36.32% ක් පැවසුයේ ඒ පිළිබඳ හෙළිදරව් කිරීම සිදුකළේ ඔවුන් නොවන බවත්, වෙනත් පුද්ගලයකු බවත්ය. ඉන් බහුතරයක් ප්‍රකාශ කළේ එසේ කිරීමට ඔවුන් අනුමැතිය ලබාදී නොතිබූ බවයි.

**රූපසටහන 57: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් පසු ඔවුන් කෙරෙහි දෙමවුපියන් දැක්වූ ප්‍රතිචාරය**





**තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් පසු දෙමවුපියන් සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතික හෝ වෙන්කොට සලකන සුළු අයුරින් හැසිරුණු බව බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් වාර්තා කර ඇත. කෙසේ නමුත්, මෙම දෙමවුපියන්ගෙන් 27.59% ක් පමණ සහයෝගය පළකරන හෝ වෙනසක් නොමැති ආකාරයෙන් හැසිරී ඇත.**

**රූපසටහන 58: ප්‍රතිචාර දක්වන්නන්ගේ ඥාති සහෝදර/ සහෝදරියන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් ආකාරය**




තම ඥාති සහෝදර/ සහෝදරියන් හමුවේ තම අනන්‍යතාවය හෙළිකිරීමට ප්‍රතිචාර දක්වන්නන් නැඹුරුවක් දක්වන බව පෙනේ. ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික නැඹුරුතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනුවත් ඥාති සහෝදර/ සහෝදරියන් පිරිසගෙන් 31.25% ක් පමණ ඊට අකමැත්තක් දැක්වීය. බොහෝ ප්‍රතිචාර දක්වන්නන් පිරිසක් ප්‍රකාශ කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ ඥාති සහෝදර/ සහෝදරියන් නොදන්නා බවයි.

රූපසටහන 59: ප්‍රතිචාර දක්වන්නගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන්ගේ ඥාති සහෝදර/ සහෝදරියන් දැක්වූ ප්‍රතිචාරය





තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු තම ඥාති සහෝදර/ සහෝදරියන් සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවෙන් සහ වෙනස්කොට සලකන සුළු ආකාරයෙන් හැසිරුණු බව ප්‍රතිචාර දක්වන්නගෙන් බහුතරයක් දෙනා පවසන ලදී. ඥාති සහෝදර/ සහෝදරියන්ට තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව හෙළිදරවු කර තිබූ ප්‍රතිචාර දක්වන්නන් 64 දෙනාගෙන්, 37.5% කට පමණ සහයෝගය ලැබුණු අතර කිසිඳු වෙනස්කමින් තොරව සැලකුම් ලබා ඇත.

රූපසටහන 60: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ බිරිඳ/ සැමියා ට හෙළිදරව් කිරීම





තම බිරින්දෑවරු/ සැමියන් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ නොදන්නා බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් සඳහන් කළහ. තම අනුමැතියකින් තොරව තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිදරව් කරනු ලැබූ බව ද ඇතැම් පුද්ගලයින් විසින් පවසන ලදී.

රූපසටහන 61: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගනීමන් පසු ඔවුන් කෙරෙහි සැමියාගේ හෝ බිරිඳගේ ප්‍රතිචාරය



ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිදරවු කිරීමෙන් පසු ප්‍රතිචාර දක්වන්නන් බහුතරයකගේ සැමියන් බිරින්දෑවරු විසින් සහයෝගය පළකරන ආකාරයකින් හෝ කිසිදු වෙනසක් නොමැති ආකාරයකින් හැසිරී ඇත. අවමන් සහගත සැලකීම් සාධාරණීකරණය අනුමත කළ නොහැකි වුවත්, එවැනි සැලකීම් සිදුවන්නේ පූර්ණ ලෙසම පුද්ගලයකු එල් ජී බී ටී වීම මත ද, එසේත් නැත්නම් ඔවුන්ගේ සහකරු/ සහකාරිය විසින් මේ ආකාරයෙන් සැලකුවේ දුකට, මුලාකිරීමට හෝ සමරිසිභීතිකාවට හෝ සංක්‍රාන්ති සමජභාවී භීතිකාව ට සම්බන්ධ නොමැති හේතුන් නිසාද යන්න සොයාබැලීමට තවත් පර්යේෂණ සිදුකළ යුතුය. තම අනුමැතියකින් තොරව තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෙළිකිරීමට ලක්වූ පුද්ගලයින් දෙදෙනාගේ සහකරු/ සහකාරිය මේ ආකාරයෙන් ප්‍රතිචාර දක්වා ඇති බැවින් මෙම පැහැදිලි කිරීම සිදුකළ යුතුය.


රූපසටහන 62: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම ලිංගයකට අයත් වන සහකාරිය/ සහකරුවා ට හෙළි කිරීම




සම ලිංගයකට අයත් තම සහකරුවා තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ප්‍රථමයෙන්ම දැනගත්තේ කෙසේදැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසන ලදී. තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාව පිළිබඳව තම සහකරුවාට හෙළිකිරීමට බොහෝ පිරිසක් කැමැත්තක් දක්වයි. මෙඅකාරයෙන් තමන් පිළිබඳ හෙළිදරවු කරන පුද්ගලයින් සංඛ්‍යාව වැඩිවීම, ඔවුන්ගේ පසුබිම අනුව වෙනස් වේ. ඉතා සමීප සමරිසි සම්බන්ධතාවක් පැවැත්වීම සඳහා ඔවුන්ට ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිකිරීමට සිදුවන බව සිතිය හැක.

තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තම සහකරු නොදන්නා බව පැවසූ පුද්ගලයින් දෙදෙනා, ද්විරිසි සහ සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයින් ය. මින් අදහස් වන්නේ තමන් අයත් වන, අවමන් සහගත සැලකීම්වලට ලක්වූ කණ්ඩායමටම අයත් වෙනත් පුද්ගලයින් කෙරෙන් අවමන් සහගත සැලකීමට ලක්වනු ඇතැයි බියක් දක්වන බවයි.

**රූපසටහන 63: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු සමරිසි සහකරුවන්ගේ ප්‍රතිචාරය**





එල් ජී බී ටී ප්‍රජාව තුළම අවමන් සහගත සැලකීම් සිදුවේ. තම සහකරුවා සමරිසි භීතික, සංක්‍රාන්ති භීතික හෝ වෙනස්කොට සලකන අයුරින් හැසිරුණු බව පැවසූ ප්‍රතිචාර දක්වන්නන් සමරිසි සම්බන්ධතාවල සිටි අතර, ද්විරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවී ලෙසින් පිටතට පැමිණියහ. එල් ජී බී ටී පුද්ගලයින් කෙරෙහි පවතින මෙවැනි අවමන් සහගත සැලකීම් ඔවුන් විසින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් වෙතට ද යොමු කිරීම තුළින්, ශ්‍රී ලංකාව තුළ සමරිසිභාවය සහ සංක්‍රාන්ති සමාජභාවය සම්බන්ධයෙන් පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් නිරූපණය කෙරේ.

තමන් සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් බව කිසිවෙකු අතින් තම සහකරු දැනගත් පසු, ඔහු වෙනස්කොට සැලකීමට පටන්ගත් බව එක් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකු විසින් පැවසීය. නැවතත්, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට බලපාන පදනම අවබෝධ කරගත යුතුය. එල් ජී බී ටී පුද්ගලයින් තමන් පිළිබඳව අවංකව සහ විවෘතව සිටිනවානම් මිනිසුන් අඩුවෙන් සමරිසිභීතික වනු ඇත්දැයි යන්න පිළිබඳ විමසිය යුතුව ඇත.


තමන්ට විරුද්ධව කිසිදු අවමන් සහගත සැලකීමක් හෝ වෙනස්කොට සැලකීමක් සිදු නොවනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් යුතුව, එල් ජී බී ටී පුද්ගලයින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට තමන්ගේ අනන්‍යතාවය හෙළිකිරීමට වැඩි කැමැත්තක් දක්වන බව, ලැබෙනා සහයෝගයේ තරම සහ ප්‍රතිචාර දක්වන්නන්ට ඔවුන්ගේ සහකරුවන් සලකන ආකාරය වෙනස් නොවීමෙන් පෙන්නුම් කරයි.

රූපසටහන 64: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ පවුල්වල අනෙකුත් වැඩිහිටියන් දැනගත් අයුරු





තමන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව තම පවුලේ අනිත් වැඩිහිටියන් නොදන්නා බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් දෙනා සඳහන් කර තිබිණ. බොහොමයක් පුද්ගලයින් ඔවුන් විසින්ම තමන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව හෙළිකළ අතර, ඇතැමුන් තවත් අයකුට එසේ කිරීමට අවසර දෙන ලදී. පවුලේ අනෙකුත් වැඩිහිටියන් විසින් ස්වකීය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනුවත් යයි වාර්තා කළ බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් ඒ පිළිබඳ හෙළිකිරීමට කිසිවෙකුට අවසර දී තිබුනේ නොමැත. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බොහොමයක් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව තම පවුලේ වැඩිහිටියන්ට දැනගැනීමට ඉඩ හැරීමට තරම් ඒ පිළිබඳව කැමැත්තක් දක්වන්නේ නැතැයි අනුමාන කළ හැක.

රූපසටහන 65: ප්‍රතිචාර දක්වන්නන් ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගනීමෙන් පසු ඔවුන් කෙරෙහි පවුලේ අනෙකුත් වැඩිහිටියන්ගේ ප්‍රතිචාරය





සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ පවුලේ වැඩිහිටියන්, ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමට තරම් විවෘත බවක් පෙන්වීමට වඩාත් නැඹුරු වේ. බොහොමයක් දෙනා කිසිදු වෙනසක් පෙන්වා නැති අතර, සමහරුන් එසේ හෙළිකිරීමෙන් පසු සහයෝගය ද පළ කර ඇත. ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සමරිසිභීතිකාව, සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව හෝ වෙනස්කොට සැලකීමට මුහුණපා තිබුනත්, බොහෝ අවස්ථාවලදී වෙනස්කොට සැලකීමට මුහුණපෑ අය, ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිකිරීමට පියවර ගත් අය නොවේ .

රූපසටහන 66: ප්‍රතිචාර දක්වන්නන්ගේ පවුලේ දරුවන් ස්වකීය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් ආකාරය




ප්‍රතිචාර දක්වන්නන් බහුතරයකගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ පවුලේ දරුවන් දැනුවත් නැත. බොහොමයක් අවස්ථාවලදී, ප්‍රතිචාර දක්වන්නන් ඔවුන් විසින්ම තම පවුලේ දරුවන්ට තමා පිලිබඳ ව හෙළිකර ඇත. අනෙකුත් පුද්ගලයින් තවත් කෙනෙකුට එසේ කිරීමට කැමැත්ත දී තිබූ අතර, ඇතැමුන් ගේ අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ කැමැත්තෙන් තොරව හෙළිකර ඇත.

රූපසටහන 67: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු ප්‍රතිචාර දක්වන්නන් කෙරෙහි පවුලේ දරුවන්ගේ ප්‍රතිචාරය





ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසුව බොහොමයක් දරුවන් සහයෝගය පළකරන ආකාරයකින් හෝ කිසිදු වෙනසක් නොමැතිව හැසිරී ඇත. අනෙකුත් අවස්ථාවලදී, දරුවන් සමරිසි භීතිකාවකින්, වෙනස්කොට සැලකීමකින් හෝ සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවකින් යුතුව ප්‍රතිචාර දක්වා ඇත. පුද්ගලයකුගේ ජීවිතයේ මුලික අවධියේදීම සමාජගතව ඇති අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ඉගෙන ගන්නා බවට මින් සාක්ෂි සැපයේ.

රූපසටහන 68: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ මිතුරන්ට හෙළිකිරීම




තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ස්වකීය මිතුරන්ට හෙළිකිරීමට ප්‍රතිචාර දක්වන්නන් වැඩි නැඹුරුවක් පෙන්වයි. ඇතැම් අවස්ථාවලදී තමන් වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට එසේ කිරීමට ඉඩදී ඇති අතර, ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ කැමැත්ත නොමැතිව ඔවුන් පිළිබඳව හෙළිකර තිබිණ. තමන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තම මිතුරන් නොදන්නා බව බොහොමයක් පුද්ගලයින් විසින් සඳහන් කර තිබිණ.


රූපසටහන 69: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු ඔවුන්ගේ මිතුරන් ප්‍රතිචාර දැක්වූ ආකාරය



තමන්ට සහයෝගය ලැබෙනු ඇතැයි හැගේ නම්, වැඩි පුද්ගලයින් පිරිසක් තම මිතුරන් හමුවේ පිටතට පැමිණීමට කැමැත්තක් දක්වන බව පෙනී යයි. ප්‍රතිචාර දක්වන්නන් විසින් තම මිතුරන්ට හමුවේ තමන් විසින්ම පිටතට පැමිණි විට හෝ, තමන් වෙනුවට වෙනත් අයකු ලවා පිටතට පැමිණි අවස්ථාවල දී ධනාත්මක ප්‍රතිචාර ලැබී ඇත. ප්‍රතිචාර දක්වන්නන්ගේ අනුමැතියෙන් තොරව ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිකරනු ලැබූ අවස්ථාවලදී පවා, ඔවුන් සහයෝගය දක්වා ඇති බව එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය තුලින් සොයා ගනු ලැබිණ. ප්‍රතිචාර දක්වන්නන් විසින්ම හෝ වෙනත් අයකු විසින්, ඔවුන්ගේ අනුමැතිය සහිතව හෝ රහිතව, ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිකළ අවස්ථාවලදී මිතුරන් සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතික සහ වෙනස්කොට සලකන අයුරින් සැලකූ අවස්ථා ද පවතී.


වෘත්තීමය/ රැකියාමය පරිසරය

රූපසටහන 70: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ සම-සේවකයින්ට හෝ සගයින්ට හෙළිකිරීම





බොහොමයක් අවස්ථාවලදී ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ සම-සේවකයින් හෝ සගයින් දැනුවත්ය. බොහොමයක් අවස්ථාවලදී ප්‍රතිචාර දක්වන්නන් විසින්ම ඔවුන් පිළිබඳ හෙළිකර තිබිණ. 16.33% ක් පමණ ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධයෙන් අවධානය යොමු කළ විට, ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ සගයින්ට හෙළිකර තිබුනේ ඔවුන්ගේ අනුමැතියෙන් තොරව වන අතර, 8.16% ක් පමණ දෙනා පමණක් ඒ සඳහා අනුමැතිය ලබාදී ඇත.

**රූපසටහන 71: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු සම-සේවකයින් විසින් ඔවුන්ට සැලකූ ආකාරය**





**ප්‍රතිචාර දක්වන්නන්ගේ අනුමැතිය ඇතිව ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ සම-සේවකයින් දැනගැනීමෙන් පසු, ඔවුන් එක්කෝ කිසිඳු වෙනසක් නොදැක්වූවේය, එසේත් නැත්නම් සහයෝගය දැක්වීය. ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන් විසින්ම සගයින් ට පැවසූ විට, ඔවුන්ගෙන් බහුතරයක් සහයෝගය දැක්වීය, එසේත් නැත්නම්, කිසිඳු වෙනසක් නොදක්වා සිටියහ. නමුත් ඇතැමුන් සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවීය භීතික හෝ වෙනස්කොට සලකන සුළු විය. ප්‍රතිචාර දක්වන්නන්ගේ අනුමැතියකින් තොරව වෙනත් කිසිවෙකු විසින් ඔවුන් පිළිබඳ ඔවුන්ගේ සගයින් ට හෙළිකළ විට ධනාත්මකව සැලකුම් ලැබුවේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් දෙදෙනෙක් පමණි.**

රූපසටහන 72: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ සේවායෝජකයා දැනගත් ආකාරය




ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බොහොමයක් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ සේවායෝජකයා හමුවේ හෙළිදරව් කර නැත. ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනටමත් දැනුවත් සේවායෝජකයන්, ප්‍රතිචාර දක්වන්නන් විසින්ම ඒ පිළිබඳ හෙළි කරනු ලැබූ අය යි. ඉතිරි ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් බොහොමයකගේ අනන්‍යතාවය හෙළිකිරීම සිදුකර ඇත්තේ වෙනත් පුද්ගලයකු විසිනි; බොහෝ අවස්ථාවලදී එසේ කිරීමට පූර්ව අනුමැතිය ලබාගෙන තිබුණේද නැත.


රූපසටහන 73: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි සේවායෝජකයින්ගේ දැක්වූ ආකල්ප



ස්ව සේවායෝජකයින්ට තම ලිංගික දිශානතිය හෙළිකර තිබූ 31 දෙනාගෙන් බහුතරයට ඒ සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රතිචාරයක් ලැබිණ. කෙසේනමුත්, මෙම ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 32.26% කට ලැබුනේ සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතික හෝ වෙනස්කොට සලකන සුළු සැලකුම්ය.


අවමන් සහගත සැලකීම් සඳහා පැතූ සහාය, සිය රැකියාව සම්බන්ධ එකක්ම බව එක් ප්‍රතිචාර දක්වන්නෙක් පැවසීය. ඇය සමාගමක වසර 4 කට ආසන්න කාලයක් තිස්සේ සේවයේ නියුතුව සිටි අතර, වරක් ඇගේ ලිංගික දිශානතිය පිළිබඳ ඇයගේ කාර්ය සගයෙක් ප්‍රසිද්ධියේ හෙළිකිරීම නිසා ඇයව රැකියාවෙන් ඉවත් කරනු ලැබීය. එය ප්‍රතිචාර දක්වන්නාට වාසි සහගත ආකාරයකින් විසඳුනේ නැත.

රූපසටහන 74: ප්‍රතිචාර දක්වන්නගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ඔවුන්ගේ සේවාදායකයින්ට හෙළිදරවු කිරීම





බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳව ස්ව සේවාදායකයින්ට හෙළිදරවු කර නොමැත. තමන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දන්නා සේවාදායකයින් සිටින ප්‍රතිචාර දක්වන්නන්, ඔවුන් විසින්ම සිය අනන්‍යතාවය හෙළි කළ අය වෙති. අනන්‍යතා හෙළි කර ඇති පුද්ගලයින් 21 දෙනාගෙන් 28.57% කගේ අනන්‍යතාවය හෙළි කරනු ලැබ ඇත්තේ ඔවුන්ගේ පූර්ව අනුමැතිය නොමැතිවයි.

රූපසටහන 75: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු සේවාදායකයින්ගේ ප්‍රතිචාරය





ප්‍රතිචාර දක්වන්නන් **21** ක් සම්බන්ධයෙන් ගත් කල; ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනසිටි ඔවුන්ගේ සේවාදායකයින්ගෙන් **85.71%** ක් පමණ සෘණාත්මක ලෙස ඊට ප්‍රතිචාර දක්වන ලදී. බහුතරයක් වෙනස්කොට සලකන සුළු විය. කෙසේනමුත්, වෙනස්කොට සැලකීම්වල මට්ටම පිළිබඳ අවබෝධ කරගැනීමට වැඩිදුර පර්යේෂණ සිදුකළ යුතුව ඇත.

**රූපසටහන 76: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ගුරුවරුන්ට/ දේශකයින්ට හෙළිදරව්‍ කිරීම**




**තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ගුරුවරුන්/ දේශකයින් ප්‍රථම වරට දැනගත්තේ කෙසේදැයි ප්‍රතිචාර දක්වන්නන්ගේ විමසන ලදී. බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිලිබඳ ව ගුරුවරුන් නොදන්නා බවයි. ඒ පිළිබඳව ගුරුවරුන් දැනසිටි ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධයෙන් ගත් කල, බහුතරයක් අවස්ථාවලදී එම තොරතුරු ගුරුවරුන්ට හෙළිදරව් කළ පුද්ගලයින්ට එසේ කිරීමට ඔවුන් විසින් අවසර දී තිබුණේ නැත.**


රූපසටහන 77: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ගුරුවරුන් හෝ දේශකයින් දැක්වූ ප්‍රතිචාරය




ප්‍රතිචාර දක්වන්නන් ඔවුන් විසින්ම සිය අනන්‍යතාවය ගුරුවරුන්ට හෙළි කල සෑම අවස්ථාවකදීම ඔවුන්ට කිසිඳු වෙනසකින් තොරව, සහයෝගය දක්වමින් සලකන ලදී. මින් පෙන්නුම් කෙරෙන්නේ තමන්ට වෙනස්කොට සලකන්නේ නැතැයි හැඟෙන ගුරුවරුන් හමුවේ පිටතට පැමිණීමට ප්‍රතිචාර දක්වන්නන් වැඩි නැඹුරුතාවයක් දක්වන බවයි. ප්‍රතිචාර දක්වන්නන්ගේ අනුමැතියකින් තොරව වෙනත් පුද්ගලයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිදරවු කළ සිද්ධීන්වලින් බහුතරයක් සම්බන්ධයෙන් ගත්කල, ගුරුවරුන් සහයෝගය දක්වන සුළු ආකාරයට හෝ කිසිඳු වෙනසකින් තොරව කටයුතු කොට ඇත. කෙසේනමුත්, ඇතැම් ගුරුවරුන් වෙනස්කොට සලකන සුළු, සංක්‍රාන්ති සමාජභාවී භීතික හෝ සමරිසිභීතික අයුරින් කටයුතු කොට ඇත.


ආගමික පරිසරය

**රූපසටහන් 78: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ආගමික නායකයින් දැනගත් අකාරය**




**බහුතරයක් පුද්ගලයින් ස්ව ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ආගමික නායකයින්ට හෙළි කිරීමට කැමැත්තක් නොදක්වයි. ඒ පිළිබඳ හෙළි කල අවස්ථාවලදී පවා, එසේ කර ඇත්තේ ප්‍රතිචාර දක්වන්නා හැර වෙනත් පුද්ගලයකු විසින් වන අතර, බොහෝ අවස්ථාවලදී එසේ කර ඇත්තේ අනුමැතියකින් තොරවයි.**

**රූපසටහන 79: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි ආගමික නායකයින් දැක්වූ ආකල්ප**





**ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳ හෙළි කළ බහුතරයක් ආගමික නායකයින් වෙනස්කොට සලකන සුළු, සමරිසි-භීතික හෝ සංක්‍රාන්ති සමාජභාවී භීතික ආකාරයකින් කටයුතු කොට ඇත. නමුත්**

ඇතැමුන්, ප්‍රතිචාර දක්වන්නන්ට කිසිදු වෙනසකින් තොරව හෝ සහයෝගය දක්වන සුළු ආකාරයකින් සලකා ඇත.


**සිවිල් සමාජය**

**රූපසටහන 80: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට හෙළි කිරීම**





**බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් ඔවුන් විසින්ම අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් හමුවේ පිටතට පැමිණ ඇත. සම්මුඛ සාකච්ඡාවට සහභාගීවුවන් පැහැදිලිවම තමන් හා සමාන අයවලුන් සමග කටයුතු කිරීමට වැඩි හැකියාවක් දක්වන ලදී. ඇතැම් පුද්ගලයින් තම අනන්‍යතාවය කිසිසේත්ම හෙළි නොකර සිටීම හරහා එල් ජී බී ටී ප්‍රජාවෙන් වෙන්වී සිටීමට උත්සාහ කරයි. ඒ මන්දැයි අවබෝධ කරගැනීමට තවත් පර්යේෂණ සිදු කළ යුතුය.**

**රූපසටහන 81: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් දැක්වූ ප්‍රතිචාරය**





**එල් ජී බී ටී පුද්ගලයින් තමන්වම සහ එකිනෙකාව එකම ආකාරයකින් වෙනස්කොට සලකන නමුත්, බහුතරයක් එල් ජී බී ටී පුද්ගලයින් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් කෙරෙහි සහයෝගය දක්වන නමුත්, තමන් තුළ එකිනෙකාට සමාන අනන්‍යතා ඇති බව අමතක කරමින් තවමත් බොහොමයක් දෙනා සමරිසිහීතික හෝ වෙනස්කොට සලකන සුළු අයුරින් සිටීම නිසා සිදුවන්නේ ඔවුන් තව තවත් සමස්ථයක් ලෙස අවමන් සහගත සැලකීම්වලට ලක්වීමයි. වෙනස්කොට සැලකීමේ ඇති බරපතලකම අවබෝධ කරගැනීමට ප්‍රජාව තුළම තවත් පර්යේෂණ සිදුකළ යුතුව ඇත.**

**රූපසටහන 82: ප්‍රතිචාර දක්වන්නන්ගේ අසල්වැසියන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් ආකාරය**



තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තම අසල්වැසියන් නොදන්නා බව බහුතරයක් විසින් ප්‍රකාශ කරන ලදී. නමුත්, අසල්වැසියන් ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය දන්නා පුද්ගලයින් සම්බන්ධයෙන් සලකා කල, එය හෙළිකර ඇත්තේ ඔවුන්ගේ අනුමැතිය නොමැතිව බව පෙනී යයි. බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් ඔවුන් විසින්ම ඔවුන් පිළිබඳව හෙළිකර තිබීමෙන් නිරූපණය වන්නේ ඔවුන් කෙරෙහි ඔවුන්ගේ අසල්වැසියන් තුළ යම් විශ්වාසයක් තිබූ බවයි.


රූපසටහන 83: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි අසල්වැසියන් දැක්වූ ආකල්ප




සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ අනුමැතිය නොමැතිව ඔවුන් පිළිබඳ හෙළිකර තිබූ බොහොමයක් අවස්ථාවලදී, අසල්වැසියන්, සංක්‍රාන්ති සමාජභාවී භීතික, වෙනස්කොට සලකන සුළු හෝ සමරිසිභීතික ආකාරයකින් කටයුතු කොට ඇත. තම අනන්‍යතාවය හෙළිකිරීමෙන් පසු වැඩි දෙනෙකු ධනාත්මක ව සැලකුම් ලබා නොමැත.


මාධ්‍ය

**රූපසටහන 84: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව මාධ්‍ය දැනගත් ආකාරය**




**මෙය ඇතැමුන්ට අදාළ නොවූ අතර, අනෙකුත් පිරිස් සඳහන් කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ මාධ්‍ය නොදන්නා බවයි. මාධ්‍යයට තමන් පිළිබඳ හෙළිදරව් කර තිබූ බව සඳහන් කළ සියලුම ප්‍රතිචාර දක්වන්නන් ඔවුන් විසින්ම එය සිදුකර තිබුණි.**

**රූපසටහන 85 : ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි මාධ්‍ය දැක්වූ ආකල්ප**




ප්‍රතිචාර දක්වන්නන්ට වෙනස්කොට නොසලකනු ඇතැයි හැඟේ නම් මාධ්‍ය හමුවේ පිටතට පැමිණීමට ඔවුන් කැමැත්තක් දක්වන බව පෙනෙන්නට තිබේ. තම අනන්‍යතාවය පිළිබඳව හෙළිදරවු කර ඇති ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් විසින් වාර්තා කළේ, මාධ්‍ය ඔවුන්ට කිසිදු වෙනසකින් තොරව සැලකූ බවයි. ඇතැම් අවස්ථාවලදී මාධ්‍ය කෙරෙන් සමරිසිභීතික, සංක්‍රාන්ති සමාජභාවී භීතික හෝ වෙනස්කොට සලකන සුළු ආකාරයේ ප්‍රතිචාර ද ලැබී ඇත.

බහුතරයක් සිද්ධීන් සම්බන්ධයෙන් සැලකිල්ලට ගැනීමේදී, ප්‍රතිචාර දක්වන්නන්ගේ පූර්ව අනුමැතියෙන් තොරව ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෙළිකිරීමට මිනිසුන් පෙළඹෙන්නේ මන්දැයි අවබෝධ කරගැනීමට වැඩිදුර පර්යේෂණ සිදු කළ යුතුව ඇත. ඇතැම් අවස්ථාවලදී, ස්ව අනුමැතියෙන් තොරව ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෙළිකරනු ලැබූ ප්‍රතිචාර දක්වන්නන්ට, එම පුද්ගලයින් ගේ අතින් කායික ප්‍රචණ්ඩත්වය සහ ප්‍රතිලාභ සඳහා තර්ජනය කිරීම් වැනි තදබල වෙනස්කොට සැලකීම්වලට ලක්වීමට ද සිදු විය. අනෙකුත් පුද්ගලයින් සම්බන්ධයෙන් සැලකූ විට පෙනී යන්නේ, ඔවුන්ගේ පූර්ව අනුමැතියෙන් තොරව ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිකරනු ලැබුවත්, වෙනස්කොට සැලකීම්වලට ලක් නොවූ බවයි. උදාහරණයක් ලෙස, තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ/ හෝ ලිංගික නැඹුරුතාවය පිළිබඳ සමාජ සේවකයින්ට හෝ මනෝ උපදේශකයින්ට හෙළිකල ඇතැම් පුද්ගලයින්ට අභ්‍යන්තරීකරණය වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සමග කටයුතු කිරීමට සහාය ලැබිණ. එනිසා, අනන්‍යතා හෙළිකිරීමෙන් ඇතිවන අනුමිතීන් අවබෝධ කරගැනීම සඳහා එසේ කිරීමට හේතුවූ පදනම පිළිබඳව විමර්ශනය කළ යුතුව ඇත.

මෙම කොටසේ ප්‍රතිඵල ගොෆ්මන් ගේ න්‍යාය සමග ගැලපේ. තමන්ට වඩාත් සමීප පුද්ගලයින් හමුවේ පිටතට පැමිණීමට මිනිසුන් වැඩි නැඹුරුතාවයක් දක්වයි.


අනන්‍යතා හෙළිකිරීමට එල්ලවන පීඩනය

රූපසටහන 86: තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පිටතට පැමිණීමට එල් ජී බී ටී ලෙස හඳුනා නොගන්නා පුද්ගලයින්ගෙන් කිසිදු පීඩනයක් එල්ලවීද යන්නට ලැබුණු ප්‍රතිචාරය




තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සම්බන්ධයෙන් පිටතට පැමිණීමට පීඩන එල්ලවන බව මෙම සමීක්ෂණය හරහා සොයාගන්නා ලදී. බහුතරයක් වන ප්‍රතිචාර දක්වන්නන් විසින් මෙවැනි ආකාරයක පීඩනයකට ලක්ව තිබුණේ නැත. කෙසේනමුත්, ප්‍රතිචාර දක්වන්නගෙන් 17.65% ක් පමණ නැවත නැවතත් එවැනි ආකාරයක පීඩනයකට ලක්ව තිබිණ.

රූපසටහන 87: සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳව පිටතට පැමිණීමට අනෙකුත් එල් ජී බී ටී ප්‍රජාව වෙතින් ප්‍රතිචාර දක්වන්නන් ට එල්ල වූ පීඩනය සම්බන්ධ අත්දැකීම්





ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පිටතට පැමිණීමට එල් ජී බී ටී ප්‍රජාවගෙන් ඇතිවන පීඩනය ඉතා අඩුවුවත්, යම් ප්‍රමාණයක පීඩනයක් පවතී. ප්‍රතිචාර දක්වන්නන් 119 දෙනාගෙන් 9.24% ක් පමණ අඩුම තරමින් එක් වරක්වත් පිටතට පැමිණීමට බලකිරීමකට ලක්ව තිබූ අතර, ඔවුන්ගේ 8.4% කට පමණ නැවත නැවතත් පිටතට පැමිණීමට බලකර ඇත.

මෙවැනි ක්‍රියාකාරකම් හරහා පුද්ගලයින්ට තම අභිමතයට එරෙහිව ක්‍රියා කිරීමට බලකිරීමක් කෙරෙන බැවින් මේ ආකාරයේ පීඩනයන්ට ලක්කිරීම වෙනස්කොට සලකන සුළු වේ.

රහස්‍යභාවය

රූපසටහන 88: රහස්‍යභාවය තම රාජකාරියේ කොටසක්ව තිබියදී වෘත්තියවේදියකු විසින් රහස්‍යභාවය කඩකිරීම




වෛද්‍යවරුන්, මනෝ උපදේශකවරුන්, නීතීඥවරුන් වැනි රහස්‍යභාවය සුරැකීමට බැඳීසිටින වෘත්තීයවේදියකු විසින් ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ පූර්ව අනුමැතියෙන් තොරව හෙළිකර ඇත්දැයි ප්‍රතිචාර දක්වන්නගෙන් විමසන ලදී. එවැනි රහස්‍යභාවය කඩකිරීමකට කිසිදා ලක්වී නොමැති බව බහුතරයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් පවසන ලදී. තම රහස්‍යභාවය සුරැකුවාද යන්න පිළිබඳ ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් අවිනිශ්චිත බවක් දැක්වීය. කෙසේනමුත්, එවැනි ආකාරයකින් තම රහස්‍යභාවය කඩවී ඇති බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් පැවසීය.

රහස්‍යභාවය සුරැකීමට නීතියෙන්ම බැඳී සිටින අයවලුන් අතින් පවා රහස්‍යභාවය කඩවීම තුළින් අවිශ්වාසය වර්ධනය වේ. එමෙන්ම ඒ හරහා මිනිසුන්ව තවදුරටත් කොන්කිරීමට ලක්වන අතර, ඔවුන් හුදකලාවීමට නැඹුරු වේ.

## 4.6. ගුණාත්මක විශ්ලේෂණය

ප්‍රශ්නාවලිය තුළ අවිනිශ්චිතෝත්තර ප්‍රශ්න සීමා සහිත සංඛ්‍යාවක්ද ඇතුළත් විය. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධ ගැටළු තනිවම හෝ අන්‍යන්ගේ සහාය ඇතිව විසඳාගත්තේ කෙසේද විස්තර කරන ලෙස, 'වෙනසක් ඇතිකිරීම' නම් වූ 3 වන කොටස තුළින් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින ලදී. එකී ගැටලුව කුමක්ද යන්න, එම ගැටලුව විසඳා ගත්තේ කෙසේද සහ කිසියම් සහයක් ලැබුනේ නම් ඒ කාගෙන්ද යන්න පැහැදිලිව විස්තර කරන ලෙස ද ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින ලදී. පවුල් තුල කොන්කිරීම් සිදුවූ අවස්ථාවලදී මිතුරන්ගෙන්, පවුලේ අනෙකුත් සාමාජිකයින්ගෙන් හෝ සමාජ සේවකයින්ගෙන්, සංවිධානවලින් සහ මනෝ උපදේශකයින්ගෙන් සහාය ලැබුණු අවස්ථා පිළිබඳ ඇතැම් පුද්ගලයින් විසින් වාර්තා කළහ.

සමරිසිභාවය මත පදනම්ව රැකියාවෙන් ඉවත් කිරීම පිළිබඳ එක් සිද්ධියක් වාර්තා විය. මෙම පුද්ගලයාට එක්තරා සංවිධානයක් විසින් සහාය ලබාදුන් අතර, නව රැකියාවක් ලබාගැනීමට ද උපකාර කරන ලදී. තවත් පුද්ගලයෙක්ව සමරිසි වීම පිළිබඳ සැකය මත ක්‍රීඩා කණ්ඩායමකින් ඉවත් කර තිබූ අවස්ථාවකදී, සමාජ

සේවකයකුගේ සහාය ඇතුවත් නැවතත් කණ්ඩායමට ගැනීම ප්‍රතික්ෂේප විය. එමෙන්ම, පුද්ගලයින් කිහිප දිනෙකුට ඔවුන්ගේ පවුල තුළ තිබූ ස්ථානය අහිමිවූ අවස්ථාවේදී නිවාස පහසුකම් සලසා ගැනීමට මිතුරන්ගෙන් සහාය ලැබී තිබිණ.

විවෘතව ද්විරිසි, සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී හෝ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයකු වීම සම්බන්ධයෙන් ඇතිව ඇති ප්‍රධාන ගැටළු කුමක්දැයි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් විමසූ විට, බහුතරයක් දෙනා පැවසුවේ ඔවුන්ට කිසිදු තනි අභියෝග නොමැති බවයි. කෙසේනමුත්, එම ප්‍රතිචාර දක්වන්නන්ගෙන්ම බොහෝදෙනෙක් වාර්තා කළේ, ඔවුන් තම අනන්‍යතා හෙළිවීම පිළිබඳ සහ නීතියෙන් දඬුවම් ලැබීම පිළිබඳ බියක් දැක්වූ බවයි. තවත් පිරිසක් පැවසුවේ තම උන්නතියට උපකාර ලබාගත හැකි සේවයන් ලබාගැනීම සම්බන්ධව ඔවුන්ට ගැටළු ඇති බවයි. තමන්ව අනුමත නොකිරීම, වැඩිදියුණුවට සහාය ලබාගැනීම, සමානාත්මතාවය අඩුකම, සංස්කෘතිමය හා සමාජමය ගැටළු සහ විෂමරිසි පුද්ගලයින් භුක්ති විඳින නිදහස නොමැතිවීම තමන් මුහුණපාන විශාලතම අභියෝග බව ඇතැම් පුද්ගලයින් විසින් සඳහන් කරන ලදී. තම ලිංගික දිශානතිය සමග බැඳුණු තවත් ගැටළුවලට අවධානය යොමු කිරීමට සිදුවන බැවින්, තම සමරිසි සහකාරිය සමග සමීප සබඳතාවයක සිටීමට නොහැකි තත්ත්වයක් ඇති බව එක් පුද්ගලයකු විසින් ප්‍රකාශ කරන ලදී.

එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් හේතුවෙන් කැපවූ සමරිසි සබඳතාවයක සිටීමට බහුතරයක් පුද්ගලයින්ට අපහසු බව ප්‍රකාශ විය. අනෙකුත් පුද්ගලයින් සඳහන් කලේ ස්ථිර සබඳතාවයක සිටීමට නොහැකි තරම් සමාජමය සහ නීතිමය ගැටළු වඩාත් බරපතල අකාරයෙන් පවතින බවයි. සමරිසි සබඳතාවන්ට ලබාදී ඇති අඩු නීතිමය වටිනාකමද ඇතැම් ප්‍රතිචාර දක්වන්නන්ට ගැටළුවක් ව පවතී.

# පස්වන පරිච්ඡේදය

## 5. නිගමන සහ නිර්දේශ

මෙම එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකයේ ඉලක්කය වනුයේ, සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් ශ්‍රී ලංකාව තුළදී මුහුණපාන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ ගවේෂණය කිරීමයි. මෙම නියමු ව්‍යාපෘතිය අවසන් කිරීමේ දී, ප්‍රධාන නිර්දේශ සමග මෙම පර්යේෂණයේ නිගමන සාරාංශයක් ද ඉදිරිපත් කෙරෙනු ඇත.

## 5.1. නිගමනය

අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ප්‍රකාශ වනුයේ අවමන් සහගත සැලකීම්වලට ලක් නොවන කණ්ඩායම් කෙරෙන් පමණක් නොව, ඒවා අවමන් සහගත සැලකීම්වලට ලක්වූ පුද්ගලයින් තුළද අභ්‍යන්තරකරණය වී ඇති බවත්, විවිධාකාරයෙන් ප්‍රකාශ වන බවද මෙම පර්යේෂණ හරහා සොයාගන්නා ලදී. ඉන් විද්‍යාමාන වන කරුණු, බිය දැනීමේ සිට වෙන්වී සිටීම සහ නොසලකා හැරීම දක්වා පරාසයක පැතිර තිබේ. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් හේතුවෙන් පුද්ගලයින් හුදකලාවීම සහ ඔවුන්ගේ බලය යටපත්වීම සිදුවන අතර ඔවුන් සේවාවන් සහ මානව හිමිකම් භුක්ති විඳීමෙන් වළක්වයි.

ප්‍රශ්නාවලිය අනු කොටස්වලට බෙදීම මගින් ශ්‍රී ලංකාව තුළ එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දැඩි අවධානයකින් යුතු අවබෝධයක් ඇතිකරගැනීමේ හැකියාව ලැබිණ. එම තාක්ෂණික පියවර මගින් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට මුහුණපාන පරිසර/ ස්ථාන, වරදකරුවන්, වෙනස්කොට සැලකීමේ ආකාර සහ, එකී කරුණු එල් ජී බී ටී පුද්ගලයින්ට බලපාන අයුරු පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ හැකියාවද ලැබිණ. තවද, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා එල් ජී බී ටී පුද්ගලයින් දරන විවිධ වෑයම් පිළිබඳ ක්‍රමානුකූල දැනුමක් ද මේ හරහා ලබාදේ. මෙම අවබෝධය වැඩිදුරටත් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා විශ්ලේෂණයේදී කළ වර්ගීකරණයන්ට ගැලපෙන ආකාරයට සාරාංශයක් නිර්මාණය කිරීම සිදු කළ හැක.

### 5.1.1. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් මුහුණපාන පරිසර

එල් ජී බී ටී පුද්ගලයින් එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට විවිධ පරිසර තුළදී මුහුණපාන බව මෙම අධ්‍යනයේ සොයාගැනීම් මගින් හෙළිදරවු විය. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරයක් වෙනස්කොට සැලකීමට මුහුණපාන්නේ සමාජය තුළදීය; තමන්ව සමාජයීය හමුවීම්වලින් බැහැරකරන ලද බව 28.57% ක් විසින් වාර්තා කරනු ලැබීය. දෙවන වැඩිම වෙනස්කොට සැලකීමේ මට්ටමට මුහුණපා ඇත්තේ පවුල් ඒකකය තුළදීය, එහිදී ප්‍රතිචාර දක්වන්නන්ව පවුලේ කටයුතුවලින් බැහැරකර තිබිණ. ආගමික ස්ථානවලින් සහ කටයුතුවලින් ද ප්‍රතිචාර දක්වන්නන්ව බැහැර කළ අවස්ථා තිබිණ.

බහුතරයක් පුද්ගලයින්ව සමාජ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම සිදුකර ඇත්තේ ඔවුන්ගේ මිතුරන් විසින් බව මෙම පර්යේෂණයෙන් සොයාගෙන තිබීම සැලකිල්ලට ලක්කළ යුතුය. එමෙන්ම, ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හෙළිදරවු කිරීම සම්බන්ධයෙන් සැලකූ කල, වැඩිම පුද්ගලයින් පිරිසක් තම අනන්‍යතාවය ගැන හෙළිකර තිබුණේ සිය මිතුරන්ට ය. තවද, ආගමික ස්ථාන හමුවේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළබඳ වැඩි පිරිසක් හෙළිදරවු කර තිබුනේ නැත. සාපේක්ෂ පුද්ගල සංඛ්‍යාවක් සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ පවුල්වලට හෙළිදරවු කර තිබිණ.

### 5.1.2. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට බලපාන හේතූන්

එල් ජී බී ටී ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැලකීමට හේතුවන ප්‍රධානම කරුණුවන්නේ ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ එම ද්විත්වයම වේ. කෙසේනමුත්, පුද්ගලයින්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හෝ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය යන කරුණු දෙකම මත මිනිසුන් වෙනස්කොට සැලකීමට ලක්වන බව, අවස්ථා ගණනකදීම මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය. වෙනස්කොට සැලකීමට හේතුවන ප්‍රධාන කරුණ ලෙස ලිංගික දිශානතිය සැලකීමට හැකිවූ එකම කරුණ වූයේ, ඕපාදූප සම්බන්ධයෙනි.

### 5.1.3. එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සිදුකරන පාර්ශව

මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූ ප්‍රධානතම ගැටළුව වූයේ, එල් ජී බී ටී පුද්ගලයින් ආරක්ෂාකාරී නිවාස වටපිටාවන්වල ජීවත් නොවීමයි. ඇතැම් පුද්ගලයින් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට ලක්වූයේ; ඔවුන්ගේ පවුල් අතින් ඔවුන්ගේ නිවසේදී, සමරිසි සහකරුවන් අතින් සහ ඇතැම් අවස්ථාවලදී අසල්වැසියන් වෙතිනි. එල් ජී බී ටී පුද්ගලයින් විසින් මුහුණපාන, රාජ්‍ය අනුග්‍රහය ඇති වෙනස්කොට සැලකීමක්ද පවතී; පොලිසිය, නීති වෘත්තියවේදීන්, ආයුධ සන්නද්ධ බලකා සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් දිගින් දිගටම එල් ජී බී ටී පුද්ගලයින්ට එරෙහිව වෙනස්කොට සැලකීම් සිදුකරමින් පවතී.

ආගමික පරිසර සම්බන්ධයෙන් ගත් කල, පූජකයින් ද එල් ජී බී ටී පුද්ගලයින්ට එරෙහි වෙනස්කොට සැලකීම් සිදුකරන වරදකරුවන් ලෙස වාර්තා වී ඇත. රාජකාරී ස්ථානවලදීද එල් ජී බී ටී පුද්ගලයින් සේවායෝජකයින් සහ සගයින් අතින් අවමන් සහගත සැලකීම්වලට සහ වෙනස්කොට සැලකීම්වලට ලක්වේ.

### 5.1.4. වෙනස්කොට සැලකීම ආකාර

එල් ජී බී ටී පුද්ගලයින්ට විරුද්ධ වෙනස්කොට සැලකීම් විවිධාකාරයෙන් සිදුවේ. සේවාවන් ලබාගැනීමේ හැකියාව ප්‍රතික්ෂේප කරනු ලැබීම, අපයෝජනය ලක්වීම හෝ අපයෝජනයට ලක්කිරීම සම්බන්ධ තර්ජන ලැබීම සහ ප්‍රකෝපනය වැනි ආකාරවලින් එල් ජී බී ටී පුද්ගලයින් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් අත්විඳී. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 4.2% සහ 74.79% අතර පිරිසක් එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ කිසියම් ආකාරයක අවමන් සහගත සැලකීමකට සහ වෙනස්කොට සැලකීමකට ලක්ව ඇති බව මෙම අධ්‍යනයෙන් අනාවරණය විය.

අඩුවෙන් ද මුහුණපා ඇති වෙනස්කොට සැලකීම වන්නේ සෞඛ්‍ය සේවා ප්‍රතික්ෂේප කරනු ලැබීමයි. ඕපාදූප වලට භාජනය වීම ප්‍රතිචාර දක්වන්නන් වැඩියෙන්ම මුහුණපා තිබූ වෙනස්කොට සැලකීමයි.

නිවාස, රැකියා, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා වැනි මානව අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් ගත් කල, වැඩි පුද්ගල සංඛ්‍යාවක් රැකියා වලින් ප්‍රතික්ෂේප වන අතර බොහෝ පිරිසකගේ වෘත්තීමය සංවර්ධනය වෙනස්කොට සැලකීම නිසා අභියෝගයට ලක්ව තිබේ. අධ්‍යාපනය සම්බන්ධ කරුණුවලදී වෙනස්කොට සැලකීමට ලක්වූ බව අඩු පිරිසක් වාර්තා කිරීම සන්දර්භානුගත යි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් බහුතරය ඒ සම්බන්ධයෙන් බලපෑම් සිදුවිය හැකි වාතාවරණයක නොසිටියහ.

ඉහල මට්ටමක වාචික හිංසනය, චිත්තවේගාත්මක අපයෝජනය සහ ප්‍රතිලාබ වෙනුවෙන් තර්ජනය කිරීම මෙන්ම ඕපාදූප පිළිබඳව ද මෙම අධ්‍යනය හරහා වාර්තා විය. සැලකිය යුතු පුද්ගලයින් ගණනක් කායික හිංසනයේ ගොදුරු බවට ද පත්ව ඇත, එය 20.17% කි.

ප්‍රතිචාර දක්වන්නන්ගේ පවුල්වල සාමාජිකයින්ද එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වල ගොදුරු ය. වාචික අපයෝජනය හා හිංසනය, හුදකලාකිරීම සහ කායික අපයෝජනය හා හිංසනය ද වෙනස්කොට සැලකීමේ විවිධ ආකාර ලෙස සඳහන් කළ හැකිය.

## 5.1.5. අවමන් සහගත සැලකීමේ සහ වෙනස්කොට සැලකීමේ බලපෑම්

ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්වූ අවමන් සහගත සැලකීම ප්‍රතිචාර දක්වන්නන්ට ඉතා වැඩි දුරකට බලපා ඇති බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. එය බියජනක වනවා පමණක් නොවේ; ඔවුන් සෘණාත්මක සිතිවිලි අත්දකියි, හුදකලා වේ, වෙනත් හේතුවක් මත නොගන්නා තීරණ ගනී සහ ඔවුන්ට බල රහිත බවක් දැනේ. එමෙන්ම, ඇතැමුන් ඔවුන්ගේ සංක්‍රාන්ති සමාජභාවී සහ සමරිසිභාවය යන තත්ත්වවලට ප්‍රතිකාර හෝ පිළියම් සෙවීමට ද පෙළඹේ.

ස්වකීය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා මුහුණපෑමට සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් නිසා ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 6.72% ත් 45.38% අතර පිරිසක් ලැජ්ජාව සහ වරදකාරී හැඟීම් වැනි කිසියම් ආකාරයක සෘණාත්මක හැඟීම් අත්විදී.

ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 4.2% ත් සහ 47.90%ත් අතර පිරිසක් එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් නිසා නොවේනම් ඔවුන් කිසිසේත් නොගෙන සිටීමට තිබූ තීරණ ගෙන තිබිණ. හුදකලාවීම, නොසලකා හැරීම සහ වෙන්වී සිටීම මෙන්ම සිය සමරිසිභාවය/ සංක්‍රාන්ති සමාජභාවය සුවකරගැනීමේ අදහසින් ප්‍රතිකාර සහ පිළියම් ලබාගැනීම මෙම තීරණවලට අයත්ය. බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන් සිය පවුලේ සාමාජිකයින්ගෙන් වෙන්ව හුදකලා වීමට තීරණය කර තිබිණ. ඇතැමුන් රැකියාවක් නොකිරීමට සහ සෞඛ්‍ය සේවා ලබා නොගැනීමට පවා තීරණය කර ඇත.

කිසිඳු ආකාරයක අවමන් සහගත සැලකීමකට සහ වෙනස්කොට සැලකීමකට ලක්ව නොතිබුනත්, අධ්‍යනයට සහභාගී වූ බොහොමයක් දෙනාට එල් ජී බී ටී ප්‍රජාව සම්බන්ධ අවමන් සහගත සැලකීමට සහ වෙන්කොට සැලකීම කෙරෙහි පවතින බිය ගැටලුවකි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 16.81% ත් 74.79% ත් අතර පිරිසක් සිය ලිංගික නැඹුරුතාවය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සමග සම්බන්ධ වූ කිසියම් ආකාරයක බියක් අත්දකී. ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කල විශාලතම බියවල් දෙක වනුයේ; ඔවුන් පිළිබඳ ඕපදූප කතාවීම සහ වාචික අපයෝජනයට ලක්වීමයි. පිටත පැමිණීම සහ ප්‍රසිද්ධියේ ලජ්ජාවට පත්වීමටද බොහෝ පුද්ගල සංඛ්‍යාවක් බිය පළකර සිටියහ.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපෑම් කිරීමේ හැකියාවක් ද අවමන් සහගත සැලකීමට සහ වෙනස්කොට සැලකීමට ඇත. මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙන පරිදි සෑම එල් ජී බී ටී පුද්ගලයින් 4 න් දෙනෙකුගෙන්ම එක අයෙක් එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින වෙන්කොට සහ වෙනස්කොට සැලකීම නිසා විදේශයන්ට සංක්‍රමණය වීමට තීරණය කර ඇත. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 50% ක් පමණ තෘතීයික අධ්‍යාපනය ලබාතිබීම සහ ආර්ථිකය සංවර්ධනය ට බලපෑමක් කිරීමේ හැකියාවක් තිබීම නිසා, ඒ හරහා බුද්ධි ගලනයක් ද සිදුවන බව කිව හැකිය.

## 5.1.6. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිලිබඳ ආමන්ත්‍රණය

එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රතිචාර දක්වන්නන් කිසියම් ආකාරයක පියවරක් ගෙන තිබූ බව දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය විය.

ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 19.33% ත් 73.95% ත් අතර පිරිසක් සිය ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව ප්‍රගතිශීලී සාකච්ඡාවක නිරත වී ඇත. නමුත්, ඇතැම්

ප්‍රතිචාර දක්වන්නන් පැවසුයේ තම ගැටළු පිලිබඳ සාකච්ඡා කිරීමට තමන්ට ඇති හැකියාවට බලපෑම් ඇතිකරන ආකාරයේ විශ්වාසය පිලිබඳ ගැටළු ඇති බවයි. සමාජ සේවකයින්, සෞඛ්‍ය-සේවා සේවකයින් සහ මනෝ උපදේශකයින් විසින් එල් ජී බී ටී පුද්ගලයින්ට ගැටළු පිළිබඳ විවෘතව සාකච්ඡා කිරීමට කිසියම් ආකාරයක අවකාශයක් සපයන බව මෙම සාකච්ඡා තුළින් අනාවරණය විය.

අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් උපකාර ලබාගත හැකි විවිධ සංවිධාන සහ පුද්ගලයින් පිළිබඳව බොහොමයක් පුද්ගලයින් දැනුවත් ය. කෙසේ නමුත්, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට ලක්ව තිබූ බොහොමයක් දෙනා උපකාර ලබාගෙන තිබුනේ නැත. එල් ජී බී ටී ප්‍රජාව සමග කටයුතු කිරීම මූලිකව අරමුණු කොටගත් සංවිධානයක් සමග ලියාපදිංචි වී ඇත්තේ ප්‍රතිචාර දක්වන්නගෙන් 28.57% ක් පමණි.

අවමන් සහගත සැලකීමේ සහ වෙන්කොට සැලකීමේ බලපෑම් වලදී එල් ජී බී ටී පුද්ගලයින් එකිනෙකාට උදව් සැලසීමෙන් ඔවුන්ව සනසයි. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 14.29% ත් 58.82% ත් අතර පිරිසක් අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට කිසියම් ආකාරයක සහායක් සපයා ඇත. ආහාර සහ මුදල් ලබාදීම වැනි භෞතික සහාය ඊට ඇතුළත්ය. එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ කටයුතු කිරීමට නම්, පුද්ගලයින් සහ සංවිධාන එල් ජී බී ටී අයිතීන් පිළිබඳව මහජනයා දැනුවත් කළ යුතු බව බහුතරයක් එල් ජී බී ටී පුද්ගලයින් විශ්වාස කරයි. සමරිසිභාවය නිර්අපරාධීකරණය කිරීම පිළිබඳව උද්දේශනය කිරීමේ කටයුත්ත ඔවුන්ගේ මූලික අරමුණ විය යුතු බව බොහෝ පිරිසකට දැනිණ.

සමස්තයක් වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාව තුළ එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ඍජුව සහ වක්‍රව විශාල එල් ජී බී ටී පුද්ගලයින් සංඛ්‍යාවකට බලපාන බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් තුළින් එල් ජී බී ටී පුද්ගලයින්ගේ බලය අහිමිවන බවත්, ඔවුන්ගේ මූලික මානව අයිතිවාසිකම් ප්‍රතික්ෂේප වන බවත් ඉන් ඔප්පු වේ. එමෙන්ම අර්වින් ගොෆ්මන් විසින් ඉදිරිපත් කර ඇති න්‍යාය ද ඔප්පු වී ඇත.. එල් ජී බී ටී පුද්ගලයින් සැඟවී සිටීමට වැඩියෙන් නැඹුරු වේ; තම ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ අවංක සහ විවෘත වුවහොත් වැඩිදුරටත් අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට ලක්වනු ඇතැයි යන බියෙන්, එල් ජී බී ටී පුද්ගලයින් සිය ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සඟවා තබාගනිමින් ජීවත් වේ.

## 5.2. නිර්දේශ

ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී පුද්ගලයින් මුහුණපාන අවමන් සහගත සැලකීමේ සහ වෙනස්කොට සැලකීමේ තරම පිළිබඳව මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා ගැඹුරින් විස්තර කර ඇත. රාජ්‍ය සහ සිවිල් සමාජය අතින් එල් ජී බී ටී පුද්ගලයින්ගේ මානව හිමිකම් දැඩි ලෙස උල්ලංඝනය වීම් පිළිබඳව ද එහි සඳහන් කර ඇත. මෙම සොයාගැනීම්වල ආධාරයෙන් ශ්‍රී ලංකා රජය, එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් අවම කිරීම වෙනුවෙන් කටයුතු කරන එල් ජී බී ටී සංවිධාන සහ පුද්ගලයින්, එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින් සහ සිවිල් සමාජය වෙත නිර්දේශ යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම අධ්‍යයනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සම්බන්ධ නිර්දේශ ද ඉදිරිපත් කෙරෙනු ඇත.

### 5.2.1. එල් ජී බී ටී ශ්‍රී ලාංකිකයින්

ලොව පුරා වෙසෙන එල් ජී බී ටී පුද්ගලයින්, එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට මුහුණපාන අතර, එය ශ්‍රී ලාංකිකයින්ට පමණක් විශේෂ වූ දෙයක් නොවේ. ශ්‍රී ලංකාව මෙන් නොව, ඇතැම් රටවල් අවමන් සහගත සැලකීම් සහ වෙන්කොට සැලකීම් වලට ලක්වන පුද්ගලයින්ට සහන සලසයි. රජය කිසිදු ආකාරයක සහනයක් සලසන්නේ නොමැති මුත්, ශ්‍රී ලංකාවේ

බොහෝ සංවිධාන එල් ජී බී ටී පුද්ගලයින්ට සහාය සපයන අතර ඇතැම් සංවිධාන එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ මූලිකවම අවධානය යොමු කරන ඒවා වේ. එබැවින්, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලින් පීඩා විඳින එල් ජී බී ටී පුද්ගලයින්ට තවදුරටත් නිහඬව දුක් නොවිඳින ලෙස මෙම පර්යේෂණය හරහා සැලකර සිටිමු.

ඔවුන් ඔවුන්ට උදවු කළ හැකි පුද්ගලයින් සහ සංවිධාන සොයාගත යුතු අතර හුදෙක්ම ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුකොට ගෙන මුහුණපා ඇති අවමන් සහගත සැලකීම් පිළිබඳව හෙළිකළ යුතුය.

## 5.2.2. එල් ජී බී ටී පුද්ගලයින්ගේ ගැටළු පිළිබඳව කටයුතු කරන පුද්ගලයින් සහ සංවිධාන

එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් ප්‍රධානවම වශයෙන්ම සිවිල් සමාජය තුලින් ඇතිවනවා යන කරුණ සහ ප්‍රතිචාර දක්වන්නන් බහුතරයක් සඳහන් කල පරිදි, එල් ජී බී ටී අයිතීන් සහ ගැටළු පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම පිළිබඳව, එල් ජී බී ටී ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයින් සහ සංවිධාන වැඩි අවධානයක් යොමු කළ යුතුය. මින් අවමන් සහගත සැලකීම් අඩුකිරීමට හැකියාව ඇති අතර පිලිවෙලින් සිවිල් සමාජයෙන් සිදුවන වෙනස්කොට සැලකීම්ද අඩු කළ හැක.

එල් ජී බී ටී සංවිධාන සහ පුද්ගලයින්ද අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ කටයුතු කිරීමේ නව මාර්ග සොයාගත යුතුව ඇත; දැනට පවතින දැඩි වෙනස්කොට සැලකීම් වෙනුවෙන් එල් ජී බී ටී පුද්ගලයින්ට අවශ්‍ය සහන සැලසීමට එය දායකවනු ඇත. එමෙන්ම සමරිසිභාවය නිර්අපරාධීකරණය කිරීමට සහ එල් ජී බී ටී ප්‍රජාවට ඔවුන්ගේ මූලික මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ ලබාදීමට ද රජය උනන්දු කළ යුතු ය.

තවද, එල් ජී බී ටී ප්‍රජාවට ඔවුන්ගේ අයිතීන් සහ නීතිය පිළිබඳව අධ්‍යාපනය ලබාදීම, අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම අවම කිරීමේ ක්‍රියාවලියේ කොටස් විය යුතුය. එල් ජී බී ටී ප්‍රජාව දුර්වල කිරීමට හේතුවන නීතිය පිළිබඳ ඔවුන් නොදැනුවත් ය.

## 5.2.3. සිවිල් සමාජය

මිනිසුන් බියෙන් සහ වෙනස්කොට සැලකීමෙන් තොරව ජීවත්වන බව සහතික කිරීමට සමාජයට වගකීමක් ඇත, විශේෂයෙන්ම, ප්‍රධාන ලෙසම සමාජය විසින්ම මෙය සිදු කරන බැවින්. එනිසා, පුද්ගලයින්, පවුල් සාමාජිකයින්, මිතුරන්, අසල්වැසියන් සහ අනෙකුත් මිනිසුන් එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඕපාදූප කතා නොකිරීම සහ අනෙකුත් ආකාරවල වෙනස්කොට සැලකීම්වලින් වැළකී සිටීම, එවැනි ක්‍රියාකාරකම්වලින් කිහිපයකි.

## 5.2.4. ශ්‍රී ලංකා රජය

එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස, ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව සිදුවන වෙනස්කොට සැලකීම්වලින් තොරව, ජනතාවගේ මානව ගරුත්වය සහ මානව හිමිකම් නගාසිටුවන මෙන් ශ්‍රී ලංකාවට මෙයින් නිර්දේශ කරයි. මෙය සිදුකිරීම සඳහා, රජය ප්‍රථමයෙන්ම ස්ව කැමැත්ත ප්‍රකාශ කරන වැඩිහිටියන් අතර සමරිසිභාවය නිර්අපරාධීකරණය කිරීම හරහා රාජ්‍ය අනුග්‍රහය මත පවතින වෙනස්කොට සැලකීම අවසන් කළ යුතුය. තවද, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ සඳහන් යෝග්‍යකර්තා මූලධර්ම මෙන්ම ජාත්‍යන්තර ප්‍රඥප්ති, සම්මුතීන් සහ කර්මාන්තය - ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හි සඳහන් ප්‍රතිපත්ති සහ නිර්දේශ නගාසිටුවන මෙන් ද ශ්‍රී ලංකා රජයට මෙයින් නිර්දේශ කර සිටිමු.

# රූපසටහන් ලැයිස්තුව


රූපසටහන 1: ස්ත්‍රී-පුරුෂ සමාජභාවය/ ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය මත පදනම්ව පසුගිය අවුරුදු දෙක තුළ සමාජ හමුවීම් සහ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම

රූපසටහන 2: පසුගිය අවුරුදු දෙක තුළ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව ආගමික ක්‍රියාකාරකම්වලින් හෝ ආගමික ස්ථානවලින් බැහැරකරනු ලැබූ වාර ගණන

රූපසටහන 3: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව පවුලේ කටයුතුවලින් බැහැරකිරීම

රූපසටහන 4: පසුගිය මාස 24 තුල තමන් පිළිබඳ ඕපාදූප කතාවීම ගැන ප්‍රතිචාර දක්වන්නන් සතු අත්දැකීම්

රූපසටහන 5: පසුගිය වසර දෙක තුළ වාචිකව අපහාසයට, හිංසනයට සහ/ හෝ තර්ජනයට ලක්වීම සම්බන්ධයෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ ප්‍රතිචාර

රූපසටහන 6: පසුගිය වසර දෙක තුළ කායිකව අපයෝජනයට, හිංසනයට, තර්ජනයට, පහරදීමට සහ/ හෝ දූෂණයට හෝ අඩන්තේට්ටම්වලට ගොදුරුවීම පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ලබාදුන් ප්‍රතිචාර

රූපසටහන 7: පසුගිය මාස 24 තුළ චිත්තවේගාත්මක හෝ මනෝවිද්‍යාත්මක කම්පන හෝ හිංසන වල ගොදුරු බවට පත්වීම පිළිබඳව ලැබූ ප්‍රතිචාර

රූපසටහන 8: පසුගිය වසර දෙක තුළ, ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිලාභ වෙනුවෙන් තර්ජනය සහ/ හෝ පරිවාරණය කිරීම් අත්දැක ඇති වාර ගණන

රූපසටහන 9: පසුගිය මාස 24 තුළ තමා වාසය කළ වාසස්ථානය වෙනස් කිරීමට සිදුවූ හෝ එම කාලය තුළදීම නවාතැනක් කුලියට ලබාගැනීමට නොහැකිවූ ප්‍රතිචාරදක්වන්නන්

රූපසටහන 10: පසුගිය අවුරුදු දෙක තුළ රැකියා අහිමිවීම් සම්බන්ධ අත්දැකීම්

රූපසටහන 11: තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රකාශනයට/ අනන්‍යතාවයට සහ/ හෝ ලිංගික දිශානතිය සම්බන්ධ වූ හේතූන් නිසා පසුගිය අවුරුදු දෙක ඇතුළත රැකියාව හෝ රැකියා අවස්ථා ප්‍රතික්ෂේප කරනු ලැබූ ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාව

රූපසටහන 12: පසුගිය අවුරුදු දෙක තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ රැකියාවේ වගකීම්, රැකියාවේ ස්වභාවය වෙනස්කිරීම සහ වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප කිරීම සිදුව ඇති වාර ගණන

රූපසටහන 13: පසුගිය මාස 24 තුළ හුදෙක්ම ප්‍රතිචාර දක්වන්නන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය සම්බන්ධ මතග්‍රාහීත්වයන් මත පදනම්ව අධ්‍යාපන ආයතනයකින් ඉවත් කිරීම, තාවකාලිකව තහනම් කිරීම හෝ පැමිණීමෙන් වැළැක්වීම පිළිබඳ සාක්ෂි

රූපසටහන 14: පසුගිය අවුරුදු 2 තුළ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතු කොටගෙන සෞඛ්‍ය සේවාවන් ප්‍රතික්ෂේප කිරීම

රූපසටහන 15: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් කිසියම් ආකාරයක අවමන් සහගත සැලකීමකට හෝ වෙනස්කොට සැලකීමකට ලක්වී ඇති ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පිළිබඳ ව්‍යාප්තිය

රූපසටහන 16: සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් පසුගිය අවුරුදු දෙක තුළ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව කිසියම් ආකාරයක සාකච්ඡාවක යෙදී ඇත්දැයි යන්නට ලැබුණු ප්‍රතිචාර

රූපසටහන 17: පසුගිය අවුරුදු දෙක තුළ සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳ කිසියම් වූ ප්‍රගතිශීලී සාකච්ඡාවක් සිදුකර ඇත්දැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ගෙන් විමසූ විට ඊට ලැබුණු ප්‍රතිචාර

රූපසටහන 18: පසුගිය මාස 24 තුළ තම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධ කරුණු පිළිබඳ සෞඛ්‍ය සේවා සපයන්නන් සමග කිසියම් ආකාරයක ප්‍රගතිශීලී සාකච්චාවක් සිදුකර ඇත්දැයි යන්නට සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන් ලබාදුන් ප්‍රතිචාර

රූපසටහන 19: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය සේවා සපයන්නන් සමග සිදුකර ඇති සාකච්ඡාවලට ලැබූ ප්‍රතිචාර

රූපසටහන 20: මනෝ උපදේශකවරයකු හෝ සමාජ සේවකයකු සමග ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව සිදුකර ඇති ඵලදායී සාකච්ඡා

රූපසටහන 21: පසුගිය අවුරුදු දෙක තුළ මනෝ උපදේශකයකු සමග හෝ සමාජ සේවකයකු සමග ස්ව ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ප්‍රගතිශීලී සාකච්ඡාවක් පවත්වා ඇත්ද යන්නට සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් ලබාදුන් ප්‍රතිචාර

රූපසටහන 22: පසුගිය අවුරුදු දෙක තුළ මෙවැනි ආකාරයේ සාකච්ඡාවන් පවත්වා නොතිබීමට ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කළ හේතූන්

රූපසටහන 23: සාකච්ඡා කිරීම් පිළිබඳ අත්දැකීම්

රූපසටහන 24: ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය මත පදනම්වූ සෘණාත්මක හැඟීම් පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 1

රූපසටහන 25: ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය/ ප්‍රකාශනය සහ/ හෝ ලිංගික දිශානතිය හේතුවෙන් සෘණාත්මක සිතිවිලි පහළවීම පිළිබඳ අත්දැකීම - ප්‍රස්තාරය 2

රූපසටහන 26: ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ/ හෝ ලිංගික දිශානතිය නිසා සෘණාත්මක හැඟීම් ඇතිවීම පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 3

රූපසටහන 27: පසුගිය අවුරුදු දෙක තුළ ප්‍රතිචාර දක්වන්නන් විසින් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාව නිසා ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 1

රූපසටහන 28: පසුගිය අවුරුදු දෙක තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය නිසා ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 2

රූපසටහන 29: පසුගිය අවුරුදු දෙක තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය නිසා ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 3

රූපසටහන 30: පසුගිය අවුරුදු 2 තුළ ප්‍රතිචාර දක්වන්නන් විසින් තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ගෙනඇති තීරණ

රූපසටහන 31: පසුගිය අවුරුදු දෙක තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් විසින් ගෙන ඇති තීරණ - ප්‍රස්තාරය 5

රූපසටහන 32: පසුගිය අවුරුදු දෙක තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් විසින් මුහුණපා ඇති බිය පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 1

රූපසටහන 33: පසුගිය අවුරුදු දෙක තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා ඇතිවූ බිය සම්බන්ධ අත්දැකීම් - ප්‍රස්තාරය 2

රූපසටහන 34: පසුගිය අවුරුදු දෙක තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා ඇතිවූ බිය සම්බන්ධ අත්දැකීම් - ප්‍රස්තාරය 3

රූපසටහන 35: පසුගිය අවුරුදු දෙක තුළ තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය හේතුවෙන් ප්‍රතිචාර දක්වන්නන් මුහුණපා ඇති බිය පිළිබඳ අත්දැකීම් - ප්‍රස්තාරය 4

රූපසටහන 36: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්වූ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට සහාය ලබාගත හැක්කේ කොහෙන්ද යන්න පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන්ගේ දැනුම

රූපසටහන 37: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට අවශ්‍ය සහාය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 1

රූපසටහන 38: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට අවශ්‍ය සහාය ලබාගැනීම සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 2

රූපසටහන 39: ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධව අවශ්‍යවන සහාය සඳහා ප්‍රතිචාර දක්වන්නන්ට යා හැකි සංවිධාන - ප්‍රස්තාරය 3

රූපසහටන 40: පසුගිය අවුරුදු දෙක තුළ අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණදීම සඳහා සහයෝගය ලබාගැනීමට උත්සාහ කළ ප්‍රතිචාර දක්වන්නගේ ව්‍යාප්තිය

රූපසටහන 41: පසුගිය අවුරුදු දෙක තුළ අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට කිසියම් ආකාරයක සහායක් හෝ උපකාරයක් ලබාදී ඇත්දැයි යන්න පිළිබඳ ව්‍යාප්තිය

රූපසටහන 42: පසුගිය මාස 24 තුළ අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට ලබාදී ඇති සහායේ ස්වභාවය

රූපසටහන 43: ශ්‍රී ලංකාවේ එල් ජී බී ටී ප්‍රජාවට බලපාන නීති පිළිබඳව ප්‍රතිචාර දක්වන්නන්ගේ දැනුවත්භාවය

රූපසටහන 44: එල් ජී බී ටී ප්‍රජාවට බලපාන නීතීන් පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් සතු සාමාන්‍ය දැනුම

රූපසටහන 45: එල් ජී බී ටී ප්‍රජාවට අයත් පුද්ගලයින්ට අනුග්‍රහය දක්වන වැඩසටහන් සහ/ හෝ ව්‍යාපෘති සමඟ ප්‍රතිචාර දක්වන්නන්ගේ සම්බන්ධවීම

රූපසටහන 46: විවිධ අංශවල තීරණවලට බලපෑමක් කිරීමට තමන්ට කිසියම් හැකියාවක් ඇතැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් තුළ පවතින විශ්වාසය

රූපසටහන 47: එල් ජී බී ටී ප්‍රජාව කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වලට විරුද්ධව කටයුතු කරන සංවිධාන සහ පුද්ගලයින් විසින් අවධානය යොමුකළ යුතු වඩාත් වැදගත් කරුණු යැයි ප්‍රතිචාර දක්වන්නන් විශ්වාස කරන කරුණු

රූපසටහන 48: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය-සේවා සේවකයින් විසින් දැනගත් ආකාරය

රූපසටහන 49: තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසුව ප්‍රතිචාර දක්වන්නන් කෙරෙහි සෞඛ්‍ය-සේවා සේවකයින් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන 50: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් දැනගත් ආකාරය

රූපසටහන 51: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු සමාජ සේවකයින් සහ/ හෝ මනෝ උපදේශකයින් ඔවුන් කෙරහි දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන 52: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ රාජ්‍ය අංශයේ නිලධාරීන්ට හෙළිකිරීම

රූපසටහන 53: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් පසු ඔවුන්ගේ කෙරෙහි රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන්ගේ ප්‍රතිචාරය

රූපසටහන 54: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පොලිසිය දැනගත් ආකාරය

රූපසටහන 55: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු පොලිසිය විසින් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන 56: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ දෙමවුපියන් ට හෙළිදරවු කිරීම

රූපසටහන 57: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් පසු ඔවුන් කෙරෙහි දෙමවුපියන් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන 58: ප්‍රතිචාර දක්වන්නන්ගේ ඥාති සහෝදර/ සහෝදරියන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගත් ආකාරය

රූපසටහන **59:** ප්‍රතිචාර දක්වන්නගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන්ගේ ඥාති සහෝදර/ සහෝදරියන් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන **60:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ බිරිඳ/ සැමියා ට හෙළිදරවු කිරීම

රූපසටහන **61:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගනීමන් පසු ඔවුන් කෙරෙහි සැමියාගේ හෝ බිරිඳගේ ප්‍රතිචාරය

රූපසටහන **62:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සමරිසි සහකාරියට/ සහකරුවාට හෙළි කිරීම

රූපසටහන **63:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු සමරිසි සහකරුවන්ගේ ප්‍රතිචාරය

රූපසටහන **64:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ඔවුන්ගේ පවුල්වල අනෙකුත් වැඩිහිටියන් දැනගත් අයුරු

රූපසටහන **65:** ප්‍රතිචාර දක්වන්නන් ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගනීමෙන් පසු ඔවුන් කෙරෙහි පවුලේ අනෙකුත් වැඩිහිටියන්ගේ ප්‍රතිචාරය

රූපසටහන **66:** ප්‍රතිචාර දක්වන්නන්ගේ පවුලේ දරුවන් ස්වකීය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් ආකාරය

රූපසටහන **67:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු ප්‍රතිචාර දක්වන්නන් කෙරෙහි පවුලේ දරුවන්ගේ ප්‍රතිචාරය

රූපසටහන **68:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ මිතුරන්ට හෙළිකිරීම

රූපසටහන **69:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් පසු ඔවුන්ගේ මිතුරන් ප්‍රතිචාර දැක්වූ ආකාරය

රූපසටහන **70:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ සම-සේවකයින්ට හෝ සගයින්ට හෙළිකිරීම

රූපසටහන **71:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගැනීමෙන් පසු සම-සේවකයින් විසින් ඔවුන්ට සැලකූ ආකාරය

රූපසටහන **72:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ සේවායෝජකයා දැනගත් ආකාරය

රූපසටහන **73:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි සේවායෝජකයින්ගේ දැක්වූ ආකල්ප

රූපසටහන **74:** ප්‍රතිචාර දක්වන්නගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ඔවුන්ගේ සේවාදායකයින්ට හෙළිදරව් කිරීම

රූපසටහන **75:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු සේවාදායකයින්ගේ ප්‍රතිචාරය

රූපසටහන **76:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ගුරුවරුන්ට/ දේශකයින්ට හෙළිදරව් කිරීම

රූපසටහන **77:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ගුරුවරුන් හෝ දේශකයින් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන් **78:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ආගමික නායකයින් දැනගත් අකාරය

රූපසටහන **79:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි ආගමික නායකයින් දැක්වූ ආකල්ප

රූපසටහන **80:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින්ට හෙළි කිරීම

රූපසටහන **81:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි අනෙකුත් එල් ජී බී ටී පුද්ගලයින් දැක්වූ ප්‍රතිචාරය

රූපසටහන **82:** ප්‍රතිචාර දක්වන්නන්ගේ අසල්වැසියන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනගත් ආකාරය

රූපසටහන **83:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි අසල්වැසියන් දැක්වූ ආකල්ප

රූපසටහන **84**: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව මාධ්‍ය දැනගත් ආකාරය

රූපසටහන **85:** ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ දැනගැනීමෙන් පසු ඔවුන් කෙරෙහි මාධ්‍ය දැක්වූ ආකල්ප

රූපසටහන **86:** තම ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව පිටතට පැමිණීමට එල් ජී බී ටී ලෙස හඳුනා නොගන්නා පුද්ගලයින්ගෙන් කිසිදු පීඩනයක් එල්ලවීද යන්නට ලැබුණු ප්‍රතිචාරය

රූපසටහන **87:** සිය ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය පිළිබඳව පිටතට පැමිණීමට අනෙකුත් එල් ජී බී ටී ප්‍රජාව වෙතින් ප්‍රතිචාර දක්වන්නන් ට එල්ල වූ පීඩනය සම්බන්ධ අත්දැකීම්

රූපසටහන **88:** රහස්‍යභාවය තම රාජකාරියේ කොටසක්ව තිබියදී වෘත්තියවේදියකු විසින් රහස්‍යභාවය කඩකිරීම

## වගු ලැයිස්තුව


වගුව 1: සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන්ගේ වයස් ව්‍යාප්තිය

වගුව 2: ප්‍රතිචාර දක්වන්නන්ගේ අයත්වන ජනවර්ගවල ව්‍යාප්තිය

වගුව 3: ප්‍රතිචාර දක්වන්නන්ගේ ආගම පිළිබඳ ව්‍යාප්තිය

වගුව 4: ප්‍රතිචාර දක්වන්නන්ගේ අධ්‍යාපනික පසුබිම

වගුව 5: ප්‍රතිචාර දක්වන්නන්ගේ රැකියා තත්ත්වය පිළිබඳ ව්‍යාප්තිය

වගුව 6: ප්‍රතිචාර දක්වන්නන් වාසය කරන විවිධ ප්‍රදේශ පිළිබඳ ව්‍යාප්තිය

වගුව 7: පසුගිය මාස 12 තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ ආදායම

වගුව 8: ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය

වගුව 9: ප්‍රතිචාර දක්වන්නන්ගේ සබඳතා පිළිබඳ තත්ත්වය

වගුව 10: විෂමරිසි නොවන සබඳතාවල සිටින බව ප්‍රකාශ කළ පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය

වගුව 11: ප්‍රතිචාර දක්වන්නන් සිය සමරිසි සහකරුවන්/ සහකාරියන් සමග එකට ජීවත්වූ කාලපරාසය පිළිබඳ ව්‍යාප්තිය

වගුව 12: සමාජ ක්‍රියාකාරකම් සහ සමාජ හමුවීම් වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපාන හේතු පිළිබඳ හරස් - වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 13: ආගමික ස්ථානවලින් සහ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපා ඇති හේතූ පිලිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 14: පවුලේ ක්‍රියාකාරකම්වලින් බැහැරකිරීම සහ එසේ කිරීමට බලපෑ හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 15: ඕපාදූපවලට බලපෑ හේතු සහ ඊට ලක්වන වාර ගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 16 ප්‍රතිචාර දක්වන්නන් මුහුණපා ඇති වාචික අපහාසකිරීම්, හිංසන සහ/ හෝ තර්ජන සහ එසේ කිරීමට බලපෑ හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 17: කායික අපයෝජන, හිංසන, තර්ජන, පහරදීම්, දූෂණය කිරීම් සහ/ හෝ අඩම්තේට්ටම් කිරීමේ වාර ගණන සහ එසේ කිරීමට හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 18: මානසික හෝ චිත්තවේගාත්මක කම්පන හෝ අපයෝජන අත්දැකීමේ වාර ගණන සහ ඒවාට බලපෑ හේතූ පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 19: මුදල් වෙනුවෙන් තර්ජනය කිරීම සහ/ හෝ අයුතු ලෙස පරිහරණය කිරීම සිදුවන වාරගණන සහ එසේ සිදුවන වාරගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 20: වාසස්ථානය වෙනස් කිරීමට හේතුව හෝ නවාතැනක් කුලියට ලබාගැනීමට ඇති නොහැකියාව සහ එම තත්ත්වයන්ට මුහුණදී ඇති වාරගණන පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 21: ප්‍රතිචාර දක්වන්නන්ගේ රැකියා අහිමිවීමේ වාරගණන සහ ඊට බලපෑ හේතු පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 22: වෘත්තීමය උසස්වීම් ප්‍රතික්ෂේප වීම් හෝ හේතු විරහිතව රැකියාවේ වගකීම් වෙනස්වීම් වලට මුහුණදීමට සිදුවූ ප්‍රතිචාර දක්වන්නන් පිළිබඳ හරස්-වගුගත කිරීමේ විශ්ලේෂණය

වගුව 23: එල් ජී බී ටී සංවිධානයක් සමග ලියාපදිංචි වී ඇති ප්‍රතිචාර දක්වන්නන් සහ එල් ජී බී සංවිධානයක් සමග සම්බන්ධ විය යුතුයැයි විශ්වාස කරන ප්‍රතිචාර දක්වන්නන් පිළිබඳ හරස්-වගුගත විශ්ලේෂණය

# යොමුව සහ ලේඛන නාමාවලිය


1. 123 IndependenceDay.Com, *Demographics of Sri Lanka* (ශ්‍රී ලංකාවේ ජනවිකාශනය), පරීක්ෂා කළ දිනය 2012 සැප්තැම්බර් 28 වැනිදා www.123independenceday.com/sri-lanka/demography.html

2. බැබිලෝන් සමාගම. 2012, Merriam-Webster Pocket PC, බාගත කළේ 2012 ඔක්තෝබර් 21 වැනිදා www.babylon.com/systems/affiliates/landing/download.php

3. *සමරිසිභීතික ප්‍රචණ්ඩත්වයට සහ වෛරීය අපරාධවලට එරෙහි අරගලය*, ඊක්වල් ග්‍රවුන්ඩ්, කොළඹ, කේ බ්‍රවුන් විසින් 2011 දී.

4. ඊක්වල් ග්‍රවුන්ඩ් 2005 දී ප්‍රකාශයට පත්කල, *මානව හිමිකම්?*, ඊක්වල් ග්‍රවුන්ඩ්, කොළඹ

5. Stigma – *Notes on the Management of Spoiled Identity (අවමන් සහගත සැලකීම් - විනාශ කරදමා ඇති අනන්‍යතාවය කාලමනාකරණය කිරීම පිළිබඳ සටහන්)*, එන්ගල්වුඩ් ක්ලිෆ්ස්, නිව් ජර්සි, ඊ ගොෆ්මන් විසින් 1963 දී.

6. යෝග්‍යාකර්තා මූලධර්ම: ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධයෙන් අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යොදාගැනීම පිළිබඳ මූලධර්ම, නීතිවේදීන්ගේ අන්තර්ජාතික කොමිසම විසින් 2007 දී.

7. *දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධනය) 1995 පනත් අංක 22, රාජ්‍ය මුද්‍රණ ආයතනය, කොළඹ, ශ්‍රී ලංකා* ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 1995 දී.

8. *ඇල්පොර්ට් වලින් අවුරුදු 50 කින් පසු පූර්වමතවල ස්වභාවය*, සීමාසහිත බ්ලැක්වෙල් ප්‍රකාශන සමාගම, ඔක්ස්ෆර්ඩ්, එල් රුඩ්මන්, පී ග්ලික් සහ ජේ ඩොවිඩියෝ (ලේඛක) විසින් 2005 දී.

9. *වෙනස්කොට සැලකීම පිළිබඳව කැනේඩියානු මහාධිකරණයේ අර්ථනිරූපණය*, කැනේඩියානු මහාධිකරණය (ඇන්ඩෘ ට එරෙහිව බ්‍රිතාන්‍ය කොලොම්බියානු නීති සංසදය) 1989 දී. පරීක්ෂා කළ දිනය 2012 ජූලි 7 වැනිදා. http://www.ufv.ca/hrcro/discrimination_defined.htm

10. එච් අයි වී සමග ජීවත්වන පුද්ගලයින් කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් පිළිබඳ දර්ශකය, දර්ශකය පිළිබඳ, පරීක්ෂා කළ දිනය 2012 ජූනි 21 වැනිදා. www.stigmaindex.org/9/aims-of-the-index/aims-of-the-index.html

11. *බෝර්න් ෆ්‍රී ඇන්ඩ් ඊක්වල් - ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ලිංගික* දිශානතිය *සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය*, මහා කොමසාරිස් ගේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය විසින් 2012 දී. පරීක්ෂා කළ දිනය 2012 අගෝස්තු 16 වැනිදා http://www.ohchr.org/Documents/Publications/BornFreeAndEqualLowRes.pdf

12. *සිවිල් සහ දේශපාලනික අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය*, මානව හිමිකම් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් විසින් 1966 දී. පරීක්ෂා කළ දිනය 2012 ජූලි 7 වැනිදා. http://www2.ohchr.org/English/law/ccpr.htm

13. United Nations, 1948, *Universal Declaration of Human Rights, v*iewed 23 June 2012, http://www.un.org/events/humanrights/2007/hrphotos/declaration%20_eng.pdf

14. **විශ්ව මානව හිමිකම් ප්‍රඥප්තිය, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දී. පරීක්ෂා කල දිනය 2012 ජුනි 23 වැනිදා.**
http://www.un.org/events/humanrights/2007/hrphotos/declaration%20_eng.pdf

# A උපග්‍රන්ථය

**ශ්‍රී ලාංකික සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් කෙරෙහි පවතින අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ දර්ශකය**

**<u>තත්ත්ව පාලන මාර්ගසූචක</u>**

**පහත දැක්වෙන කරුණුවලින් විස්තර කෙරෙන්නේ මෙම නියමු අධ්‍යයනය සඳහා භාවිතා කරන ප්‍රශ්නාවලි අනුමත කිරීමේදී යොදාගන්නා තත්ත්ව පාලන ක්‍රියාවලිය පිළිබඳවයි. දත්තවල නිවැරදිභාවය සහ පූර්ණත්වය තහවුරු කිරීම සඳහා මෙම මාර්ගසූචකය අනුගමනය කළ යුතුය.**

- **පූර්ණ ලෙස සම්පූර්ණ කර ඇති සහ කිසිදු දත්ත නොගැලපීමක් රහිත ප්‍රශ්නාවලීන් පමණක් අනුමත කරන්න.**
- **ප්‍රශ්නාවලීන් තුළ කිසියම් දත්ත නොගැලපීමක් හමුවූ විට, පළමුව ගණනය කරන්නා සම්බන්ධ කරගන්න.**
    - **පර්යේෂණ සහායකයා හමුවී දත්ත නොගැලපීම් පිළිබඳව පැහැදිලි කර ගන්න.**
    - **පර්යේෂණ සහායකයාට පැහැදිලි කිරීමක් ලබාදීමට නොහැකි වුවහොත්, ප්‍රශ්නාවලියක් අනුමත හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රථම, පහත දැක්වෙන දක්වෙන පියවර සියල්ල අනුගමනය කරන්න.**
- **ලිංගික දිශානතිය සඳහන් කර නොමැතිනම් ප්‍රශ්නාවලිය ප්‍රතික්ෂේප කරන්න.**
- **පළමු කොටසේ 6 වැනි ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇතිනම් පමණක් ප්‍රශ්නාවලිය අනුමත කරන්න; ප්‍රශ්නාවලිය අනුමත කිරීමට නම්, මෙම කොටසේ අනෙකුත් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා තිබිය යුතුය.**
- **දත්ත නොගැලපීම් දෙකකට වඩා අඩංගු ප්‍රශ්නාවලී ප්‍රතික්ෂේප කරන්න. ඉන් ප්‍රශ්නාවලිය පිළිබඳ සමස්ත අවබෝධයට දැඩි ලෙස බලපෑම් ඇති කෙරේ.**
    - **උදාහරණයක් ලෙස; ප්‍රතිචාර දක්වන්නන් "වයස අවුරුදු 18 – 24 අතර වන අතර, අවුරුදු 15 කටත් වඩා අධික කාලයක් තිස්සේ සබඳතාවක් පවත්වාගෙන යන බව" කියාසිටී නම් හෝ, "මාගේ ලිංගික දිශානතිය සහ/ හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් කිසිදිනක මගේ රැකියාව අහිමිවී නොමැති බව පවසා පසුව සිය ලිංගික දිශානතිය මත පදනම්ව රැකියාව අහිමිවීම පිළිබඳ හේතු දැක්වීම" වැනි පිළිතුරු ලබාදීම.**
- **කිසියම් ප්‍රතිචාර දක්වන්න්න විසින් දෙවන සහ පස්වන කොටස් අතර ඇති ප්‍රශ්නයකට පිළිතුරු සපයා නොමැතිවීම නිසා ප්‍රශ්නාවලිය ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින්න.**
    - **කෙසේනමුත්, පළමුවන සහ සිව්වන කොටස් අතර අනුක්‍රමයෙන් ඇති කොටස් දෙකකට පිළිතුරු සපයා නැතිනම් පමණක්, ප්‍රශ්නාවලිය ප්‍රතික්ෂේප කරන්න**
- **උපදෙස් ලබාදී ඇති අයුරින් ප්‍රශ්නාවලියක් සම්පූර්ණ කර නොමැති නම්, එම ප්‍රශ්නාවලිය ප්‍රතික්ෂේප කරන්න.**
    - **එක් තෝරාගැනීමක් පමණක් සිදුකිරීමට උපදෙස් දී ඇති විට තෝරාගැනීම් කිහිපයක් සිදුකර තිබීමේදී.**
    - **කෙසේනමුත්, මෙම 'අත්වැරදීම' එක්වරක් පමණක් සිදුකර ඇති අවස්ථාවලී, වෙනත් දත්ත නොගැලපීමක් හමුනොවේ නම් පමණක්, ප්‍රශ්නාවලිය අනුමත කරන්න.**

**ඇගයීම් නිලධාරීන් තිදෙනා විසින්ම මෙම ක්‍රියාවලිය සිදුකළ යුතු අතර එහිදී සෑම ප්‍රශ්නාවලියක්ම වෙන වෙනම ගතයුතුය. ඇගයීම් නිලධාරීන්ට එකඟ නොවිය හැකි අවස්ථාවලදී, පූර්ණ වශයෙන්ම ඉහත දැක්වෙන මාර්ගසූචකය මත පදනම්ව ප්‍රශ්නාවලියක් අනුමත කරනවාද යන්න පිළිබඳ පර්යේෂණ මූලිකයින් විසින් පූර්ණ තීරණය ගත යුතුය.**

EQUAL GROUND

**ප්‍රකාශනයකි**

දුක: **+94-11-5679766/+94-11-2806186**
ෆැක්ස්: **+94-11-2805704**
වෙබ්: **http://www.equal-ground.org**
බ්ලොග් අඩවිය: **http://equalground.wordpress.com**

***"සියලු ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් සහිත මිනිසුන්ට සමානාත්මතාවය: මානව අයිතිවාසිකම් සැමට"***